

වාර්ෂික කාර්යසාධන වාර්තාව

வருடாந்திர செயல்திறன் அறிக்கை

Annual Performance Report

2021

පොල්, කිතුල් හා තල් වගා ප්‍රවර්ධන හා ආශ්‍රිත කාර්මික භාණ්ඩ නිෂ්පාදන හා අපනයන විවිධාංගීකරණ රාජ්‍ය අමාත්‍යාංශය

தென்னை, கித்துல், பனை செய்கை மேம்பாடு மற்றும் அதுசார்ந்த கைத்தொழில் பண்டங்கள் உற்பத்தி மற்றும் ஏற்றுமதி பல்வகைப்படுத்தல் இராஜாங்க111111 அமைச்சு

State Ministry of Coconut, Kithul and Palmyrah Cultivation Promotion and Related Industrial Product Manufacturing & Export Diversification

වැය ශීර්ෂ අංකය 431

සැකසුම් - සැලසුම් අංශය

Prepared by – Planning Division

0112 876 447

ගරු වැවිලි අමාත්‍යතුමාගේ පණිවුඩය



පොල්, කිතුල් හා තල් වගා ප්‍රවර්ධනය හා ආශ්‍රිත කාර්මික භාණ්ඩ නිෂ්පාදන හා අපනයන විවිධාංගීකරණ රාජ්‍ය අමාත්‍යාංශයේ 2021 වාර්ෂික කාර්යසාධන වාර්තාව වෙත පණිවුඩයක් නිකුත් කිරීමට ලැබීම සතුටට කරුණකි.

වැවිලි අමාත්‍යාංශය හා ඒ යටතේ ඇති මෙම රාජ්‍ය අමාත්‍යාංශය ද ඇතුළුව අනෙකුත් රාජ්‍ය අමාත්‍යාංශ "සෞභාග්‍යයේ දැක්ම" රජයේ ප්‍රතිපත්ති රාමුවට අනුකූලව ජනතා කේන්ද්‍රීය ආර්ථිකයක් බිහි කිරීම සඳහා වූ ආර්ථික ඉලක්ක සාක්ෂාත් කර ගැනීමේ අරමුණින් යුතුව ක්‍රියාත්මක වේ.

වර්ෂ 2025 වන විට 6.5%ක ආර්ථික වර්ධන වේගයක් අත්පත් කර ගනිමින් ඇ.ඩො. 6500 ඉක්මවූ ඒක පුද්ගල ආදායමක් ඉපයීමට හැකිවන පරිදි නව තාක්ෂණය මුසු වූ අපනයන කේන්ද්‍රීය වැවිලි කර්මාන්තයක් ඇති කිරීමට ඇප කැප වී කටයුතු කරන අතර, අභියෝග රැසක් හමුවේ වුවද පසුගිය වසරවලට සාපේක්ෂව 2021 වසර තුළ ක්ෂේත්‍රයේ වර්ධනයක් සහතික කර ගැනීමට හැකි වූ බව ත්, ඒ අනුව, අපනයන ආදායම් මාර්ග අතර ප්‍රධාන වශයෙන්ම කෘෂිකාර්මික වෙළඳ භාණ්ඩ අළවිය තුළින් ලද ආදායම 2020 වර්ෂයට සාපේක්ෂව 2021 වර්ෂය තුළ8.9% වර්ධනයක් පෙන්වන බව සඳහන් කරමි.

මෙරට ප්‍රධාන අපනයන භෝග අතර ඉහළින්ම තිබෙන්නේ පොල් වගාවයි. ඊට අමතරව තල් හා කිතුල් කර්මාන්ත ද ලෝක වෙළඳපොළ ජයගනිමින් පවතී. මෙම කර්මාන්ත දියුණු කිරීම සම්බන්ධයෙන් ඉදිරියේදී ක්‍රියාමාර්ග විශාල සංඛ්‍යාවක් යෝජනා වී ඇති අතර දැනටමත් ක්ෂේත්‍රයේ විශාල ප්‍රගතියක් සිදු වී තිබේ. තව ද, අගය එකතු කළ නිෂ්පාදන විශාල වශයෙන් ක්ෂේත්‍රයන් තුළ බිහි වෙන අතර ජනාධිපතිතුමන්ගේ අවධානය ද මේ සම්බන්ධයෙන් යොමු වී ඇත.

රාජ්‍ය අමාත්‍යාංශය 2021 වර්ෂයේ මෙම ප්‍රගතිය අත්පත් කරගැනීම සඳහා රාජ්‍ය අමාත්‍යාංශය වෙත පවරන ලද කාර්යයන් සාර්ථකව ඉටුකරමින් ඉමහත් පරිශ්‍රමයක් දරමින් කැපවීමෙන් යුක්තව කටයුතු කරන ලද ගරු රාජ්‍ය අමාත්‍ය අරුන්දික ප්‍රනාන්දු මැතිතුමා, රාජ්‍ය අමාත්‍යාංශයේ ලේකම් තිස්ස හේවාවිතාන මහතා ප්‍රමුඛ කාර්ය මණ්ඩලයට හා අනුබද්ධ ආයතනයන්හි සියලුම කාර්ය මණ්ඩල වෙත මාගේ ස්තුතිය පළ කර සිටිමි.

වෛද්‍ය රමේෂ් පතිරණ (පා.ම)
වැවිලි අමාත්‍ය

ගරු රාජ්‍ය අමාත්‍යතුමාගේ පණිවුඩය



පොල්, කිතුල් හා තල් වගා ප්‍රවර්ධනය හා ආශ්‍රිත කාර්මික භාණ්ඩ නිෂ්පාදන හා අපනයන විවිධාංගිකරණ රාජ්‍ය අමාත්‍යාංශයේ 2021 වාර්ෂික කාර්යසාධන වාර්තාව වෙත පණිවිඩයක් ඉදිරිපත් කිරීමට ලැබීම සතුටට කරුණකි. මෙරට පොල් කිතුල් හා තල් වගාවන් අතීතයේ සිටම පැවත එන කර්මාන්තයන්ය. ඒ අතරින් පොල් කර්මාන්තය ප්‍රධානතම හා විශාලතම කර්මාන්තය වේ. බිලියන 2.7 ක පොල් ඵලදාවක් රටේ පවතින අතර ඉන් බිලියන 1 ක ප්‍රමාණයක් පොල් කිරි, පොල් තෙල්, කොප්පරා හා පොල් වතුර ආදී අතුරු නිෂ්පාදනයන් සඳහා යොදා ගැනේ. මෙම කර්මාන්තයෙන් ලැබෙන ආදායම ඇමරිකානු ඩොලර් බිලියනය දක්වා වැඩි කිරීම අතිගරු ජනාධිපතිතුමාගේ සහ රජයේ ප්‍රධාන අරමුණ වී ඇත.

තව ද, කිතුල් ක්ෂේත්‍රයේ උන්නතිය උදෙසා කිතුල් සංවර්ධන මණ්ඩලය ස්ථාපිත කර ඇත. කිතුල් පැණි, හකුරු සහ ඒ ආශ්‍රිත නිෂ්පාදනයන් විදේශ වෙළඳපළ ජයගත් නිෂ්පාදන අතර වේ. ඒ සමඟම රට පුරා කිතුල් සංවර්ධනය ප්‍රචලිත කිරීම සඳහා වැඩසටහන් ආරම්භ කර ඇති අතර කිතුල් තෙලිදිය ශක්ති ජනක පානයක් ලෙස නවීන විද්‍යාත්මක දැනුම ඇසුරෙන් ද හඳුනාගෙන ඇත. කිතුල් ආශ්‍රිත නිෂ්පාදනයන් හා ආහාර වර්ග, ඒ සඳහා අවශ්‍ය උපකරණ හඳුන්වා දීම, බෙදා හැරීම, බැංකු ණය හා නිෂ්පාදන මිලට ගැනීම ආදිය සඳහා සහය වීමට මා අමාත්‍යධුරය දරණ රාජ්‍ය අමාත්‍යාංශය සක්‍රීය දායකත්වය සපයනු ලැබේ.

තල් කර්මාන්තය ප්‍රවර්ධනය උදෙසා අප අමාත්‍යාංශයට අනුබද්ධ ආයතනයක් ලෙස තල් සංවර්ධන මණ්ඩලය සුවිශේෂී කාර්යය භාරයක් ඉටු කරයි. අප රට තුළ තල් ගස් මිලියනය ඉක්ම වූ ප්‍රමාණයක් ඇත. උතුරු පළාත කේන්ද්‍ර කරගනිමින් ක්‍රියාත්මක වන ආයතනයක් ලෙස උතුරේ ජනතාවගේ ශුභ සිද්ධිය උදෙසා කටයුතු කරමින් ජීවනෝපාය සංවර්ධනය තුළින්දේශීය හා විදේශීය වෙළඳපල අවස්ථා උදාකර ගනිමින් නිෂ්පාදනයන් උතුරු පළාත කේන්ද්‍ර කර ගනිමින් වැවිලි අමාත්‍යාංශය හා අප අමාත්‍යාංශයේ මුලිකත්වයෙන් ශ්‍රී ලංකාවේ සෙසු පළාත් වලටද හඳුන්වා දීමට කටයුතු යොදා ඇත. තල් ආශ්‍රිත නිෂ්පාදන ප්‍රංශය, ඉතාලිය ,ඕස්ට්‍රේලියාව, කැනඩාව ,ඇමරිකාව හා එංගලන්තය ආදි රටවල විදේශීය සුපිරි වෙළඳසැල් හා අපගේ දේශීය ප්‍රදර්ශනාගාර වල එ රටවල පාරිභෝගික ජනතාවටද මිලදී ගැනීමට කටයුතු සලස්වා ඇත. 2022 වර්ෂයේ අප රාජ්‍ය අමාත්‍යාංශය අතිගරු ජනාධිපතිතුමාගේ හා අගමැතිතුමාගේ හා වැවිලි අමාත්‍යතුමාගේ මහ පෙන්වීම මත, විශාල විනිමය ප්‍රමාණයක් මෙරටට ගෙන්වා ගැනීමට කටයුතු සැලසුම් කරමින් ඇත. මෙරට පාරිභෝගික ජනතාව සඳහා සහන මිලට භාණ්ඩ ලබාදීමට හා නිෂ්පාදන හා අතුරු නිෂ්පාදන වැඩිදියුණු කර මෙරට ආර්ථිකය ශක්තිමත් කිරීමට ද ක්‍රියාත්මක වීම අප අමාත්‍යාංශයෙහි ප්‍රධාන අභිප්‍රායන් ලෙස දක්වනු කැමැත්තෙමි.

2021 වර්ෂයේ මෙම ප්‍රගතිය අත්පත් කරගැනීම සඳහා රාජ්‍ය අමාත්‍යාංශය වෙත පවරන ලද කාර්යයන් සාර්ථකව ඉටුකර ගැනීම සඳහා ඉමහත් පරිශ්‍රමයක් දරමින් කැපවීමෙන් යුක්තව කටයුතු කරන ලද රාජ්‍ය අමාත්‍යාංශයේ ලේකම් තිස්ස හේවාවිතාන මහතා ප්‍රමුඛ කාර්ය මණ්ඩලයට හා ඊට අනුබද්ධ ආයතනයන්හි සියලුම කාර්ය මණ්ඩල වෙත මාගේ ස්තුතිය පළ කර සිටිමි.

අරුන්දික ප්‍රනාන්දු (පා.ම)
පොල්, කිතුල් හා තල් වගා ප්‍රවර්ධනය හා ආශ්‍රිත කාර්මික භාණ්ඩ නිෂ්පාදන
හා අපනයන විවිධාංගිකරණ රාජ්‍ය අමාත්‍ය

වැවිලි අමාත්‍යාංශ ලේකම්තුමාගේ පණිවුඩය



පොල්, කිතුල් හා තල් වගා ප්‍රවර්ධනය හා ආශ්‍රිත කාර්මික භාණ්ඩ නිෂ්පාදන හා අපනයන විවිධාංගීකරණ රාජ්‍ය අමාත්‍යාංශය මඟින් රජයේ ප්‍රතිපත්ති රාමුවට අනුකූලව නව තාක්ෂණය එක් කළ අපනයන කේන්ද්‍රීය වැවිලි ක්ෂේත්‍රයක් ස්ථාපිත කිරීම අරමුණු කර කරගනිමින් වැවිලි අමාත්‍යතුමාගේ නායකත්වය සහ රාජ්‍ය අමාත්‍යතුමාගේ මගපෙන්වීම යටතේ ක්‍රියාත්මක වේ.

මෙම ආයතනය වෙත ඇති ප්‍රධානතම වගකීම වනුයේ, පර්යේෂණාත්මක විධික්‍රමයන්, නව තාක්ෂණික ක්‍රමවේද හා ප්‍රශස්ත භූමිය උපයෝජනය තුලින් අගය එකතු කරන ලද නිශ්පාදන විවිධාංගීකරණය මුසු කළ අපනයන වෙළඳපොළ ආකර්ශනය කරගැනීම තුලින් විෂය පථයට අනුකූලව පොල්, කිතුල් හා තල් වගා ක්ෂේත්‍රයන් සංවර්ධනය කිරීමය.

ඒ අනුව, පොල්, කිතුල් තල් වගා ප්‍රවර්ධනය සිදු කිරීම යටතේ ඇති සියළුම ආයතන වල ද සහයෝගය ඇතිව රජයේ ප්‍රතිපත්ති රාමුවට අනුකූලව ජනතා කේන්ද්‍රීය ආර්ථිකයක් ඇති කිරීම සඳහා සුවිශේෂී අවධානයක් යොමු කර ඇත. 2021 වර්ෂය තුළදී පවත්නා පොල් වගාවන්හි නිෂ්පාදන ඵලදායිතාවය ඉහළ නැංවීම සඳහා දැනට පොල් වගාව සිදු නොකරන එහෙත් පොල් වගාව සඳහා සුදුසු ප්‍රදේශයන්හි පොල් වගාව ප්‍රවර්ධනය කිරීම, අතුරු බෝග වගාවන්ට පොල් වගාකරුවන් දිරිමත් කිරීම ආදිය තුළින් පොල් ඉඩම්වල ඵලදායිතාවය ඉහළ නැංවීමට කටයුතු සිදු කර ඇත. එමෙන්ම පොල් කිතුල් සහ තල් ආශ්‍රිත නිෂ්පාදනයන් විවිධාංගීකරණය, අගය එකතු කළ නිෂ්පාදන දිරි ගැන්වීම සහ අපනයන වෙළඳපල අවස්ථා පොල් කිතුල් සහ තල් ක්ෂේත්‍රයන් සඳහා පුළුල් කිරීමට ද කටයුතු සිදු කර ඇත.

තව ද, පොල්, කිතුල් සහ තල් වගා ක්ෂේත්‍රයන්හි නිරත කර්මාන්තකරුවන්ගේ සුභ සාධනය සඳහා ඔවුන්ගේ ජීවන මට්ටම ඉහළ නැංවීම සහ සමාජ පිළිගැනීම සහතික කිරීම පිණිස සුදුසු ව්‍යාත්තීය පුහුණු අවස්ථා සහ තාක්ෂණික දැනුම ලබාදීම තුළින් දේශීය හා විදේශීය වශයෙන් වෙළඳපල අවස්ථා උදා කරදීමට ද අවකාශ සලසා ඇත. එමෙන්ම, පොල් කිතුල් හා තල් ක්ෂේත්‍රයන්ට අදාළව පර්යේෂණ සිදුකිරීම මගින් අධි ඵලදා පැළ හඳුන්වාදීම සහ තාක්ෂණික නවෝත්පාදනයන් තුළින් පොල්, තල් හා කිතුල් ක්ෂේත්‍රයන්හි කාර්මික සංවර්ධනයට දායක වීම යන කාර්යයන්ට සමගාමීව 2021-2025 සඳහා වූ පස් අවුරුදු උපාය මාර්ගික සැලැස්ම ද සකස් කර ඇත.

වැවිලි අමාත්‍ය ගරු වෛද්‍ය රමේෂ් පතිරණ මැතිතුමාගේ මහපෙන්වීම යටතේ රාජ්‍ය අමාත්‍ය ගරු අරුන්දික ප්‍රනාන්දු මැතිතුමාගේ මෙහෙයවීමෙන් 2021 වර්ෂයේ ඉලක්ක සපුරා ගැනීමට ලබාදුන් සහයෝගය වෙනුවෙන් පොල්, කිතුල් හා තල් වගා ප්‍රවර්ධනය හා ආශ්‍රිත කාර්මික භාණ්ඩ නිෂ්පාදන හා අපනයන විවිධාංගීකරණ රාජ්‍ය අමාත්‍යාංශ ලේකම්, එම රාජ්‍ය අමාත්‍යාංශයේ සහ සියළුම අනුබද්ධ ආයතනවල කාර්ය මණ්ඩලයන්ටත් මාගේ ස්තුතිය හා ප්‍රසාංශාව පුද කරමි.

රවින්ද්‍ර හේවාවිතාරණ
ලේකම්
වැවිලි අමාත්‍යාංශය

ලේකම්තුමාගේ පණිවුඩය



ගරු වැවිලි අමාත්‍යතුමාගේ සහ විෂය භාර ගරු වැවිලි රාජ්‍ය අමාත්‍යතුමාගේ මහපෙන්වීම යටතේ ක්‍රියාත්මක වන්නා වූ පොල්, කිතුල්, හා තල් වගා ප්‍රවර්ධනය හා ආශ්‍රිත කාර්මික භාණ්ඩ නිෂ්පාදන හා අපනයන විවිධාංගීකරණ රාජ්‍ය අමාත්‍යාංශය වර්තමානයේ සිය ප්‍රධානතම වගකීම ලෙස, පර්යේෂණාත්මක විධික්‍රමයන්, නව තාක්ෂණික මෙවලම් හා ප්‍රශස්ත භූමිය උපයෝජනය තුළින් අගය එකතු කරන ලද නිෂ්පාදන විවිධාංගීකරණය මඟින් අපනයන වෙළඳපොළ ආකර්ෂණය කර ගනිමින් පොල්, කිතුල්, හා තල් යන වගාවන් ඔස්සේ වැවිලි ක්ෂේත්‍රය නව මානයක් වෙත යොමු කිරීම දැක්විය හැකිය.

ඒ අනුව, අප රාජ්‍ය අමාත්‍යාංශය යටතේ ඇති අනුබද්ධ ආයතනවල ද සහයෝගය ඇතිව " සෞභාග්‍යයේ දැක්ම " රජයේ ප්‍රතිපත්ති රාමුවට අනුකූලව " ජනතා කේන්ද්‍රීය" ආර්ථිකයක් ගොඩනැගීම කෙරෙහි අවධානය යොමු කරමින් අප රාජ්‍ය අමාත්‍යාංශයේ විෂය පථයට අදාළව තිරසර සංවර්ධන අරමුණු සාක්ෂාත් කරගැනීම උදෙසා කැපවෙන අතරම පොල්, කිතුල් හා තල් වගා ප්‍රවර්ධනය හා ආශ්‍රිත කාර්මික භාණ්ඩ නිෂ්පාදන හා අපනයන විවිධාංගීකරණය තුළින් වැවිලි ක්ෂේත්‍රයට සුවිශේෂී දායකත්වයක් ලබාදීමට හැකි විය.

පොල්, කිතුල් සහ තල් භෝග වගා කිරීමෙන් විශාල පිරිසකගේ ඍජු හා වක්‍ර ආදායම් ඉහළ යාම තුළින් ඔවුන්ගේ ජීවනෝපාය සංවර්ධනයට අප රාජ්‍ය අමාත්‍යාංශය මඟින් ගෙන ඇති හා ගැනීමට අපේක්ෂිත ක්‍රියාමාර්ග රැසක් පවතී. තල් කර්මාන්තය හරහා ද රටට වැඩි වශයෙන් විදේශ විනිමය ලබා ගැනීමට හැකි වේ යැයි අපේක්ෂා කරනු ලැබේ. උතුරු නැගෙනහිර යුද්ධයෙන් පීඩාවට පත් වූ ප්‍රදේශයක් වුවත් එහි සශ්‍රීකත්වය නිසා සෙසු පළාත්වලට සාපේක්ෂව තල් වගා ක්ෂේත්‍රයේ වර්ධනයක් දැකිය හැකි අතර එමඟින් ජනතාවගේ ජීවන තත්ත්වය නංවාලීම සඳහා අප රාජ්‍ය අමාත්‍යාංශය කටයුතු කරයි. මෙම රාජ්‍ය අමාත්‍යාංශය මඟින් ග්‍රාමීය ආර්ථිකය නඟා සිටුවීමේ ජාතික වැඩසටහන යටතේ "දේශීය නිෂ්පාදන වැඩිදියුණු කිරීමේ සංවර්ධන කමිටුව" සහ "ජාතික සම්බන්ධීකරණ ජීවනෝපාය අනු කමිටුව" නියෝජනය කරන අතර 2021-2025 සඳහා වූ පස් අවුරුදු උපායමාර්ගික සැලැස්ම යටතේ ඊට අදාළව වැඩසටහන් ක්‍රියාත්මක කිරීම මේ වන විට ආරම්භ කර ඇත.

වැවිලි අමාත්‍ය ගරු රමේෂ් පතිරණ මැතිතුමා සහ පොල්, කිතුල් හා තල් වගා ප්‍රවර්ධනය හා ආශ්‍රිත කාර්මික භාණ්ඩ නිෂ්පාදන හා අපනයන විවිධාංගීකරණය රාජ්‍ය අමාත්‍ය ගරු අරුන්දික ප්‍රනාන්දු මැතිතුමා ඇතුළුව වැවිලි අමාත්‍යාංශයේ මහපෙන්වීම යටතේ 2021 ඉලක්ක සපුරා ගැනීමට ලබාදුන් සහයෝගය වෙනුවෙන් වැවිලි අමාත්‍යාංශයේ ලේකම්තුමා ඇතුළු කාර්ය මණ්ඩලයටත්, අමාත්‍යාංශයේ විෂය පථය යටතේ වන සියලුම අනුබද්ධ ආයතනවල කාර්යය මණ්ඩලයන් ද මෙම අමාත්‍යාංශය ස්ථාපිත කරන ලද දිනයේ සිට වැඩසටහන් හා කාර්යයන් ඉටුකිරීම සඳහා නොපසුබටව කටයුතු කරමින් සහයෝගය ලබාදුන් අප අමාත්‍යාංශයේ කාර්ය මණ්ඩලයටත් මාගේ ස්තුතිය හා ප්‍රශංසාව පුද කරමි.

නිස්ස හේවාවිතාන
ලේකම්
පොල්, කිතුල් හා තල් වගා ප්‍රවර්ධනය හා ආශ්‍රිත කාර්මික භාණ්ඩ නිෂ්පාදන හා අපනයන විවිධාංගීකරණ රාජ්‍ය අමාත්‍යාංශය

2021 වර්ෂය සඳහා වාර්ෂික කාර්යසාධන වාර්තාව

පොල්,කිතුල් හා තල් වගා ප්‍රවර්ධනය හා ආශ්‍රිත කාර්මික භාණ්ඩ නිෂ්පාදන හා අපනයන විවිධාංගිකරණ රාජ්‍ය අමාත්‍යාංශය

වැය ශීර්ෂ අංකය 431

<u>අන්තර්ගතය</u>

පරිච්ඡේදය 01 - ආයතනික පැතිකඩ / ක්‍රියාවට නැංවීමේ සාරාංශය

පරිච්ඡේදය 02 - ප්‍රගතිය හා ඉදිරි දැක්ම

පරිච්ඡේදය 03 - වසරේ සමස්ත මූල්‍ය කාර්ය සාධනය

පරිච්ඡේදය 04 - කාර්ය සාධන දර්ශක

පරිච්ඡේදය 05 - තිරසාර සංවර්ධන අරමුණු (SDG)

පරිච්ඡේදය 06 - මානව සම්පත් පැතිකඩ

පරිච්ඡේදය 07 - අනුකූලතා වාර්තාව

පටුන

01 ආයතනික පැතිකඩ **01**

1.1 හැඳින්වීම 01

1.2 අමාත්‍යාංශයේ දැක්ම මෙහෙවර හා අරමුණු 02

1.3 අමාත්‍යාංශයේ ප්‍රධාන කාර්යයන 04

1.4 අමාත්‍යාංශයේ සංවිධාන සටහන 05

1.5 අමාත්‍යාංශයට අදාළ ආයතනික හා නෛතික රාමුව 06

02 ප්‍රගතිය හා ඉදිරි දැක්ම **07**

2.1 පොල් ක්ෂේත්‍රය ***07***

2.1.1 ක්ෂේත්‍රය - හැඳින්වීම 07

2.1.2 ක්ෂේත්‍රය සංවර්ධනය කිරීම සඳහා වූ ඉදිරි දැක්ම 08

2.1.3 ක්ෂේත්‍රය සංවර්ධනය කිරීම සඳහා වූ අභියෝග 13

2.1.4 ක්ෂේත්‍රය - සමස්ත ප්‍රගතිය 16

2.1.4.1 ක්ෂේත්‍රය සංවර්ධනය සඳහා වූ ක්‍රියාමාර්ග 19

2.1.4.1.1 පොල් වගාකිරීමේ මණ්ඩලය 19

2.1.4.1.2 පොල් සංවර්ධන අධිකාරිය 25

2.1.4.1.3 පොල් පර්යේෂණ ආයතනය 32

2.1.5 පොල් ක්ෂේත්‍රය - විශේෂ සංවර්ධන ව්‍යාපෘතීන්හි ප්‍රගතිය 40

2.2 කිතුල් ක්ෂේත්‍රය ***44***

2.2.1. ක්ෂේත්‍රය - හැඳින්වීම 44

2.2.2 ක්ෂේත්‍රය සංවර්ධනය කිරීම සඳහා වූ ඉදිරි දැක්ම 45

2.2.3 ක්ෂේත්‍රය සංවර්ධනය කිරීම සඳහා වූ අභියෝග 47

2.2.4 ක්ෂේත්‍රය - සමස්ත ප්‍රගතිය 51

2.3 තල් ක්ෂේත්‍රය ***56***

2.3.1 ක්ෂේත්‍රය - හැඳින්වීම 56

2.3.2 ක්ෂේත්‍රය සංවර්ධනය කිරීම සඳහා වූ ඉදිරි දැක්ම 57

2.3.3 ක්ෂේත්‍රය සංවර්ධනය කිරීම සඳහා වූ අභියෝග 60

2.3.4 ක්ෂේත්‍රයේ සමස්ත ප්‍රගතිය 62

2.3.5. තල් සංවර්ධන මණ්ඩලය 63

පටුන

3. 2021 දෙසැම්බර් මස 31 දිනෙන් අවසන් වූ වසර සඳහා වන සමස්ත මූල්‍ය කාර්යසාධනය **70**

3.1 මූල්‍ය ප්‍රගතිය පිළිබඳ ප්‍රකාශය 70

3.2 මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශය 71

3.3 මුදල් ප්‍රවාහ පිළිබඳ ප්‍රකාශය 72

3.4 මූල්‍ය ප්‍රකාශ සටහන 73

3.5 ආදායම් එකතු කිරීමේ කාර්ය සාධනය 74

3.6 වෙන් කරන ලද ප්‍රතිපාදන උපයෝගී කර ගැනීමේ කාර්ය සාධනය 74

3.7 මු.රෙ. 208 ප්‍රකාරව, වෙනත් අමාත්‍යාංශ/ දෙපාර්තමේන්තුවල නියෝජිතයෙකු ලෙස මෙම දෙපාර්තමේන්තුවට / දිස්ත්‍රික් ලේකම් කාර්යාලයට/ පළාත් සභාවට ප්‍රදානය කරන ලද ප්‍රතිපාදන 74

3.8 මූල්‍ය නොවන වත්කම් වාර්තා කිරීමේ කාර්යසාධනය 75

3.9 විගණකාධිපතිවරයාගේ වාර්තාව 76

4. කාර්ය සාධන දර්ශක **81**

4.1 ආයතනයේ කාර්ය සාධන දර්ශක (ක්‍රියාකාරී සැලැස්ම මත පදනම්ව) 81

5. තිරසර සංවර්ධන අරමුණු සපුරා ගැනීමේ කාර්යසාධනය **82**

5.1 හඳුනා ගන්නා ලද තිරසර සංවර්ධන අරමුණු 82

5.2 තිරසර සංවර්ධන අරමුණු සපුරා ගැනීමේ ජයග්‍රහණ හා අභියෝග 83

5.2.1 තිරසර සංවර්ධන අරමුණු සපුරා ගැනීමේ ජයග්‍රහණ 83

5.2.2 තිරසර සංවර්ධන අරමුණු සපුරා ගැනීමේ අභියෝග 83

6. මානව සම්පත් පැතිකඩ **84**

6.1 සේවක සංඛ්‍යා කළමනාකරණය 84

6.2 ආයතනයේ කාර්යසාධනය උදෙසා මානව සම්පත් හිඟය බලපා ඇති ආකාරය 84

6.3 මානව සම්පත් සංවර්ධනය 85

7. අනුකූලතා වාර්තාව **88**

1 පොල්, කිතුල් හා තල් වගා ප්‍රවර්ධනය හා ආශ්‍රිත කාර්මික භාණ්ඩ නිෂ්පාදන හා අපනයන විවිධාංගීකරණ රාජ්‍ය අමාත්‍යාංශය
ආයතනික පැතිකඩ

1.1 හැඳින්වීම

වර්තමාන රජයේ "සෞභාග්‍යයේ දැක්ම" ප්‍රතිපත්ති රාමුව අනුව, නව තාක්ෂණය මුසු වූ අපනයන කේන්ද්‍රීය වැවිලි කර්මාන්ත ක්ෂේත්‍රයක් ඇති කිරීම සඳහා, වැවිලි කර්මාන්ත අමාත්‍යවරයාගේ මහ පෙන්වීම යටතේ ක්‍රියාත්මක 2020 සැප්තැම්බර් මස 25 දිනැති අංක 2194/74 දරණ රජයේ අතිවිශේෂ ගැසට් නිවේදනය මඟින් "පොල්, කිතුල් හා තල් වගා ප්‍රවර්ධනය හා ආශ්‍රිත කාර්මික භාණ්ඩ නිෂ්පාදන හා අපනයන විවිධාංගීකරණ රාජ්‍ය අමාත්‍යාංශය" පිහිටුවා ඇත.

පර්යේෂණාත්මක විධික්‍රමයන්, නව තාක්ෂණික මෙවලම් හා ප්‍රශස්ත භූමිය උපයෝජනය හරහා අගය එකතු කරන ලද නිෂ්පාදන විවිධාංගීකරණය තුළින් අපනයන වෙළඳපොළ ආකර්ෂණය කර ගැනීම ඉලක්ක කර ගනිමින් සමස්ත වැවිලි ක්ෂේත්‍රය නව මානයක් වෙත යොමු කිරීම අරමුණු කරගත් වැවිලි අමාත්‍යාංශයේ විෂය පථයට අනුව පොල්, කිතුල් හා තල් වගා ක්ෂේත්‍රයන් සංවර්ධනය කිරීම මෙම අමාත්‍යාංශය විසින් ඉටු කරනු ලැබේ.

ඒ අනුව, රාජ්‍ය අමාත්‍යාංශය යටතේ ඇති සියළුම ආයතනවල ද සහයෝගය ඇතිව රජයේ ප්‍රතිපත්ති රාමුවට අනුකූලව ජනතා කේන්ද්‍රීය ආර්ථිකයක් ගොඩනැගීම කෙරෙහි අවධානය යොමු කරමින් රජයේ සුවිශේෂී ප්‍රමුඛතා වන පවත්නා පොල් වගාවන්හි ඵලදායීතාව වැඩි දියුණු කිරීම සහ දැනට පොල් වගා නොකරන පළාත්වල පොල් වගාව ප්‍රවර්ධනය කිරීම සහ අතුරු භෝග වගාවට වගාකරුවන් දිරිමත් කිරීම තුළින් පොල් ඉඩම් වල ඵලදායීතාවය වැඩි කිරීම, පොල්, තල් හා කිතුල් කර්මාන්ත ප්‍රවර්ධනය සහ අගය එකතු කිරීම තුළින් නිෂ්පාදන විවිධාංගීකරණය හා නිෂ්පාදන අපනයන සඳහා යොමු කිරීම, පර්යේෂණ තුළින් අධි ඵලදා පැළ හඳුන්වාදීම සහ තාක්ෂණික නවෝත්පාදනයන් තුළින් පොල්, තල් හා කිතුල් ක්ෂේත්‍රයන්හි කාර්මික සංවර්ධනයට දායක වීම යන කාර්යයන්ට සමගාමීව මෙම රාජ්‍ය අමාත්‍යාංශය විසින් **2021-2025 සඳහා වූ පස් අවුරුදු උපායමාර්ගික** සැලැස්ම සකස් කර ඇත.

මෙම රාජ්‍ය අමාත්‍යාංශය විසින් 2021.01.01 දින සිට 2021.12.31 දින දක්වා වූ කාලසීමාවට අදාළව සකස් කරන ලද ක්‍රියාකාරී සැලැස්මට අනුව 2021 වර්ෂයේ දෙසැම්බර් 31 දක්වා සිදු කරන ලද ක්‍රියාකාරකම්හි භෞතික හා මූල්‍ය ප්‍රගතිය මෙම වාර්තාවේ අන්තර්ගත වේ.

1.2 අමාත්‍යාංශයේ දැක්ම මෙහෙවර හා අරමුණු

දැක්ම

"නව තාක්ෂණයෙන් සන්නද්ධ වූ ගෝලීය වශයෙන් තරඟකාරී පොල්, කිතුල් හා තල් ආශ්‍රිත තිරසාර කර්මාන්තයක් ශ්‍රී ලංකාව තුළ සහතික කිරීම."

මෙහෙවර

"දේශීය හා අපනයන වෙළඳපොළ විවිධ අවශ්‍යතාවයන්ට ගැළපෙන පරිදි නිෂ්පාදන ඵලදායිතාව, ගුණාත්මකභාවය, කාර්යක්ෂමතාව සහ ඉහළ තරඟකාරිත්වය වැඩි දියුණු කිරීම සඳහා නවීන විද්‍යාව හා තාක්ෂණය යොදා ගැනීම; ඉඩම් පරිහරණය, ජල සම්පත්, ප්‍රාග්ධනය සහ ශ්‍රමයේ කාර්යක්ෂමතාව වැඩි දියුණු කිරීම; සාම්ප්‍රදායික පුහුණු කෘෂිකාර්මික ශ්‍රමය ආකර්ශනීය වෘත්තියක් බවට පත් කිරීම; ගොවීන්ගේ හා කර්මාන්තකරුවන්ගේ ආදායම සහ ජීවනෝපාය වැඩි දියුණු කිරීම; සහතික කරමින් ඉතා සංවර්ධිත පොල්, කිතුල් සහ තල් ක්ෂේත්‍රයක් ගොඩනැගීම."

අමාත්‍යාංශයේ අරමුණු

මෙම අමාත්‍යාංශය මඟින් "සෞභාග්‍යයේ දැක්ම" ප්‍රතිපත්ති රාමුවට අනුව සකස් කරන ලද 2021-2025 උපායමාර්ගික රාමුව යටතේ,

- 2021 වසර වන විට පොල්, තල් හා කිතුල් ක්ෂේත්‍ර 03 හි නිෂ්පාදන මඟින් ඇමරිකානු ඩොලර් බිලියන 01 ක අපනයන ආදායමක් උපයා ගැනීම.
- 2025 වන විට පොල් නිෂ්පාදන මට්ටම මිලියන 3900 දක්වා ඉහළ නැංවීම.
- 2025 වන විට හොඳින් ස්ථාපිත වූ විධිමත් වගාවක් බවට කිතුල් වගාව පත් කිරීම.
- 2025 වන විට නව තාක්ෂණය යොදා ගනිමින් අගය එකතු කරන ලද නව නිෂ්පාදන තුළින් දේශීය සම්පත් පදනම් කර ගත් අපනයනයක් ලෙස කිතුල් ප්‍රවර්ධනය කිරීමෙන් අපනයන ඉපැයීම 10% කින් ඉහළ නැංවීම.
- 2021 වසර වන විට තල් අපනයන ආදායම මිලියන 200 දක්වා වර්ධනය කර ගැනීම.

1.2 අමාත්‍යාංශයේ දැක්ම මෙහෙවර හා අරමුණු

අගයන්

- මානව හිතවාදී බව
- ධනාත්මක චින්තනය
- ප්‍රශස්ත කාල කළමනාකරණය
- ගුණාත්මක හා කාර්යක්ෂම සේවා සැපයීම
- අවස්ථානුකූල නායකත්ව ගුණාංග
- සමානාත්මතාවය
- කණ්ඩායම් හැගීම
- ප්‍රතිපෝෂණය

ඉලක්ක

- පොල්, තල් හා කිතුල් ක්ෂේත්‍ර හා ආශ්‍රිත නිෂ්පාදන විවිධාංගීකරණය තුළින් ප්‍රශස්ත අපනයන ආදායමක් ලබා කර ගැනීම.
- පාරිභෝගිකයින්ට හා පොල්, තල් හා කිතුල් වගාකරුවන්ට හිතවාදී ප්‍රශස්ත මිලක් ලබා ගැනීම.
- අප රාජ්‍ය අමාත්‍යාංශ හා අනුබද්ධිත ආයතනයන් හි මානව සම්පත් ආකල්ප සංවර්ධනය තුළින් තෘප්තිමත් රාජ්‍ය සේවයක් සේවාලාභීන්ට ලබා දීම.

1.3 අමාත්‍යාංශයේ ප්‍රධාන කාර්යයන්

2020 සැප්තැම්බර් මස 25 දිනැති අංක 2194/74 දරණ රජයේ අතිවිශේෂ ගැසට් නිවේදනය අනුව අමාත්‍යාංශයේ ප්‍රධාන කාර්යයන්

වැවිලි අමාත්‍යවරයාගේ සහ රාජ්‍ය අමාත්‍යවරයාගේ උපදෙස් හා මග පෙන්වීම මත නව තාක්ෂණය මුසු වූ අපනයන කේන්ද්‍රීය වැවිලි කර්මාන්තයක් "ඇති කිරීම සඳහා අදාළ නීති සහ අණ පනත්වලට අනුකූලව පොල්, කිතුල් හා තල් වගා ප්‍රවර්ධනය හා ආශ්‍රිත කාර්මික භාණ්ඩ නිෂ්පාදන හා අපනයන විවිධාංගීකරණ විෂයයට අදාල

- ප්‍රතිපත්ති සම්පාදනයට සහාය වීම,
- ජාතික අයවැය, රාජ්‍ය ආයෝජන හා ජාතික සංවර්ධන වැඩපිළිවෙල යටතේ ඇති ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීම සහ
- අමාත්‍යාංශය යටතේ ඇති ව්‍යවස්ථාපිත ආයතනයන්හි විෂයයන් කාර්යයන් හා ඊට අදාළ ප්‍රතිපත්ති, වැඩසටහන් සහ ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීම, පසු විපරම් කිරීම හා ඇගයීම
- අමාත්‍යාංශය වෙත පැවරී ඇති පහත සඳහන් සුවිශේෂී ප්‍රමුඛතා ක්‍රියාවට නැංවීම
    - පොල් පර්යේෂණ ආයතනය හා පෞද්ගලික පර්යේෂණාගාර ඒකාබද්ධව අධිඵලදා පොල් පැළ හඳුන්වා දීම සහ දැනට පොල් වගා නොකරන පළාත්වලට ගැළපෙන පොල් පැළ ප්‍රභේද හඳුන්වා දීම
    - ගෙවතු පොල් වගා ව්‍යාප්ත කිරීම සඳහා අධිඵලදා පොල් වර්ග එක් එක් ප්‍රදේශවල භූගෝලීය තත්ත්වයන් සැලකිල්ලට ගනිමින් බෙදා හැරීමේ වැඩසටහනක් ක්‍රියාත්මක කිරීම
    - විවිධ පළිබෝධකයන් පාලනය කිරීම සඳහා ජෛව තාක්ෂණික විසඳුම් සංවර්ධනය කිරීම
    - රෝපණ ද්‍රව්‍ය නිෂ්පාදනය කිරීම සඳහා තවාන් සංවර්ධනය කිරීමට කුඩා හා මධ්‍යම පොල් වගාකරුවන් දිරිමත් කිරීම
    - පොල්වතුවල ගම්මිරිස්, ඉඟුරු, කහ, කෝමාරිකා, අන්නාසි වැනි අතුරු බෝග වගාව මෙන්ම සත්ව ගොවිපොළ සඳහා අවශ්‍ය දිරිගැන්වීම් ලබාදීම
    - දේශීය පොල් ඉල්ලුම සපුරාලීමට පොල්, තැඹිලි, කුරුම්බා ආශ්‍රිත අගය එකතු කළ නිෂ්පාදන අපනයනය සඳහා ක්‍රමෝපායන් සැකසීම
    - පොල් ආශ්‍රිත කර්මාන්ත ප්‍රවර්ධනය සඳහා පහසුකම් සැපයීම
    - අගය එකතු කිරීම සහ තාක්ෂණික නවෝත්පාදනයන් පිළිබඳ පර්යේෂණ සිදු කිරීමට පර්යේෂකයන්, විද්‍යාඥයින් සහ නිෂ්පාදකයින් දිරිමත් කිරීම

1.4 අමාත්‍යාංශයේ සංවිධාන සටහන



1.5 අමාත්‍යාංශයට අදාළ ආයතනික හා නෛතික රාමුව

දෙපාර්තමේන්තු, ව්‍යවස්ථාපිත ආයතන හා රාජ්‍ය සංස්ථා

1. පොල් වගාකිරීමේ මණ්ඩලය
2. පොල් සංවර්ධන අධිකාරිය
3. පොල් පර්යේෂණ ආයතනය
4. කිතුල් සංවර්ධන මණ්ඩලය
5. තල් සංවර්ධන මණ්ඩලය
6. සීමාසහිත කුරුණෑගල වැවිලි සමාගම
7. සීමාසහිත හලාවත වැවිලි සමාගම

ක්‍රියාත්මක කළ යුතු නීති සහ අණ පනත්

- පොල් සංවර්ධන පනත (1971 අංක 46)
- කප්රුක අරමුදල පනත (2005 අංක 31)
- පොල් පර්යේෂණ ආඥාපනත (1928 අංක 29)

2 ප්‍රගතිය හා ඉදිරි දැක්ම

2.1 පොල් ක්ෂේත්‍රය

2.1.1 ක්ෂේත්‍රය - හැඳින්වීම

රට හඳන සෞභාග්‍යයේ දැක්ම - ජනතා කේන්ද්‍රීය ආර්ථිකය යටතේ
පොල් ක්ෂේත්‍රය සංවර්ධනය

ප්‍රධාන අපනයන බෝග අතුරින් පොල් සුවිශේෂී වන අතර, නව තාක්ෂණය හා මුසු වටිනාකම් එකතු කරන ලද නිෂ්පාදන දිරිගැන්වීම තුළින් වර්තමාන ගෝලීය වෙළෙඳපොළට ගැළපෙන ආකාරයට පොල් සඳහා වූ වෙළෙඳපොළ ස්ථාවරත්වය සහතික කර ගැනීම සඳහා නව සැලැස්මක් ක්‍රියාත්මක කිරීමට කටයුතු කෙරේ. මේ සඳහා ඉදිරි වසර පහ තුල;

- පොල් වගාව ආශ්‍රිතව දිර්ඝ කාලයක් තිස්සේ පවතින මයිටා සහ පොල් කුරුමිණි වසංගතය විසඳීම සඳහා ජෛව තාක්ෂණික විසඳුමක් සොයා ගැනීම සඳහා රාජ්‍යතාන්ත්‍රික ආධාර ලබා ගැනීමට කටයුතු කෙරේ.
- පොල් කැඩීමේ යන්ත්‍ර නිෂ්පාදනය කිරීම සහ භාවිතය වර්ධනය කිරීමට ආධාර දෙනු ලැබේ.
- වාර්ෂික පොල් වගා අවශ්‍යතාවට ගැලපෙන අධි ඵලදා දෙමුහු පොල් පැළ වර්ග හඳුන්වාදීම පොල් පර්යේෂණ ආයතනයට මෙන්ම ඒ සඳහා යොමුවීමට කැමති පෞද්ගලික පර්යේෂණාගාර හිමියන් සඳහාත් අවශ්‍ය පහසුකම් රජය මඟින් සපයනු ලැබේ.
- දැනට පොල් වගාව ව්‍යාප්ත වී නොමැති උතුර, නැගෙනහිර සහ දකුණු පළාත්වලට ගැළපෙන පොල් පැළ හඳුන්වාදීම සඳහා අවශ්‍ය පර්යේෂණ දිරිගන්වනු ලැබේ.
- පොල් පැළ තවාන් ඇති කිරීම සඳහා කුඩා සහ මධ්‍ය පරිමාණ පොල් වගා ව්‍යවසායකයින්ට අවස්ථාව සලසා දෙනු ලැබේ.
- පොල් වතු හිමියන්ගේ ආදායම වැඩි කිරීම සඳහා පොල්වතුවල ගම්මිරිස්, ඉඟුරු, කහ සහ කෝමාරිකා වැනි අතුරු බෝග වගාව සඳහා අවශ්‍ය දිරිගැන්වීම් ලබා දෙනු ලැබේ.
- ගෙවතු පොල්වගාව ව්‍යාප්ත කිරීම සඳහා අධිඵලදා දෙමුහුම් පොල් පැළ ලබා දීමට පුළුල් වැඩසටහනක් ක්‍රියාත්මක කෙරේ.

මූලාශ්‍රය : රට හඳන සෞභාග්‍යයේ දැක්ම, ***පිටුව 34***

ශ්‍රී ලංකාව පොල් නිෂ්පාදනයේ ප්‍රමුඛ රටක් වන අතර ලෝක පොල් වෙළඳපොළ සැපයුමෙන් ප්‍රධාන වශයෙන් සැලකිය යුතු කොටසක් හිමිකරගෙන තිබෙනුයේ දිසිදි පොල් (Desiccated Coconut/DC) සැපයීමෙනි. ශ්‍රී ලංකා පොල් කර්මාන්තය ප්‍රධාන වශයෙන් 1971 අංක 46 දරණ පොල් සංවර්ධන පනත මගින් පාලනය වන අතර, පොල්, කිතුල් හා තල් වගා ප්‍රවර්ධන හා ආශ්‍රිත කාර්මික භාණ්ඩ නිෂ්පාදන හා අපනයන විවිධාංගීකරණ රාජ්‍ය අමාත්‍යාංශයෙහි අධීක්ෂණය යටතේ පොල් පර්යේෂණ ආයතනය (CRI) , පොල් වගාකිරීමේ මණ්ඩලය (CCB) සහ පොල් සංවර්ධන අධිකාරිය (CDA) විසින් මෙම ක්ෂේත්‍රයට අදාළ කටයුතු මෙහෙයවනු ලැබේ.

මීට අමතරව, පොල් කර්මාන්තය 1981 ශාක ආරක්ෂණ ආඥා පනත, 1999 අංක 35 දරණ ශාක ආරක්ෂණ පනත සහ 2005 අංක 20 දරණ පොල් ඉඩම් කැබලි කිරීමේ පාලන පනත මගින් ආරක්ෂා කර ඇත.

ශ්‍රී ලංකාවේ පොල් වගාවෙන් 75% ක් පමණ අක්කර 20 ට වඩා අඩු වන අතර, ඉතිරි වගාවන් රජයට අයත් වතු හා පෞද්ගලික අංශයට අයත් වතු වේ. ජාතික පොල් නිෂ්පාදනයෙන් 70% ක් පමණ කුඩා පරිමාණ නිෂ්පාදකයින්ගෙන් ලැබේ. ශ්‍රී ලංකාවේ පොල් වගාව හෙක්ටයාර 443,638 ක භූමි ප්‍රමාණයක පැතිරී පවතින අතර වාර්ෂික සාමාන්‍ය පොල් අස්වැන්න ගෙඩි මිලියන 2,800 ක් පමණ වේ. මෙම පොල් අස්වැන්නෙන් 70%-80% ක් අතර ප්‍රමාණයක් දේශීය පරිභෝජනය සඳහා භාවිතා වේ. ශ්‍රී ලංකාවේ ඒක පුද්ගල පොල් පරිභෝජනය වසරකට ගෙඩි 84 ක් හා තෙල් වශයෙන් ගෙඩි 30 ක් ලෙස සමස්ත ඒක පුද්ගල පරිභෝජනය පොල් ගෙඩි 114 ක් ලෙස ගණනය කර ඇත. මෙමගින් දෛනික ආහාරයෙන් 15% ක කැලරි ප්‍රමාණයක්, 70% ක මේද ප්‍රමාණයක් හා 5% ක ප්‍රෝටීන් ප්‍රමාණයක් ලබා දීම සිදු වේ.

2.1.2 ක්ෂේත්‍රය සංවර්ධනය කිරීම සඳහා වූ ඉදිරි දැක්ම

පොල් ක්ෂේත්‍රය උපායමාර්ගික රාමුව 2021-2025

ඉලක්ක

- ***2025** වන විට පොල් ගෙඩි නිෂ්පාදන මට්ටම මිලියන **3,600** දක්වා ඉහළ නැංවීම*
- ***2025** වන විට පොල් හා පොල් ආශ්‍රිත නිෂ්පාදන මඟින් ඇමරිකානු ඩොලර් බිලියන **1.1** ක අපනයන ආදායමක් උපයා ගැනීම*

උපායමාර්ගික රාමුව

- *පවත්නා පොල් වගාවන්හි ඵලදායිතාව වැඩි දියුණු කිරීම*
- *පොල් ඉඩම් පරිහරණයේ ඵලදායිතාව වැඩි කිරීම*
- *නිෂ්පාදනය සඳහා අමුද්‍රව්‍ය ප්‍රශස්ත ලෙස භාවිතා කිරීම සහතික කිරීම*
- *පොල් නිෂ්පාදනවල තාක්ෂණික නවෝත්පාදනයන් සහ අගය එකතු කිරීම වැඩි දියුණු කිරීම*
- *පොල් වෙළඳපොළ සහ පොල් ආශ්‍රිත ව්‍යාපාර ප්‍රවර්ධනය කිරීම*
- *පර්යේෂණ මඟින් පොල් වගාව / කාර්මික සංවර්ධනය සඳහා නව තාක්ෂණය හඳුන්වා දීම*

පොල් ක්ෂේත්‍රය සංවර්ධනය කිරීම සඳහා වූ උපායමාර්ගික රාමුව යටතේ පවත්නා පොල් වගාවේ ඵලදායිතාවය ඉහළ නැංවීම සඳහා ප්‍රමුඛ ස්ථානයක් ලබා දී ඇත. ඒ යටතේ පොහොර යෙදීම ප්‍රවර්ධනය, පොල් ඉඩම්වල තෙතමන සංරක්ෂණය, පසෙහි සාරවත් බව වැඩි කිරීම සඳහා නිර්දේශ ලබා දීම, පොල් වගාවට බලපාන රෝග හා පළිබෝධ පාලනය සඳහා වැඩසටහන් ක්‍රියාත්මක කිරීම සැලසුම් කර ඇත. එසේම වැඩසටහන් ක්‍රියාත්මක කිරීමේ පහසුව සඳහා පොල් ඉඩම් ශ්‍රේණිගත කිරීම හා පොල් වගාකිරීමේ මණ්ඩලය යටතේ ලියාපදිංචි කිරීමට ද යෝජිතය. පොල් නිෂ්පාදනය වැඩි කිරීම සඳහා වූ සංවර්ධන ඉලක්කය සපුරා ගැනීම සඳහා දැනට පවත්නා පොල් ඉඩම්වල ඵලදායිතාවය ඉහළ නැංවීමට අවශ්‍ය වැඩසටහන් ක්‍රියාත්මක කිරීම සඳහා 2021 වර්ෂය සඳහා ප්‍රතිපාදන වෙන් විය.

එමෙන්ම, පොල් ඉඩම් ව්‍යාප්තිය හා ඉඩම් පරිහරණයේ ඵලදායිතාවය වැඩි කිරීම සඳහා දිවයින පුරා පොල් වගාව ව්‍යාප්ත කිරීම, වගා නොකළ ඉඩම් පොල් වගාව සඳහා යොදා ගැනීම, උසස් තත්ත්වයේ රෝපණ ද්‍රව්‍ය සැකසීම හා අතුරු බෝග වගා කිරීම යන වැඩසටහන් හඳුනා ගෙන ඇත. ඒ සඳහා දිවයිනේ පවතින හඳුනාගත් පුරන් වූ කුඹුරු ඉඩම් ඵලදායී වාණිජ ඒකක බවට පත් කිරීමට පොල් වගාව සිදු කිරීමට යෝජිතය. එසේම උසස් තත්ත්වයේ රෝපණ ද්‍රව්‍ය සැකසීම සඳහා බීජ පොල් නිෂ්පාදන 20% කින් වැඩි කිරීම සඳහා වූ වැඩසටහන් සඳහා ඉදිරි වර්ෂයේදී ප්‍රතිපාදන අපේක්ෂා කෙරේ. පොල් ඉඩම් තුළ වාණිජ කෘෂි කර්මාන්තය ප්‍රවර්ධනය සඳහා ආයෝජනයන් දිරිගැන්වීම තුළින් පොල් ඉඩම් ආශ්‍රිත තිරසාර සංවර්ධනයක් ඇති කිරීමට යෝජිතය. මේ යටතේ පොල් නව වගාව, නැවත වගාව, අතුරු බෝග වගාව ආදිය සඳහා සහන පදනම මත මූල්‍ය පහසුකම් ලබා දෙනු ඇත. මේ තුළින් පොල් ඉඩම් සංවර්ධනය සඳහා ආයෝජනයන් දිරිගන්වා, ඒ තුළින් පොල් ඉඩම්වල භූමි පරිභෝජනය ඉහළ නංවා උපරිම ඵලදායිතාවයක් ලබා ගැනීමට බලාපොරොත්තු වේ.

ගෘහස්ථ පොල් මද නාස්තිය අවම කිරීම සහ ඉවතලන පොල් ලෙලි සහ පොල් කටු අගය එකතු කරන ලද නිෂ්පාදනයන් සඳහා යොමු කිරීම මඟින් අමුද්‍රව්‍ය ප්‍රශස්ථ ලෙස භාවිතා කිරීම සහතික කරනු ලැබේ. කර්මාන්ත හා අපනයනය සඳහා යොදා ගනුයේ ඉතිරි 20%ත් 30% ත් අතර පොල් ගෙඩි ප්‍රමාණයකි.

පොල් ආශ්‍රිත නිෂ්පාදනවල තාක්ෂණික නවෝත්පාදනයන් කිරීම සහ අගය එකතු කරන ලද නිෂ්පාදන වැඩි කිරීම සඳහා පර්යේෂණ සිදු කිරීම, පොල් තෙල්, පොල් මද, පොල් කෙඳි ආශ්‍රිත නිෂ්පාදන කර්මාන්ත සංවර්ධනය සඳහා පර්යේෂණයන් මඟින් ලබාගත් දැනුම ආයෝජකයින් වෙත සම්ප්‍රේෂණය කිරීම, එම නවෝත්පාදන දිරිගැන්වීම, නිෂ්පාදන කර්මාන්ත ආශ්‍රිත ප්‍රමිතිය පවත්වා ගැනීම සඳහා ජාත්‍යන්තර ප්‍රමිතීන් හඳුන්වා දීම, රසායනාගාර පහසුකම් පුළුල් කිරීම, රසායනාගාර සේවා සැපයීම ආදී වැඩසටහන් සිදු කෙරේ.

පොල් වෙළඳපොළ හා පොල් ආශ්‍රිත ව්‍යාපාර ප්‍රවර්ධනය කිරීම සඳහා දේශීය වශයෙන් මෙන්ම ජාත්‍යන්තර වශයෙන් ප්‍රවර්ධන වැඩසටහන් පැවැත්වීමට යෝජිතය. එමෙන්ම දේශීය විදේශීය මාධ්‍ය ප්‍රචාරණය, ප්‍රචාරණ මෙවලම් (ප්‍රවර්ධන පත්‍රිකා, වීඩියෝ පට) සකස් කරනු ඇත. මේ යටතේ ආදර්ශ කෘෂි උද්‍යාන ඇති කිරීම සහ දිස්ත්‍රික් මට්ටමින් අලෙවි සැල් ඉදිකිරීමට අපේක්ෂා කෙරේ.

නව ප්‍රභේද හඳුන්වා දීම සඳහා පර්යේෂණ සිදු කිරීම, ශෂ්‍ය විද්‍යාත්මක දේශගුණික විපර්යාසයන්ට ඔරොත්තු දීම, පාංශු පෝෂණය හා රෝග හා පළිබෝධ සම්බන්ධ පර්යේෂණ සිදු කිරීම හා නිර්දේශ ලබාදීම මෙන්ම පොල් කර්මාන්තයේ අගය එකතු කරන ලද නිෂ්පාදන හඳුන්වා දීම සඳහා පර්යේෂණ කිරීම, නිර්දේශ හා අවශ්‍ය තාක්ෂණය ලබා දීම මඟින් ග්‍රාමීය ජනතාවට සෙත සැලසෙන පරිදි පොල් ක්ෂේත්‍රය සංවර්ධනය කිරීමට අපේක්ෂා කෙරේ.

ක්ෂේත්‍රය 2021- ඉලක්ක

පොල් ක්ෂේත්‍රයේ සංවර්ධනය උදෙසා 2021 වර්ෂයේ දී පහත සඳහන් ව්‍යාපෘති සිදු කිරීම සඳහා රු.මි. 1000ක් අමාත්‍යාංශය වෙත වෙන්ව ඇති අතර ආයතනයන් වෙත රු.මි. 1,130 ක් වෙන්ව ඇත.

	ක්‍රියාත්මක කරනු ලබන ව්‍යාපෘතිය	2021 ප්‍රතිපාදන (රු.මි.)	ව්‍යාපෘතියේ අරමුණු	අපේක්ෂිත ප්‍රතිඵල/ ඉලක්ක	ක්‍රියාත්මක කරන ආයතනය
අයවැය යෝජනා මඟින් වෙන් වූ ප්‍රතිපාදන					
1	ශ්‍රී ලංකාවේ දැනට පවතින පොල් ඉඩම්වල ඵලදායිතාවය ඉහළ නැංවීම මඟින් 2021 වර්ෂයේදී පොල් අස්වැන්න ගෙඩි මිලියන 2,800 සිට 10%කින් වර්ධනය කිරීම.	152.00	පොල් ඉඩම් හා පොල් නිෂ්පාදන ඵලදායිතාව ඉහළ නැංවීම	• පවත්නා පොල් වගා බිම්වල පොල් අස්වැන්නේ ඵලදායිතාව ඉහළ නැංවීම සඳහා පොල් ඉඩම් පුනරුත්ථාපනය කිරීම ප්‍රවර්ධනය කිරීමට ප්‍රතිලාභීන් දෙදහසකට සහනාධාර ලබා දීම . • පොල් ඉඩම් අක්කර 6,000 ක පොහොර යෙදීම ප්‍රවර්ධනය කිරීම සඳහා ක්ෂේත්‍ර මට්ටමේ වැඩසටහන් 200 ක් පැවැත්වීම • බීජ සඳහා වන ඉල්ලුම වැඩි කිරීම සහ ගෙවතුවල පොල් වගා කිරීම පුළුල් කිරීම සඳහා එක් එක් කලාපයේ භූගෝලීය ලක්ෂණ සැලකිල්ලට ගනිමින් ඉහළ අස්වැන්නක් සහිත පොල් වර්ග බෙදා හැරීම • පාර්ශවකරුවන්ට ඉහළ නිරවද්‍යතාවයකින් යුතුව කඩිනම් පර්යේෂණ නිමැවුම් සහ සේවාවන් සැපයීම සඳහා සාමාන්‍ය රසායනාගාර විශ්ලේෂණය වේගවත් කිරීම	පොල් වගාකිරීමේ මණ්ඩලය සහ පොල් පර්යේෂණ ආයතනය

	ක්‍රියාත්මක කරනු ලබන ව්‍යාපෘතිය	2021 ප්‍රතිපාදන (රු.මී.)	ව්‍යාපෘතියේ අරමුණු	අපේක්ෂිත ප්‍රතිඵල/ ඉලක්ක	ක්‍රියාත්මක කරන ආයතනය
අයවැය යෝජනා මඟින් වෙන් වූ ප්‍රතිපාදන					
2	දිවයිනේ පවතින පුරන් කුඹුරු ඵලදායි වාණිජ ඒකක බවට පත් කිරීමට පොල් වගාව සිදුකිරීම	248.00	පුරන් කුඹුරු වාණිජ පොල් වගා ඒකක බවට පරිවර්තනය කිරීම මඟින් නව පොල් වගා බිම් ප්‍රමාණය ඉහළ නැංවීම	• සහනාධාර ලබා දීම (සාමාන්‍ය ඉඩම් ප්‍රමාණය අක්කර 2 / ප්‍රතිලාභීන් 15,000 ක්) • ණය ලබා දීම (සාමාන්‍ය ණය මුදල රුපියල් මිලියන 0.25 ක්, ප්‍රතිලාභීන් 800 ක්) • ප්‍රතිලාභීන් 16,000 ක් සඳහා පුහුණු වැඩසටහන් 100 ක් පැවැත්වීම • ක්ෂේත්‍ර නිරූපණ ස්ථාපිත කිරීම (නිරූපණ 90 x 0.2 mn) ප්‍රතිලාභීන් 360 ක්)	පොල් වගාකිරීමේ මණ්ඩලය
3	පොල් වගාව සඳහා බිංදු ජල සම්පාදනය	300.00	ජල සම්පාදන පහසුකම් සැපයීමෙන් පොල් වගාවට නියඟ මඟින් වන බලපෑම අවම කිරීම	• ක්ෂුද්‍ර වාරිමාර්ග පද්ධති හෝ නළ යොදා ගනිමින් සිදුකරන වාරිමාර්ග පද්ධති 597 ක් ස්ථාපිත කිරීම • ජල ගබඩා ඒකක 355 ක් ඉදිකිරීම/ ජල ප්‍රභවයන් සංවර්ධනය කිරීම • නිලධාරීන් සහ ප්‍රතිලාභීන් සඳහා පුහුණු වැඩසටහන් 30 ක් පැවැත්වීම • ව්‍යාප්ති හා ප්‍රචාරණ වැඩසටහන් 28 ක් පැවැත්වීම • ක්ෂේත්‍ර 15 නිදර්ශක පිහිටුවීම • ක්ෂේත්‍ර මෙහෙයුම් ධාරිතා සංවර්ධනය	පොල් වගාකිරීමේ මණ්ඩලය
එකතුව		700.00			

අංකය	ක්‍රියාත්මක කරනු ලබන ව්‍යාපෘතිය	2021 ප්‍රතිපාදන (රු.මි.)	ව්‍යාපෘතියේ අරමුණු	අපේක්ෂිත ප්‍රතිඵල/ ඉලක්ක	ක්‍රියාත්මක කරන ආයතනය
විශේෂ සංවර්ධන ව්‍යාපෘති					
1	වැලිගම පොල් කොළ මැළවීමේ රෝග මර්දන වැඩසටහන	105.00	රෝග පැතිරීම අවම කිරීම සහ බලපෑමට ලක් වූ ප්‍රදේශවල රෝග කළමනාකරණය කිරීම	• රෝගී ගස් සලකුණු කර ඉවත් කිරීම • ඉවත් කළ ගස් සඳහා වන්දි ගෙවීම • දැනුවත් කිරීමේ වැඩසටහන් • ඉඩම් හිමියන්ගේ ආර්ථික මට්ටම සුරක්ෂිත කිරීම • පුහුණු වැඩසටහන් පැවැත්වීම	පොල් වගා කිරීමේ මණ්ඩලය සහ පොල් පර්යේෂණ ආයතනය
2	දෙමුහුම් බීජ පොල් නිෂ්පාදනය කිරීමේ ව්‍යාපෘතිය (කිණියම බීජ පොල් උයන)	8.00	ජාතික පොල් වගා වැඩසටහන සඳහා දෙමුහුම් පොල් වගාව ප්‍රවර්ධනය කිරීමට බීජ පොල් නිෂ්පාදනය කිරීම	• තරල වියළුම් 2 ක් මිලදී ගැනීම • පෙරහන් කට්ටල 2 ක් මිලදී ගැනීම • නළ වාරිමාර්ග පද්ධතිය සඳහා පොම්ප ඒකකයක් පිහිටුවීම • පරාග සැකසුම් විද්‍යාගාරයට ගෘහ භාණ්ඩ මිලදී ගැනීම • PCR යන්ත්‍රයක් මිලදී ගැනීම • එස්. ආර්. සහ ජී. ඩී. බීජ පැල මිලදී ගැනීම සහ පුරප්පාඩු පිරවීම	පොල් පර්යේෂණ ආයතනය
3	පොල් වගාවේ පළිබෝධ මර්ධනය (විලෝපිත මයිටා)	15.00	මයිටා හානිය පාලනය කිරීම සඳහා විලෝපික මයිටාවන් නිෂ්පාදනය පුළුල් කිරීම හා බෙදා හැරීම	• විලෝපික මයිටාවන් නිෂ්පාදනය කිරීම සඳහා විද්‍යාගාර පිහිටුවීම සඳහා ගොඩනැගිලි ප්‍රතිසංස්කරණය කිරීම • ගබඩා පහසුකම් සැපයීම සඳහා ගොඩනැගිල්ල ප්‍රතිසංස්කරණය කිරීම • මයිටාවන් බෙදා හැරීමේ ජාලය පුළුල් කිරීම • විද්‍යාගාර උපකරණ සහ වායු සමීකරණ මිලදී ගැනීම • මයිටා පාලන වැඩසටහන අධීක්ෂණය හා ඇගයීම සඳහා උපකරණ මිලදී ගැනීම • ප්‍රචාරණය සහ පරිපාලනය	පොල් වගා කිරීමේ මණ්ඩලය
4	තෙත් කලාප දෙමුහුම් බීජ ව්‍යාපෘතිය	6.00	අතරමැදි තෙත් කලාප සඳහා දෙමුහුම් බීජ පොල් නිෂ්පාදනය සඳහා නව පොල් බීජ උද්‍යානයක් පිහිටුවීම	• බීජ වර්ග නිෂ්පාදනය කිරීම සඳහා අත් පරාගණය • බීජ පැල නිෂ්පාදනය • මූලික ඉඩම් සැකසීම හා යටිතල පහසුකම් සංවර්ධනය හා බීජ පැල 650 ක් සිටුවීම • උපකරණ මිලදී ගැනීම • පරාග සැකසුම් විද්‍යාගාරය ඉදිකිරීම	පොල් පර්යේෂණ ආයතනය
එකතුව		134.00			

2021 පොල් ක්ෂේත්‍රයේ ඉලක්ක දර්ශකයන් සැකවින්..

විස්තරය	වර්ෂ 2021 ඉලක්ක
පොල් අස්වැන්න (ගෙඩි මිලි.)	3224
අපනයන ආදායම (රු.බිලි.)	161
ඵලදායිතාව (ගෙඩි/හෙක්)	7036
පොල් පැළ නිෂ්පාදනය (පැළ මිලි.)	4.0
නව වගාව (හෙක්)	3840
නැවත වගාව (හෙක්)	256
යටි වගාව (හෙක්)	3025
ගෙවතු වගාව (පැළ)	2,732,000
පුරන් කුඹුරුවල පොල් වගාව (පැළ)	160,000

2021-2025 පොල් ගෙඩි අවශ්‍යතාවය පිළිබඳ පුරෝකථනය



	2020 සත්‍ය	2021 පුරෝකථනය	2022 පුරෝකථනය	2023 පුරෝකථනය	2024 පුරෝකථනය	2025 පුරෝකථනය
පරිභෝජනය සඳහා පොල් ගෙඩි අවශ්‍යතාවය	1827	1827	1827	1827	1827	1827
කර්මාන්ත සඳහා පොල් ගෙඩි අවශ්‍යතාවය	1125	1397	1556	1669	1796	2084
සමස්ථ පොල් ගෙඩි අවශ්‍යතාවය	2952	3224	3383	3496	3623	3911

2.1.3 ක්ෂේත්‍රය සංවර්ධනය කිරීම සඳහා වූ අභියෝග

ලෝකයේ පොල් පරිභෝජනය දිනෙන් දින ඉහළ යාමේ ප්‍රවණතාවයක් දක්නට ඇත. තවද කොවිඩ්-19 වසංගතය හමුවේ ලෝක ප්‍රජාවගේ ආර්ථික හා සමාජයීය අවශ්‍යතා ද වෙනස් වෙමින් පවතින අතර, කාලගුණික හා දේශගුණික රටාවල ශීඝ්‍ර වෙනස්වීම් සිදු වෙමින් පවතී. එබැවින් පොල් ක්ෂේත්‍රය මගින් දේශීය ආර්ථිකයට මෙන්ම ජාත්‍යන්තර වෙළෙඳපොළට ඉදිරිපත් කරන නිෂ්පාදනයන් කාලානුරූපීව වෙනස් විය යුතු අතර පොල් පර්යේෂණායතනය, පොල් වගාකිරීමේ මණ්ඩලය හා පොල් සංවර්ධන අධිකාරිය යන ආයතන මගින් සපයන සේවාවන් කාලානුරූපි අවශ්‍යතාවයන්ට අනුගත වෙමින් වෙනස් විය යුතු වේ.

පොල් පර්යේෂණායතනය, පොල් වගාකිරීමේ මණ්ඩලය, හා පොල් සංවර්ධන අධිකාරිය යන ආයතන වලින් රැස් කරගන්නා ලද දත්ත හා තොරතුරු අනුව පහත සඳහන් ගැටලු පොල් ක්ෂේත්‍රයට අදාලව හඳුනා ගතහැකි විය.

පොල් වගාව සම්බන්ධ ගැටලු

- හෙක්ටයාරයක බිමකින් ලැබෙන සාමාන්‍ය පොල් අස්වැන්න අඩු අගයක පැවතීම.
- පොල් වගාව සඳහා කරනු ලබන ආයෝජන දීර්ඝකාලීන බැවින් ඒ සඳහා වගාකරුවන් උනන්දු නොවීම.
- ශ්‍රී ලංකාවේ බොහොමයක් පොල් ඉඩම් පුනරුත්ථාපනය කළ යුතු මට්ටමක පවතී. විශේෂයෙන් පාංශු සංරක්ෂණය සහ තෙතමන සංරක්ෂණය ඉතා වැදගත් වේ. මේ සඳහා අධික මුදලක් වැය වන හෙයින් වගාකරුවන් ඒ සඳහා උනන්දු නොවේ.
- පොල් ඉඩම් කළමනාකරණය ඉතාමත් දුර්වල තත්ත්වයක පවතින අතර, පොහොර යෙදීම සිදුවන්නේ 30%-40% පමණ වන ඉඩම් ප්‍රමාණයකට පමණි.
- පොහොර හා කෘෂි රසායන ආදී ද්‍රව්‍ය වෙළඳපොලේ පවතින හිඟතාවය.
- පොල් තනි බෝගයක් ලෙස වගා කෙරේ. එම බිම්වල අතුරු බෝග ප්‍රචලිත කිරීමට ඇතැම් ගොවීහු මැලිකමක් දක්වයි.
- අයහපත් දේශගුණික සහ කාලගුණික විපර්යාසයන් හා දිගින් දිගටම ඇතිවන නියං තත්ත්වයන් නිසා පොල් අස්වැන්න කෙරෙහි දැඩි බලපෑමක් ඇති වන අතර, එමගින් පොල් වගාවන් දුර්වල වීමට පටන් ගෙන ඇත.
- පොල් වගාවට ඇතිවී තිබෙන වන සත්ත්ව හානි නිසා විශේෂයෙන් ඉත්තෑවන්, වල් ඌරන්, දඬු ලේනුන් හා රිලවුන් නිසා වගාවන් පවත්වාගෙන යාම අපහසු වීම
- පොල් වගාව සඳහා යොදාගෙන ඇති වගාවට යෝග්‍ය ඉඩම් වෙනත් කාර්යයන් සඳහා කට්ටිකර යොදා ගැනීම.
- ප්‍රධාන පොල් වගාකරන දිස්ත්‍රික්ක වල පවතින වගාවන් බොහොමයක් වසර 50 පමණ ඉක්මවූ වගාවන් වන අතර, සෑම වගාවක්ම නැවත ප්‍රතිස්ථාපනය කල යුතුව ඇත.
- ශ්‍රම හිඟය හා ඉහළ යන ශ්‍රමයට ගෙවිය යුතු මුදල නිසා පොල් ඉඩම් නඩත්තුව අපහසු වී ඇත.
- වැලිගම පොල් කොළ මැලවීමේ රෝගය, කළු කුරුමිණි හා රතු කුරුමිණි රෝග නිසා වාර්ෂිකව විශාල පොල් පැළ හා ගස් ප්‍රමාණයක් අහිමි වීම සිදුවේ.

පොල් වගාකරුවන් හට තිබෙන ගැටළු

- කුඩා පොල් වතු හිමියන් සතු ව්‍යවසායකත්ව දැනුමේ මද බවක් පවතී.
- කුඩා පොල්වතු හිමියන්ගේ අලෙවිකරණ දැනුම දුර්වලය
- විධිමත් සංවිධානය වූ තිරසාර ප්‍රජා මූල සංවිධාන ව්‍යුහයක් දක්නට නොමැත.

පොල් ආශ්‍රිත කර්මාන්ත හා සම්බන්ධ ගැටළු

පොල් ආශ්‍රිත නිෂ්පාදන විවිධාංගීකරණය සඳහා අවශ්‍ය යන්ත්‍රෝපකරණ සහ උපකරණවල හිඟයක් දක්නට ලැබේ.

- නිෂ්පාදන විවිධාංගීකරණයට සහ අගය එකතු කළ භාණ්ඩ නිෂ්පාදනයට අවශ්‍ය කුසලතාවල හිඟයක් දක්නට ලැබේ.
- පොල් හිඟය නිසා කර්මාන්තවලට අවශ්‍ය අමුද්‍රව්‍ය (පොල් තෙල්, දිසිඳි පොල්, පොල් කිරි ආදිය) ප්‍රමාණවත් පරිදි නොලැබීම මගින් එම කර්මාන්ත පවත්වාගෙන යාම හා අන්තර්ජාතිකව තරඟ කිරීමට ඇති හැකියාව අඩුවී ඇත.
- ගෝලීය වෙළෙඳපොළ ඉල්ලුමට සරිලන පරිදි අගය එකතු කළ නිෂ්පාදන හා ජාත්‍යන්තර ප්‍රමිතිකරණ අවශ්‍යතාවයන්ට අනුගත නිෂ්පාදනයන් වෙළඳපොළට ඉදිරිපත් නොවීය.
- ගෘහස්ථව පරිභෝජන කරනු ලබන පොල්වල කටු හා ලෙලි ප්‍රමාණවත් පරිදි කර්මාන්තවලට නොලැබීම.
- පොල් වතුර ආශ්‍රිත කර්මාන්ත ප්‍රවර්ධනය සඳහා නීතිමය බාධාවන් පැවතීම.
- පොල් මිල උච්චාවඡනය වීම ද කර්මාන්තයට ඉතා අහිතකර ලෙස බලපෑම් ඇති කර ඇත.
- කර්මාන්තය පවත්වාගෙන යාමට උසස් මට්ටමේ යෝග්‍ය තාක්ෂණය ලබා ගැනීමේ ගැටළුව.
- කර්මාන්තයට අදාළව ආරම්භක ප්‍රාග්ධන අවශ්‍යතා සපුරා ගැනීමේ ගැටළු පවතී.

වෙළඳපොළ සම්බන්ධ ගැටළු

- පොල් සඳහා පවතින ගොවිපළ මිල අස්ථාවර හා අඩු මට්ටමක පැවතීම නිසා ලැබෙන ආදායම් අඩු නිසා නව තාක්ෂණ විධි සඳහා අනුගත වීමට ගොවීහු කැමැත්තක් නොදක්වති.
- අලෙවිකරණ දැනුම දුර්වල බැවින් කුඩා පොල්වතු හිමියන්ට ලැබී ඇති අලෙවි ප්‍රස්ථා අඩුය.
- නිෂ්පාදිත පොල්වලින් වැඩි ප්‍රමාණයක් දේශීයව පරිභෝජනය කරනු ලබන හෙයින් රට තුළ පොල් මිල පාලනය සඳහා විවිධ පියවර ගැනීම තුළින් පොල් නිෂ්පාදන වලින් ලැබෙන වෙළඳපොළ ලාභය අවම වීම.
- පොල් බෙදා හැරීමේ ජාලය තුළින් අතරමැදියන් වැඩි ආර්ථික ලාභයක් ලබා ගැනීම.
- නිසි ප්‍රමිතියෙන් තොර නිෂ්පාදන වෙළඳපළට ඉදිරිපත් කිරීම.
- පොල් තෙල්වලට ආදේශකයක් ලෙස පාම් තෙල් ආනයනය හා පාම්තෙල් සමඟ පොල් තෙල් මිශ්‍රකර තත්ත්වයෙන් බාල තෙල් වෙළඳපළට යොමු කිරීම

ආයතනික ගැටළු

- පොල් කර්මාන්තය ආශ්‍රිතව පාර්ශවකරුවන්ගේ අවශ්‍යතාවය සැපිරීමට සරිලන ප්‍රමාණවත් ක්ෂේත්‍ර නිලධාරීන් නොසිටීම
- පොල් සංවර්ධන අධිකාරියේ හා පොල් වගා කිරීමේ මණ්ඩලයේ ප්‍රාදේශීය සේවා ව්‍යුහය සමතුලිත නොවීම හා ප්‍රමාණවත් අභ්‍යන්තරික නිලධාරීන් නොමැති වීම
- දැනට පවත්වාගෙන යනු ලබන ව්‍යාප්ති සේවා ප්‍රවේශය සියළු පාර්ශවකරුවන්ගේ ගැටළු විසඳීමට ප්‍රමාණවත් නොවීම
- දැනට පවතින ව්‍යාප්ති සේවයේ කාර්යක්ෂමතාවය අඩු වීම
- විශාල කර්මාන්ත ව්‍යාප්තියක් ඇති ප්‍රදේශ සඳහා නිලධාරීන් බෙදී යාමේ විෂමතාව හා දැනට සේවයේ යෙදී සිටින ක්ෂේත්‍ර නිලධාරීන්ගේ පහසුකම් අවම වීම

2.1.4 ක්ෂේත්‍රය - සමස්ත ප්‍රගතිය

පොල් අපනයනය

අපනයන කාර්යසාධනය ඇ.ඩො. මිලියන
(2010 සිට 2021 දක්වා)



වාර්ෂික පොල් අපනයන ආදායම සමස්ත අපනයන ආදායමේ ප්‍රතිශතයක් ලෙස-
(2010 සිට 2020 දක්වා)



පොල් අපනයන නිෂ්පාදනයන්හි සංයුතිය
අපනයන ආදායමේ ප්‍රතිශතයක් ලෙස -
2021 වර්ෂය



දත්ත මූලාශ්‍රය - ශ්‍රී ලංකා අපනයන සංවර්ධන මණ්ඩලය

පොල් කර්මාන්තය මගින් දේශීය ආහාර අවශ්‍යතාවය සපුරනවාට අමතරව 2021 වර්ෂයේදී ඩොලර් බිලියන 0.834 ක අපනයන ආදායමක් උපයන ලද අතර, දළ ජාතික නිෂ්පාදිතයට ආසන්න වශයෙන් 1% ක දායකත්වයක් දක්වයි. එමෙන්ම පොල් නිෂ්පාදනය රටෙහි සමස්ත කෘෂිකාර්මික නිෂ්පාදනයන්ගෙන් 12% පමණ වේ.

පොල් ආශ්‍රිත නිෂ්පාදන අපනයනයන් සලකන කළ ශ්‍රී ලංකාව ලෝකයේ විශාලතම සිවිවන අපනයනකරු වන අතර දිසිදි පොල්, පොල් කෙඳි ආශ්‍රිත නිෂ්පාදන, පොල් තෙල් හා පොල් වතුර ප්‍රධාන අපනයන නිෂ්පාදනයන් වේ.

2010 වර්ෂයේ පොල් ආශ්‍රිත අපනයන ආදායම ඇ.ඩො මිලියන 277.63 ක් වූ අතර 2021 වන විට එම අගය ඇ.ඩො මිලියන 834.12 ක් ලෙස, එනම් 2010 – 2021 කාල සීමාව තුළදී අපනයන ආදායම තුන් ගුණයකටත් වඩා වැඩි වී ඇත.

එමෙන්ම කාර්මික අපනයන ආදායමෙන් පොල් ආශ්‍රිත නිෂ්පාදන ආදායම 2010 වර්ෂයේ 3.3% ක් වූ අතර එය 2020 වන විට 6.7% ක අගයක් පෙන්නුම් කරයි.

පොල් ආශ්‍රිත නිෂ්පාදන අපනයනය

2020 දී වන විට පොල් ආශ්‍රිත නිෂ්පාදන වර්ග 40 ක් රටවල් 150ක් වෙත අපනයනය කර ඇත.

පොල් ක්ෂේත්‍රය සමස්ත කාර්යසාධනය - වාර්ෂික

විස්තරය	වර්ෂ 2019	වර්ෂ 2020	වර්ෂ 2021
පොල් අස්වැන්න (ගෙඩි මිලි.)	3085.567	2792.202	3224
අපනයන ආදායම (රු.බිලි.)	108	122.5	161
ඵලදායිතාව (ගෙඩි/ හෙක්)	5655	4827	7036
පොල් පැළ නිෂ්පාදනය (පැළ මිලි.)	2.74	1.52	7.5
නව වගාව (හෙක්)	5110	4004	4340
නැවත වගාව (හෙක්)	106	318	620
යටි වගාව (හෙක්)	2819	3340	1240
ගෙවතු වගාව (පැළ)	719,723	835,122	6,530,000
පුරන් කුඹුරුවල පොල් වගාව (පැළ)	-	-	32,000



මූලාශ්‍රය- පොල් සංවර්ධන අධිකාරිය

අපනයන ආදායම

නිෂ්පාදන වර්ගය	අපනයන ආදායම - ජනවාරි සිට දෙසැ. 31 දක්වා (රු.මි.)		
	2020 (රු.මි)	2021 (රු.මි)	වර්ධනය %
පොල් මද ආශ්‍රිත	63,292.56	86,437.00	37
කෙඳි	5,307.67	5,777.68	9
කෙඳි නිමි නිෂ්පාදන	32,898.36	43,736.46	33
කටු ආශ්‍රිත නිෂ්පාදන	20,678.17	29,371.97	42
වෙනත්	337.49	710.92	111
එකතුව	**122,514.26**	**166,034.02**	**36**

අපනයනය උච්ඡාවචනය වීම

නිෂ්පාදන වර්ගය	ජනවාරි සිට දෙසැම්බර් 31 දක්වා					
	ප්‍රමාණය (මෙ.ටො.)			ආදායම (රු.මිලි.)		
	2020	2021	වෙනස %	2020	2021	වෙනස %
පොල් තෙල් (මෙ.ටො.)	5,180	3,825	-26	2,637.90	2,319.74	-12
පිරිසිදු පොල් තෙල් (මෙ.ටො.)	14,584	14,960	3	11,944.55	14,744.20	23
පොල් වතුර (මෙ.ටො.)	17,910	26,414	47	2,781.21	4,485.30	61
කැඹිලි (ගෙඩි)	5,924,087	9,548,368	61	598.61	900.00	50
අමු පොල් (ගෙඩි) '000	15,838	14,565	-8	1,226.20	1,213.90	-1
බ්‍රිස්ටල් කෙඳි (මෙ.ටො.)	1,231	1,785	45	322.29	475.38	47

පොල් වෙන්දේසි සාමාන්‍ය මිල ගණන්

මිල වර්ගය	ඒකකය	2020 වාර්ෂික මිලෙහි සාමාන්‍යය	2021 වාර්ෂික මිලෙහි සාමාන්‍යය	වෙනස %
වෙන්දේසි (කොළඹ)	ගෙඩි 1000ක සාමාන්‍ය මිල රුපියල්	48,891	56,513	16
තොග * විශාල ප්‍රමාණයේ	ගෙඩි 1000ක සාමාන්‍ය මිල රුපියල්	64,154	76,226	19
කුඩා ප්‍රමාණයේ		57,946	67,531	17
සිල්ලර * විශාල ප්‍රමාණයේ	ගෙඩියක සාමාන්‍ය මිල රුපියල්	75.7	92.38	22
කුඩා ප්‍රමාණයේ		61.3	74.87	22

*මූලාශ්‍රය -හෙක්ටර් කොඩිබෑකඩුව ගොවි පර්යේෂණ හා පුහුණු ආයතනය සටහන - කොවිඩ් වසංගතය හේතුවෙන් 2020 වර්ෂයේ ඇතැම් මාසවල මිල ගණන් ප්‍රකාශයට පත්කර නොමැත.

2.1.4.1 ක්ෂේත්‍රය සංවර්ධනය සඳහා වූ ක්‍රියාමාර්ග

2.1.4.1.1 පොල් වගාකිරීමේ මණ්ඩලය

දැක්ම

"ශ්‍රී ලංකාව ලෝකයේ වඩාත්ම කාර්යක්ෂම පොල් නිෂ්පාදකයා කරවීම"

මෙහෙවර

"ශ්‍රී ලංකාවේ දේශීය පරිභෝජන ඉල්ලුම හා අපනයන අවශ්‍යතාවය සපුරාලමින්, ස්වයං පෝෂිත තත්ත්වය ලඟා කර ගැනීම පිණිස ඵලදායී උපදේශන හා ව්‍යාප්ති සේවාවක් මඟින් පොල් නිෂ්පාදනය ඉහළ නැංවීම තුළින් පොල් වගාකරුවාට ඉහළ ජීවන මට්ටමක් සාක්ෂාත් කරවීම"

පොල් වගා කිරීමේ මණ්ඩලයේ සේවාවන් මඟින් පොල් වගාවට අවශ්‍ය තාක්ෂණික සහ යෙදවුම් පහසුකම් වගාකරුවාට ලබා දේ. ඒ යටතේ පහත සේවාවන් පොල් වගා කිරීමේ මණ්ඩලයෙන් ලබා ගත හැක.

- තාක්ෂණික උපදෙස්
- මූල්‍ය ණය සහනාධාර
- මූල්‍ය සහනාධාර
- යෙදවුම්
- සහනාධාර වශයෙන් වගාකරුවන්ට වාර්ෂිකව ලබා දෙන පොල් පැළ ප්‍රමාණය මිලියන 2 – 3 අතර වේ.

සෑම පැළයක් සඳහාම රු.100/= ක සහනාධාරයක් වගාකරුට ලබා දේ. ඒ අනුව බිම් පැළයක් රු.75/= කට ද පොලි බෑග් පැළයක් රු.150/= කට ද වගාකරුට ලබා ගත හැක.
ඉහත සේවාවන් ලබා දීම සඳහා පොල් වගා කිරීමේ මණ්ඩලයේ ක්ෂේත්‍රයේ රාජකාරි කරනු ලබන ක්ෂේත්‍ර නිලධාරීන් 200 කට වැඩි ප්‍රමාණයක් සිටින අතර ඔවුන් දිවයින පුරා ප්‍රාදේශීය කාර්යාල 19 ක මෙහෙයවීම යටතේ ක්ෂේත්‍රයේ කටයුතු කරනු ලැබේ.

පොල් වගා කිරීමේ මණ්ඩලය යටතේ දැනට පවතින සහනාධාර වැඩසටහන්

- විවිධ පුනරුත්ථාපන ක්‍රම යටතේ පොල් ඉඩම් පුනරුත්ථාපනය කිරීම - අක්කරයකට රු.30,000/=
- පොල් වගාවට ජල සැපයුම ප්‍රවර්ධනය සඳහා ජල නළ සහනාධාර වැඩසටහන - අක්කරයකට රු.20,000/=
- නව/නැවත/යටි වගා වැඩසටහන් යටතේ 2018, 2019, 2020 වර්ෂවලදී සිටුවන ලද පොල් පැළ අධීක්ෂණය සහ පවතින පැළ නඩත්තුවට සහනාධාර ලබා දීම - පැළයකට රු.50/=
- සහනාධාර යටතේ පොල් ඉඩම්වල අතුරු වගාව කිරීම - අක්කරයකට රු.10000/=
- වනසතුන්ගෙන් පොල් වගාව ආරක්ෂා කිරීමේ සහනාධාර වැඩසටහන - පැළයකට රු.200/=

පොල් වගාකිරීමේ මණ්ඩලය විසින් පොල් ක්ෂේත්‍රයේ උන්නතිය උදෙසා ක්‍රියාත්මක කර ඇති විශේෂ ක්‍රියාමාර්ග

අපේක්ෂිත ප්‍රතිඵල

පොල් වගාවේ ඵලදායීතාවය ඉහළ නංවා ගනිමින් දිවයින පුරා පොල් වගාව ව්‍යාප්ත කිරීම හා නිරෝගී වගාවක් පවත්වාගෙන යාම සඳහා පහසුකම් සැපයීම

සුවිශේෂී ක්‍රියාමාර්ග

- ශ්‍රමික බලකාය වැඩසටහන
- පොල් පැළ සහනාධාරය
- ව්‍යාප්ති කටයුතු සඳහා තොරතුරු තාක්ෂණ ක්‍රමවේද භාවිතය
- මයිටා පරපෝෂීන් බෙදා හැරීමේ ජාලය පුළුල් කිරීම.
- පොල් වගාවේ ප්‍රධාන කෘමි හානි සිතියම් ගතකිරීම.

- **ශ්‍රමික බලකාය වැඩසටහන**

පොල් ඉඩම්වල ශෂ්‍ය විද්‍යාත්මක කටයුතු සිදු කිරීමේදී අවශ්‍ය පුහුණු ශ්‍රමය සපයා ගැනීම සඳහා පොල් වගාකිරීමේ මණ්ඩලය මඟින් ක්ෂේත්‍ර කටයුතු පිළිබඳව පුහුණු කරන ලද ශ්‍රමිකයින් ක්ෂේත්‍රයට මුදා හැර ඇත. ඒ අනුව පොල් වගාකරුවන්ට සාධාරණ මුදලක් ගෙවීම මඟින් ඉහත ශ්‍රමිකයන්ගේ සේවාවන් ලබාගත හැක.

- **පොල් පැළ සහනාධාරය**

පොල් වගා කිරීමේ මණ්ඩලයෙන් පොල් පැළ මිලදී ගනු ලබන ඕනෑම වගාකරුවෙකුට මේ යටතේ සහනදායී මිලට පොල් පැළ මිලදී ගත හැක. එහිදී බිම් පැළයක් රු.75/= සහ පොලි බෑග් පැළයක් රු.150/= වැනි අවම මිලකට පැළය මිලදී ගැනීමේ පහසුකම ලබා දී ඇත. තව ද ඕනෑම වගාකරුවෙකුට ඉහත සහනදායී මිල යටතේ කිසිම බාධාවකින් තොරව පොල් වගාකිරීමේ මණ්ඩලයට අයත් ඕනෑම තවානකින් හෝ ප්‍රාදේශීය කාර්යාලකින් මිලදී ගත හැක. ඉදිරියේදී පැළ නිකුත් කිරීමේ ජාලය ගොවිජන කේන්ද්‍ර දක්වා ව්‍යාප්ත කරනු ලැබේ.

- **ව්‍යාප්ති කටයුතු සඳහා තොරතුරු තාක්ෂණ ක්‍රමවේද භාවිතය.**

පොල් වගාවේ තාක්ෂණික තොරතුරු පහසුවෙන් වගාකරුවන්ට ලබා දීම සඳහා ජංගම දුරකථනයෙන් බාගත කළ හැකි මෘදුකාංගයක් (Coconut App) මේ වන විට පොල් වගාකිරීමේ මණ්ඩලය මඟින් නිර්මාණය කර ඇත. එමඟින් පොල් වගා කිරීමේ මණ්ඩලයේ තාක්ෂණික නිලධාරියෙකුගේ විශේෂ සහයකින් තොරව තම පොල් ඉඩමේ පොහොර යෙදීම, වසුන් යෙදීම වැනි ශෂ්‍ය විද්‍යාත්මක කටයුතු කිරීමට අවශ්‍ය දැනුම එම මෘදුකාංගය මඟින් ලබා ගත හැක. එම දුරකථන යෙදුම Google Play Store සහ App store මඟින් බාගත කළ හැක.

- **විලෝපික මයිටාවන් බෙදා හැරීමේ ජාලය පුළුල් කිරීම.**

පොල් අස්වැන්නට ප්‍රබල බලපෑමක් සිදු කරන මයිටාවන් පාලනය සඳහා පොල් පර්යේෂණ ආයතනයේ නිර්දේශ මත විලෝපිත මයිටාවන් නිෂ්පාදනය කර බෙදා හැරීමේ ජාලය පුළුල් කිරීමට පියවර ගන්නා ලදි. ඒ අනුව 2019 හා 2020 වර්ෂයන්හි විලෝපික මයිටා තාක්ෂණ විද්‍යාගාර ගබඩා 04 ක් ස්ථාපිත කරන ලදි. එමඟින් වගාකරුවන්ට අපහසුවකින් තොරව විලෝපික මයිටාවන් ලබා ගැනීමට හැකියාවක් ලැබිණි.

- **පොල් වගාවේ ප්‍රධාන කෘමි හානි සිතියම්ගත කිරීම.**

පොල් වගාවට හානිකරනු ලබන ප්‍රධාන කෘමීන්ගේ ව්‍යාප්තිය හා ඔවුන්ගේ හානියේ තීව්‍රතාව පිළිබඳ සිතියම් සකස් කරන ලදි. මෙම සිතියම්වල වූ තොරතුරු කෘමි හානි මර්දන වැඩසටහන් සඳහා යොදා ගනු ලබන අතර එම වැඩසටහන්වල ඵලදායීතාවය ඇගයීම සඳහා ද මෙම සිතියම් යොදාගනී.

පොල් වගාකිරීමේ මණ්ඩලය විසින් ක්‍රියාත්මක කරන ලද ව්‍යාපෘතිවල මූල්‍ය හා භෞතික ප්‍රගතිය

2021.12.31 දිනට විශේෂ සංවර්ධන වැඩසටහන්හි ප්‍රගතිය

පොල් පැළ බෙදාදීමේ සහනාධාර වැඩසටහන්

වැඩසටහන	ඒකකය	භෞතික ඉලක්කය (වාර්ෂික)	2021.12.31 දිනට භෞතික ප්‍රගතිය	මූල්‍ය ප්‍රගතිය (රු.මිලි)
නව/නැවත/යටි වගා වැඩසටහන	පොල් පැළ	745,500	846,027	232.80
ගෙවතු වගා වැඩසටහන		100,000	124,274	
පාළු පැළ සිටුවීමේ වැඩසටහන		241,800	192,216	
විශේෂ ගෙවතු වගා වැඩසටහන		2,183,700	615178	
එකතුව (සහනාධාර)		2,600,000	1,777,695	

පොල් වගාකිරීමේ මණ්ඩලයේ ව්‍යාප්ති, පුහුණු හා ජනමාධ්‍ය වැඩසටහන් ප්‍රගතිය

වැඩසටහන	ඒකකය	භෞතික ඉලක්කය (වාර්ෂික)	2021.12.31 දිනට භෞතික ප්‍රගතිය	මූල්‍ය ප්‍රගතිය (රු.මිලි)
පුහුණු වැඩසටහන් පැවැත්වීම	වැඩසටහන්	164	55	47.619
ජාතික මට්ටමේ ප්‍රදර්ශන	ප්‍රදර්ශන	5	5	
පුහුණු ආධාරක සකස් කිරීම	අත්පත්‍රිකා	1,320,000	374,700	
රැස්වීම් පැවැත්වීම	රැස්වීම්	4	8	
කණ්ඩායම් ව්‍යාප්ති වැඩසටහන් පැවැත්වීම	වැඩසටහන්	700	638	
ඒකපුද්ගල හමුවීම්	වගාකරුවන්	30000	71131	
අක්කර 10ට වැඩි පොල් ඉඩම් සංවර්ධනය	වගාකරුවන්	500	596	
පොල් වගාවේ ව්‍යාප්ති කටයුතු සඳහා ජන මාධ්‍ය යොදා ගැනීම	ඒකක	90	102	

රෝග හා පළිබෝධ මර්දන වැඩසටහන

වැඩසටහන	ඒකකය	භෞතික ඉලක්කය (වාර්ෂික)	2021.12.31 දිනට භෞතික ප්‍රගතිය	මූල්‍ය ප්‍රගතිය (රු.මිලි)
දැනුවත් කිරීමේ වැඩසටහන්	වැඩසටහන්	12	14	11.037
විලෝපිත මයිටාවන් පැකට් පොල් ගස්වලට යෙදීම	පැකට්	460000	246386	
රතු කුරුමිණි හා කළු කුරුමිණි පාලනය සඳහා පොල් ඉඩම්වලට පෙරමෝන වයල් යෙදීම	පෙරමෝන වයල්	31000	11274	
පොල් ඉඩම්වල දළඹුවන් පාලනය සඳහා පොල් දළඹු පරපෝෂිතයින් පොල් ඉඩමට මුදා හැරීම	වයල්	2500	735	
රතු කුරුමිණි පාලනය සඳහා මොනක්‍රොටපස් අලෙවිය	ලීටර්	2000	555	

පොල් පැළ නිෂ්පාදනය හා පැළ වගාකිරීම

2021 වසරේදී පොල් පැළ මිලියන 4.0ක් වගා කිරීමට පොල් වගාකිරීමේ මණ්ඩලය සැලසුම් කරන ලද අතර මෙම සෑම පැළයක්ම සහනදායී මිලට වගාකරුවන්ට අලෙවි කිරීමට සැලසුම් කරන ලදි. ඒ අනුව පොලි බෑග් පැළයක් රු.150, බිම් පැළයක් රු.75 ක් ද ලෙස වගාකරුවාට මිලදී ගත හැක. මෙම නිෂ්පාදිත පැළ නව/නැවත/යටි වගාව යටතේ ක්‍රමවත් පොල් වගාව ලෙස ද ගෙවතු වගාව සහ පොල් ඉඩමේ පාළු සිටුවීම ලෙස ද වගා කළ හැක.







පොල් පැළ නිෂ්පාදනය හා පැළ වගාකිරීම

විස්තරය	2020 වසරේ ප්‍රගතිය	2021 ඉලක්ක (වාර්ෂික)	2021.12.31 දිනට ප්‍රගතිය
සිටුවන ලද පොල් පැළ (මිලි)	1.98	4.00	2.5
පොල් පැළ නිෂ්පාදන (මිලි)	1.48	4.00	3.2
බීජ පොල් බෙදාහැරීම (මිලි)	2.217	5.7	4.6

අනෙකුත් සහනාධාර වැඩසටහන්

මේ යටතේ වන සතුන්ගෙන් පැළ වගාව ආරක්ෂා කිරීම, අතුරු වගාව, නව/ නැවත /යටි වගාව යටතේ සිටුවන ලද පොල් පැළ නඩත්තුව යනාදි සංවර්ධන කටයුතු සඳහා ලබා දුන් මූල්‍ය සහනාධාර මෙම වගුවේ දැක්වේ.

වැඩසටහන	ඒකකය	ඊට අදාළ ඉලක්කය (වාර්ෂික)	2021.12.31 භෞතික ප්‍රගතිය	ගෙවීම් කරන ලද මුදල (රු.මිලි)
වන සතුන්ගෙන් ආරක්ෂා කිරීම	පැළ	93543	87508	17.37
අතුරුබෝග සහනාධාර වැඩසටහන	අක්කර	2723	2569	37.86
නව/ නැවත /යටි වගාව යටතේ සිටුවන ලද පොල් පැළ නඩත්තුව සඳහා සහනාධාර ලබා දීම	පැළ	668000	517866	33.4

රෝග හා පළිබෝධ මර්දන වැඩසටහන



රෝග හා පළිබෝධ මර්දනය මඟින් පොල් ඵලදාව වැඩිකර ගැනීම සඳහා පොල් වගාකිරීමේ මණ්ඩලය රෝග හා පළිබෝධ මර්දන වැඩසටහන් ක්‍රියාත්මක කරනු ලබයි. එහිදී පොල් වගාවේ ප්‍රධාන පළිබෝධකයින් වන රතු කුරුමිණි, කළු කුරුමිණි, පොල් මයිටාවන් සහ පොල් කොළ දළඹුවා මර්දනය සඳහා විශේෂ වැඩසටහන් පොල් වගාකිරීමේ මණ්ඩලය මඟින් ක්‍රියාත්මක කරනු ලබයි. මේ අතරින් රතු කුරුමිණි, කළු කුරුමිණි හා පොල් කොළ දළඹුවා මර්දනය සඳහා ඒකාබද්ධ පළිබෝධ මර්දන ක්‍රම අනුගමනය කරනු ලබයි.

තව ද ප්‍රධාන කෘමිහානි සිතියම් ගත කිරීමේ විශේෂ ව්‍යාපෘතියක් යටතේ මයිටා හානිය, රතු කුරුමිණි හානිය, කළු කුරුමිණි හානිය හා පොල් දළඹු හානිය යන ප්‍රධාන පළිබෝධ හානිවල තීව්‍රතාවය ශ්‍රී ලංකාවේ දිස්ත්‍රික්ක මට්ටමින් සිතියම් ගත කර ඇත.





රෝග හා පළිබෝධ මර්දන වැඩසටහන්

ආදර්ශ පොල් උයන් වැඩසටහන

පොල් වගාකිරීමේ මණ්ඩලයට අයත් ආදර්ශ පොල් උයන් 12 මඟින් 2021.01.01 සිට 2021.12.31 දක්වා පොල් ගෙඩි 6,116,282 නිෂ්පාදනය කර ඇත. 2021.12.31 වන විට පොල් ගෙඩියක නිෂ්පාදන වියදම රු. 19.52 ක අවම මට්ටමක් නඩත්තු කිරීමටත් N.S.A අගය රු.50.76 ක උපරිම මට්ටමක රඳවා ගැනීමටත් පොල් වගාකිරීමේ මණ්ඩලය සමත් වී ඇත.

2021.01.01 සිට 2021.12.31 දක්වා ආදර්ශ පොල් උයන් අනුව පොල් අස්වැන්න පහත වගුවේ දැක්වේ.

ආදර්ශ පොල් උයන	මුළු පොල් අස්වැන්න	ආදර්ශ පොල් උයන	මුළු පොල් අස්වැන්න
බෝපිටිය	292249	පාසිකුඩා	219402
ඩෙසිවැලි	881327	කොහොඹාන	196273
මහයාය	870795	කොරේයි	235293
මුන්දලම	73320	පලෙයි	250610
ගර්ඩිලන්ඩ්	854331	රන්දෙණිය	617767
ලේනව	857368	නාගන්සෝල	767547

කප්රුක ආයෝජන ණය වැඩසටහන

මෙම වැඩසටහන යටතේ පොල් අක්කර 2109ක් සංවර්ධනය සඳහා රු.මිලියන 66.847 ක ණය මුදලක් බැංකුව මඟින් නිදහස් කර ඇත. ඒ අනුව ප්‍රතිලාභීන් 451 සඳහා ණය පහසුකම් ලබා දී ඇත.

පොල් වගාකිරීමේ මණ්ඩලය - 2021.12.31 දිනට සමස්ත මූල්‍ය ප්‍රගතිය

මූල්‍ය ප්‍රගතිය	ඇස්තමේන්තුගත වටිනාකම රු.මිලි (2021.12.31)	ලද මුදල 2021.12.31 (රු.මිලියන)	2021.12.31 දිනට ප්‍රගතිය (රු.මිලියන)	%
ප්‍රාග්ධන	735.00	734.294	734.294	100
පුනරාවර්තන	500.00	500.000	500.00	100

පොල් වගාකිරීමේ මණ්ඩලය විසින් 2021.12.31 දින දක්වා ක්‍රියාත්මක කරන ලද ව්‍යාපෘතිවල 100% මූල්‍ය ප්‍රගතියක් අත් කරගෙන ඇත.

2.1.4.1.2 පොල් සංවර්ධන අධිකාරිය

දැක්ම

"පොල් කර්මාන්තය දළ දේශීය නිෂ්පාදනය සඳහා වැවිලි ක්ෂේත්‍රයෙන් ඉහළතම දායකත්වය ලබාදෙන්නා වීම සහ නිෂ්පාදන අලෙවි විවිධාංගීකරණයේදී ගෝලීය නායකයා වීම."

මෙහෙවර

"ගෘහස්ත පරිභෝජනය සහ කර්මාන්තය සඳහා පොල් සහ පොල් නිෂ්පාදන සැපයුම තහවුරු කිරීම මඟින්, පොල් කර්මාන්තය දීර්ඝ කාලීන වාණිජමය ඵලදායීතාවය, තිරසාරත්වය හා ජාතික ආර්ථිකය ඉහළ දායකත්වයක් කරා ගෙන ඒම සඳහා පහසුකම් සැපයීම"

ශ්‍රී ලංකාවේ පොල් සංවර්ධන අධිකාරිය (පො.සං.අ.) වූ කලී 1971 අංක 46 දරණ පොල් සංවර්ධන පනතේ විධිවිධාන යටතේ පිහිටුවා ඇති ව්‍යවස්ථාපිත ප්‍රමුඛ සංවිධානය වේ. ශ්‍රී ලංකාවේ පොල් කර්මාන්තය සංවර්ධනය කිරීමේ වගකීම දරණ මෙම ආයතනය පොල්, කිතුල් හා තල් වගා ප්‍රවර්ධනය හා ආශ්‍රිත කාර්මික භාණ්ඩ නිෂ්පාදන හා අපනයන විවිධාංගීකරණ රාජ්‍ය අමාත්‍යාංශය යටතේ ක්‍රියාත්මක වේ. පොල් ආශ්‍රිත නිෂ්පාදන අපනයනකරුවන්ට විදේශ ගැණුම්කරු ජාලය සමඟ සම්බන්ධතා පැවැත්වීමට පහසුකම් සපයයි. සියලුම පාර්ශවකරුවන්හට සාධාරණ පොල් මිලක් ලබා ගැනීම සහතික කිරීම සඳහා පොල් සංවර්ධන අධිකාරිය විසින් කොප්පරා සහ නැවුම් පොල් වෙන්දේසිය නිතිපතා පවත්වනු ලබයි.

පොල් සංවර්ධන අධිකාරිය ලබා ගත් ජයග්‍රහණ

ශ්‍රී ලංකා ප්‍රතීතන මණ්ඩලය විසින් පොල් නිෂ්පාදන, ISO /IEC 17025 : 2017 ප්‍රමිතියට අදාළව රසායනික හා ක්ෂුද්‍රජීවී පරීක්ෂණ සිදුකිරීම සඳහා පැවැත් වූ පුර්ණ විගණනය 2023 ජුනි 29 දක්වා ISO 17025 : 2017 ප්‍රතීතන තත්ත්වය දීර්ඝ කරන ලදී.

එමෙන්ම පොල් නිෂ්පාදන පරීක්ෂාව සඳහා, ISO 17020:2012 ජාත්‍යන්තර ප්‍රතීතන සහතිකය 2020.03.02 දින ලබා ගන්නා ලදී.

පොල් සංවර්ධන අධිකාරිය මඟින් ක්‍රියාත්මක කරන ලද ව්‍යාපෘතිවල මූල්‍ය හා භෞතික ප්‍රගතිය

තත්ත්ව පාලන හා තත්ත්ව ආරක්ෂණ අංශය

	ක්‍රියාකාරකම	ඒකකය	2021.12.31 දක්වා භෞතික ප්‍රගතිය	%
01.	දෛනික දිසිදි ආදර්ශණයන්හි පරීක්ෂාවන්	ආදර්ශණ ගණන		
	•ක්ෂුද්‍රජීවී විශ්ලේෂණ සිදුකිරීම		7687	118%
	• භෞතික රසායනික පරීක්ෂා සිදුකිරීම		7749	119%
02.	කොහු බත් ආශ්‍රිත නිෂ්පාදන පරීක්ෂාවන්	ආදර්ශණ ගණන	2153	94%
03.	පොල් ක්ෂේත්‍රයේ අවශ්‍යතාව පරිදි පරීක්ෂණ සේවා සැපයීම	පරීක්ෂණ	778	104%
04.	ISO 17025 ප්‍රතීතන තත්ත්වය පවත්වා ගෙන යාම සහ අත්කර ගැනීමේ කටයුතු	ගෙන ඇති ක්‍රියාමාර්ග	• ISO 17025 ප්‍රතීතන තත්ත්වය පවත්වා ගෙන යාම සහ අත්කර ගැනීමේ කටයුතු සිදු කර ඇත (පොල් තෙල් පරීක්ෂණ, ජලයේ රසායනික පරීක්ෂණ, සහ දිසිදි පොල්, ජලය, පොල් කිරි ආශ්‍රිත නිෂ්පාදන, පොල් තෙල් කොහු බත් උපස්ථරයන් හි ක්ෂුද්‍රජීවී පරීක්ෂණ තත්වයන් සඳහා ප්‍රතීතන තත්වය අඛණ්ඩව පවත්වා ගැනීම) • දිසිදි පොල් සඳහා රසායනික පරීක්ෂණ සඳහා ප්‍රතීතන කටයුතු ආරම්භ තිරීම සිදුකර ඇත.	100%
	පුහුණු වැඩසටහන්	වැඩසටහන්	9	113%
	පොල් කර්මාන්තය සඳහා දළ රෙගුලාසි සකස් කිරීම		දළ රෙගුලාසි සකස් කිරීම නිම කර ඇත	100%
05.	**දිසිදි පොල් නිෂ්පාදන ක්‍රියාවලියේ තත්ත්වය සුරක්ෂිත කිරීම සඳහා පරීක්ෂණ සේවා සැපයීම**	**පරීක්ෂණ**		
	•මෝල් අධීක්ෂණය කිරීම		399	200%
	• දිසිදි නිෂ්පාදන පරීක්ෂා		214	119%
	•ජල විශ්ලේෂණ පරීක්ෂා		140	140%

පොල් සංවර්ධන අධිකාරිය මඟින් ක්‍රියාත්මක කරන ලද ව්‍යාපෘතිවල මූල්‍ය හා භෞතික ප්‍රගතිය

තත්ත්ව පාලන හා තත්ත්ව ආරක්ෂණ අංශය

	ක්‍රියාකාරකම	ඒකක	2021.12.31 දක්වා භෞතික ප්‍රගතිය	%
	B) පොල් තෙල් කර්මාන්තය 1) පොල් තෙල් ආදර්ශ පරික්ෂා කිරීම බොර තෙල් පරික්ෂා කිරීම 2) අමුද්‍රව්‍ය (කොප්පරා/ වියලි පොල්) ආදර්ශණ පරික්ෂා කිරීම 3) අවශෝෂ ආදර්ශ පරික්ෂා 4. වෙළඳපොළ පොල් තෙල් පරික්ෂාව C) කොහු/ කොහු බත් කර්මාන්තය 1) කොහු/ කොහු බත් ආදර්ශ පරික්ෂාව		 74 11 44 62 45 49	 148% 88% 124% 90% 98%
01.	දෛනික දිසිදි ආදර්ශණයන් පරික්ෂා	ආදර්ශණ ගණන		
06.	**සැකසුම් සංවර්ධන අංශයේ ක්‍රියාකාරිත්වයට අදාළව පොල් නිෂ්පාදන විශ්ලේෂණය**	පරික්ෂණ		
	A. පොල් තෙල් කර්මාන්තය සඳහා පරීක්ෂණ පහසුකම්			
	· නැවුම් පොල් තෙල්		57	104%
	· පොල් තෙල්		173	157%
	B. කොහු කර්මාන්තය සඳහා පරීක්ෂණ පහසුකම්			
	· කොහු බත් උපස්තර		187	72%
	· කොහු ආශ්‍රිත ආදර්ශ		134	67%
	C.පොල් කිරි කර්මාන්තය සඳහා පරීක්ෂණ පහසුකම්			
	·පොල් කිරි හා පිටිකළ පොල්		150	107%
	·මේදය තරමක් ඉවත් කල දිසිදි පොල්		99	50%
	· අපජල පරීක්ෂා		0	0
	· පොල් කටු අඟුරු		13	50%

සැකසුම් සංවර්ධන අංශය

ක්‍රියාකාරකම	2021 12.31 දක්වා භෞතික ප්‍රගතිය
පොල් මෝල් සංවර්ධන අරමුදලින් දිසිදි පොල් නිෂ්පාදන ආයතන සංවර්ධනය සඳහා මූල්‍ය පහසුකම් සැලසීම	2021 වර්ෂය සඳහා දිසිදි පොල් නිෂ්පාදිත 25,225 Mt සඳහා රු. මිලියන 6.0ක් එක් එක් දිසිදි පොල් මෝල් සංවර්ධන ගිණුම් සඳහා බැර කිරීම.
මූල්‍ය සහන සඳහා බැංකු ණය පහසුකම් සලසා දීම	2021 වර්ෂය සඳහා කර්මාන්තකරුවන් 54 දෙනෙකු වෙත ණය ප්‍රතිපාදන ලබා දීම සඳහා රු. මිලියන 1.15 ක් වැය කර ඇත.
තත්ත්වයෙන් උසස් පොල්තෙල් වෙළඳපොලට හඳුන්වා දීමේ ක්‍රියාවලිය ස්ථාපනය කිරීම	උසස් තත්ත්වයෙන් යුතු ඇසුරුම් සහිත පොල්තෙල් දේශීය වෙළඳපොළට හඳුන්වා දීම යටතේ පොල්තෙල් නියැදි 172ක් පරීක්ෂා කරන ලදී. පොල්තෙල් කර්මාන්තයේ වියලුම් ක්‍රමවේදය සංවර්ධනය කිරීම සඳහා ආයතන 34ක් වෙත වියලුම් යන්ත්‍ර ලබා ගැනීම වෙනුවෙන් ආයෝජන සහය ලබාදෙන ලද අතර, ලාංඡනය ලබා දීමේ වැඩසටහන යටතේ, ආයතන පරීක්ෂාව සිදුකරන ලදී. මේ සඳහා රු: මිලියන 20.5ක් වැය කර ඇත. 2021 වර්ෂයේදී ආයතන 07කට ලාංඡනය ලබා දෙන ලදී.
(අ) කොහු කර්මාන්තකරුවන් සඳහා GMP සහතික කරණය ලබා ගැනීමට මූල්‍ය සහන ලබා දීම. (ආ) කොහු නිෂ්පාදන ආයතන සඳහා කොහු වේලන පිටි සකස් කර ගැනීම සඳහා මූල්‍ය සහන ලබා දීම	(අ) 2021 වර්ෂයෙදී කොහු කර්මන්තකරුවන් දෙදෙනෙකු සඳහා GMP සහතිකරණය ලබා ගැනීමට මූල්‍ය සහන ලබා දීම හා දැනුවත් කිරීමේ වැඩසටහන් 04ක් සඳහා රු. මිලි 0.3ක් වැය කරන ලදී. (ආ) කොහු කර්මාන්තය සංවර්ධනය කිරීම පිණිස කොහු වියලීම සඳහා වියලුම් පිටි 43ක් ලබාදෙන ලදී. මේ සඳහා රු. මිලියන 17.23ක් වැයවී ඇත.
(අ) පොල් ආශ්‍රිත කර්මාන්තයන්හි තත්ත්වය උසස් කර ලීම සඳහා සම්පත් දායකත්වය ලබා දීමේ අරමුණින් පොල් සංවර්ධන අධිකාරියේ නිලධාරීන් හට පුහුණු වැඩසටහන් ක්‍රියාත්මක කිරීම (ආ) සැකසුම් සංවර්ධන අංශය වෙත ISO 17020:2012 ප්‍රතිතන සහතිකය ලබා ගැනීම සම්බන්ධ විගණන කටයුතු සිදු කිරීම.	(අ) සැකසුම් සංවර්ධන අංශයේ නිලධාරීන් පුහුණු වැඩසටහන් වෙත යොමු කිරීම සඳහා රු. මිලියන 2.31ක් වැය කර ඇත. (ආ) දිසිදි නිෂ්පාදන ආයතන පරීක්ෂාව සඳහා ISO 17020:2012 ප්‍රතිතන සහතිකය ලබා ගැනීම. සහතිකය ලබා ගැනීමෙන් අනතුරුව පැවති දෙවන විගණන කටයුතු සැප්තැම්බර් මස පවත්වන ලදී.
දෛනික නිෂ්පාදන ආදර්ශ විශ්ලේෂණයට යොමු කිරීම සහ විශ්ලේෂණ වාර්තා යොමු කිරීම/ දිසිදි පොල් නිෂ්පාදන අපනයනකරුවන් විසින් සිදු කරන ලද ඉල්ලීම් පරීදි, දත්ත හා තොරතුරු පරීක්ෂා කිරීමෙන් අනතුරුව අදාළ සහතික නිකුත් කිරීම නිෂ්පාදන ලියාපදිංචි කිරීම. ආයතන පරීක්ෂා කිරීම.	දෛනික දිසිදි ආදර්ශ ලැබීම් - 7,749 භෞතික තත්ත්ව සහතික, සැල්මොනෙල්ලා රහිත සහතික, ඇෆ්ලටෝක්සින් රහිත සහතික, සල්ෆර් ඩයොක්සයිඩ් රහිත සහතික හා අනෙකුත් අපනයන සහතික 1530 නිෂ්පාදන 1170ක් ලියාපදිංචි කිරීම. ආයතන පරීක්ෂා කිරීම් 10,000ක් පමණ සිදු කිරීම.
අවිධිමත් කර්මාන්තය සංවර්ධනය කිරීම පිණිස දැනුවත් කිරීමේ/ පුහුණු වැඩසටහන් සංවිධානය කිරීම.	පුහුණු වැඩසටහන් 19ක් පවත්වා ඇත. වැයවන ලද මුදල රු. මිලියන 2.14
පොල්කටු අඟුරු නිෂ්පාදන ක්‍රමවේදය සංවර්ධනය කිරීම සඳහා ආයෝජන සහය ලබාදීම.	පොල්කටු දහන උඳුන් ලබා දීමේ වැඩසටහන යටතේ ලියාපදිංචි ආයතන 12 කට ආයෝජන සහය ලබා දී ඇත. රු. මිලියන 1.33
අවිධිමත් කර්මාන්තයේ නියැලෙන පිරිස් වෙත නිෂ්පාදන ඒකක පිහිටුවීම.	2021 වර්ෂය අවසාන වන විට නිෂ්පාදන ඒකක 08ක් පිහිටුවීමට හැකියාව ලැබී ඇත. ඒ සඳහා රු. මිලියන 5.48ක මුදලක් වැය කර ඇත.

අලෙවි සංවර්ධන හා පර්යේෂණ අංශය

ක්‍රියාකාරකම	ඒකකය	2021.12.31 දක්වා ප්‍රගතිය
පොල් හා පොල් ආශ්‍රිත අපනයනකරුවන් ලියාපදිංචි කිරීම	අපනයනකරුවන්	704
පොල් වතු ලියාපදිංචිය	පොල් වතු	99
වෙන්දේසි සඳහා අවශ්‍ය තැරැව්කරුවන් ලියාපදිංචිය	තැරැව්කරුවන්	17
පොල්/ කොප්පරා ගැණුම්කරුවන් ලියාපදිංචිය	ගැණුම්කරුවන්	31
තාවකාලික අපනයන බලපත්‍ර නිකුත් කිරීමට කටයුතු කිරීම ASYCUDA පද්ධතිය හරහා අනුමැතීන් ලබාදීම	බලපත්‍ර අනුමැතීන්	3379 29998
දෛනික වාර්තා නිකුත් කිරීම	වාර්තා	233
සති වාර්තා නිකුත් කිරීම	වාර්තා	48
මාසික වාර්තා නිකුත් කිරීම	වාර්තා	12
වාර්ෂික වාර්තා නිකුත් කිරීම	වාර්තා	1
කොළඹ පොල් වෙන්දේසිය පැවැත්වීම	වෙන්දේසි	33
දැන්වීම් පුවරු ස්ථාපනය කිරීම	දැන්වීම් පුවරු	3
දේශීය ප්‍රදර්ශන සඳහා සහභාගී වීම	වෙළඳ ප්‍රදර්ශන	3
පොල් නාස්තිය අවම කිරීමේ අරමුණින් පොල් කිරි නිෂ්පාදන භාවිතය ප්‍රවර්ධනය, පොල් කටු හා ලෙලි එකතු කිරීම පිළිබඳව දැනුවත් කිරීම	ගුවන් විදුලි වැඩසටහන්/වාර ගනන	1890
පොල් නාස්තිය අවම කිරීමේ අරමුණින් පොල් කිරි නිෂ්පාදන භාවිතය ප්‍රවර්ධනය, පොල් කටු හා ලෙලි එකතු කිරීම පිළිබඳව දැනුවත් කිරීම	සිංහල සහ දෙමළ පුවත්පත්වල දැන්වීම් පළකිරීම	18
ඉදිරියේදී පොල් ආශ්‍රිත නිෂ්පාදන සම්බන්ධයෙන් ජනතාව දැනුවත් කිරීමට අවශ්‍ය වන රූපවාහිනී වැඩසටහන්, වාර්තාමය වැඩසටහන් සකස් කිරීම	වැඩසටහන්	31
සමාජ මාධ්‍ය හරහා පොල් කර්මාන්තයේ ශ්‍රී ලංකා ආර්ථිකයට ඇති වැදගත්කම සහ පොල් ආශ්‍රිත නිෂ්පාදනවල ඇති වැදගත්කම පිළිබඳ ජනතාව දැනුවත් කිරීම	දැන්වීම්	25
ජාත්‍යන්තර පොල් දිනය නිමිති කොටගෙන Zoom තාක්ෂණය ඔස්සේ දැනුවත් කිරීමේ වැඩ සටහනක් පවත්වන ලදි.	ප්‍රවර්ධන වැඩසටහන්	1
විදේශීය අපනයන ප්‍රවර්ධන වැඩසටහන් සඳහා සම්බන්ධ වීම - ජපානයේ ශ්‍රී ලංකා තානාපති කාර්යාලය සමග සම්බන්ධ වීමෙන් පොල් මද ආශ්‍රිත නිෂ්පාදන ප්‍රදර්ශනය කිරීම	විදේශීය ප්‍රදර්ශන	1
ජාත්‍යන්තර අලෙවි ප්‍රවර්ධන වැඩ සටහන් සඳහා අවශ්‍ය වන ප්‍රවර්ධන පත්‍රිකාවක් නිර්මාණය කිරීම	අලෙවි ප්‍රවර්ධන මෙවලම්	කෙටුම්පත සකස් කර ඇත
වෙබ් අඩවිය හරහා පොල් ආශ්‍රිත නිෂ්පාදන අපනයන/ආනයන සහ අත්‍යාවශ්‍ය තොරතුරු ලබාදීම	වෙබ් අඩවිය යාවත්කාලීන කිරීම්	අවශ්‍ය අවස්ථාවලදී යාවත්කාලීන කර ඇත-අවම වශයෙන් සතියකට දෙවරක්
ලැබෙන වෙළඳ විමසුම් මගින් විදේශීය ගැණුම්කරුවන් හා දේශීය නිෂ්පාදකයින් අතර සම්බන්ධතා ඇති කිරීම	වෙළඳ විමසුම්	73
පොල් / කොප්පරා වෙන්දේසි සම්බන්ධව ඇති වන ආරවුල් සමථයකට පත් කිරීම	බෙරුම්කාර සැසි	8
පොල් නිෂ්පාදන අපනයනය කිරීමේදී ඇතිවන ආරවුල් සමථයකට පත් කිරීම	බෙරුම්කාර සැසි	6
වෙළඳපළ සමීක්ෂණය / පර්යේෂණ පැවැත්වීම	ආදර්ශ/පර්යේෂණ පත්‍රිකා	තොරතුරු රැස් කරන ලදි





2021 වර්ෂයේ ඔක්තෝම්බර් මස **6 – 8** දක්වා ජපානයේ පැවැත්වූ **Health Ingredients – Japan** ප්‍රදර්ශනය සඳහා ජපානයේ ශ්‍රී ලංකා තානාපති කාර්යාලයේ සහාය ඇතිව පොල් මද ආශ්‍රිත නිෂ්පාදන ප්‍රදර්ශනය කිරීම







පොල් කර්මාන්තයේ ප්‍රගතිය, ඉදිරිදැක්ම පිළිබඳව මහජනතාව දැනුවත්කිරීම සඳහා ගුවන් විදුලි සම්මුඛ සාකච්ඡා පොල් දිනයට සමගාමීව පවත්වන ලදි



2021 ලෝක පොල් දිනයට සමගාමීව **Zoom** තාක්ෂණය ඔස්සේ පැවති දැනුවත් කිරීමේ වැඩසටහන





පොල් කොහු කෙඳි නිෂ්පාදනායතනවල යටිතල පහසුකම් සංවර්ධනය සඳහා ආයෝජන සහය ලබා දීම.





2021 වර්ෂයේ පවත්වන ලද පුහුණු වැඩසටහන්





2021 වර්ෂයේ දැනුවත් කිරීමේ වැඩසටහන්

2021 වර්ෂයේ පිහිටුවන ලද නිෂ්පාදන ඒකක

පොල් සංවර්ධන අධිකාරිය - **2021.12.31** දිනට සමස්ත මූල්‍ය ප්‍රගතිය

අයිතමය	අනුමත ප්‍රතිපාදන (රු.මිලි) 2021.12.31	2020.12.31 දක්වා මූල්‍ය ඉලක්කය	මූල්‍ය ප්‍රගතිය			
			මුදල (රු.මිලි)	අනුමත මුදලට %	ඉලක්කයට %	අක් මුදල් ලැබීමට %
ප්‍රාග්ධන	110	7	7	6.3%	100%	100%
පුනරාවර්තන	190	134.5	7	71%	100%	100%

2.1.4.1.3 පොල් පර්යේෂණ ආයතනය

දැක්ම

"පොල් ආශ්‍රිත පර්යේෂණ සිදු කිරීම, තාක්ෂණ සංවර්ධනය හා තාක්ෂණ හුවමාරුව සම්බන්ධයෙන් කලාපයේ ඇති විශිෂ්ඨතම ආයතනය වීම"

මෙහෙවර

"පර්යේෂණයන්හි විශිෂ්ඨත්වය තුළින් පොල් ආශ්‍රිත නිෂ්පාදිතාවය හා ලාභදායිත්වය වැඩි දියුණු කිරීම සඳහා අවශ්‍ය දැනුම හා තාක්ෂණය බිහි කිරීම"

පොල් පර්යේෂණ ආයතනය (CRI) යනු 1929 අංක 24 දරණ පොල් පර්යේෂණ ආඥා පනත යටතේ පොල් පර්යේෂණ යෝජනා ක්‍රමය ලෙස ආරම්භ කරන ලද ජාතික ආයතනයකි. මෙම යෝජනා ක්‍රමය, එහි මූලස්ථානය ලුණුවිල (වයඹ පළාතේ) බන්දිරිප්පුව වතුයායේ පිහිටුවා පර්යේෂණ කටයුතු ආරම්භ කරන ලදී. පොල් වගා කිරීම පිළිබඳ තාක්ෂණික තොරතුරු සමඟ පොල් වගාකරුවන්ට සහාය වීම සඳහා ජාන විද්‍යාව, රසායන විද්‍යාව සහ පාංශු රසායන විද්‍යාව යන තාක්ෂණික අංශ තුන ද සහිතව 1950 දී අංක 37 පොල් පර්යේෂණ පනත බලාත්මක කිරීමෙන් පසුව එය ලංකාවේ පොල් පර්යේෂණ ආයතනය (CRI) ලෙස නම් කරන ලදී. එය ආරම්භ වූ දා සිට ශ්‍රී ලංකාවේ පොල් පිළිබඳ සියලු විද්‍යාත්මක පර්යේෂණ කේන්ද්‍රගත වූ අතර පොල් පර්යේෂණ සඳහා ජාතික මෙන්ම ජාත්‍යන්තර කීර්තියක් ද ලබා ගත්තේය. 1971 දී ප්‍රකාශයට පත් කරන ලද අංක 46 පොල් සංවර්ධන පනත යටතේ, පොල් පර්යේෂණ ආයතනයෙහි කළමනාකරණ මණ්ඩලය ලෙස කටයුතු කිරීම සඳහා පොල් පර්යේෂණ මණ්ඩලය 1972 දී පිහිටුවන ලදී.

පොල් පර්යේෂණ ආයතනය එහි පර්යේෂණ සංවර්ධනයට සහාය වීම සඳහා නවීන විශ්ලේෂණ පහසුකම් සහිතව ගතික, උද්යෝගීමත්ව කටයුතු කරන නවීන විද්‍යාඥයන්, සුදුසුකම් ලත් තාක්ෂණික කාර්ය මණ්ඩලයක් සහ ද්‍රව්‍යමය සම්පත් සහිත ආයතනයකි. මෙම ආයතනය වෙනත් ජාතික ආයතන සහ පෞද්ගලික අංශයේ සංවිධාන සමඟ සහයෝගීව පර්යේෂණ ප්‍රවර්ධනය කරයි. ආයතනය පර්යේෂණ අංශ නවයකින් සහ සේවා අංශ පහකින් යුක්ත වේ.

2021 වර්ෂයේදී පොල් පර්යේෂණ ආයතනය විසින් ක්‍රියාත්මක කරන ලද ව්‍යාපෘතිවල මූල්‍ය හා භෞතික ප්‍රගතිය

නව පොල් ප්‍රභේදයක් හඳුන්වාදීම හා බීජ පොල් නිෂ්පාදනය

- ✓ වැඩි පොල් ඵලදාවක් ලබාදෙන සහ ඉක්මණින් පීදෙන නව දෙමුහුම් පොල් ප්‍රභේදයක් CRISL 2020 (ශ්‍රී ලංකා උස x මලයානු රතු කුන්දිරා) 2020 හඳුන්වා දුන් අතර, 2021 වසරේදී සහතික කරන ලද පැල 753ක් වගාකරුවන්ට නිකුත් කරන ලදී.
- ✓ පාලිත පරාගණය සහ අත් පරාගණය යොදා ගනිමින් ජානමය වශයෙන් උසස් දෙමුහුම් බීජ පොල්, CRIC 60 187,597 ක්, CRIC 65 28,145 ක් CRISL 98 10,888ක්, කප්සුවය 3,064 ක්, කප්සෙත 1,908 ක් සහ කප්රුවන 3,978 බීජ උද්‍යාන තුනක නිෂ්පාදනය කරන ලදී.
- ✓ කප්රුවන දෙමුහුම් බීජ නිෂ්පාදනය සඳහා හලාවත වැවිලි සමාගම සමඟ එක්ව කිණියම බීජ උද්‍යානයේ කොළ කුන්දිරා සහ සැන්රාමන් පැල සිටුවන ලදී.
- ✓ කප් සුවය දෙමුහුම් පොල් ප්‍රභේදය නිෂ්පාදනය කිරීම සඳහා කුරුණෑගල වැවිලි සමාගම සමඟ එක්ව නව බීජ උද්‍යානයක් ආරම්භ කිරීම සඳහා අවබෝධතා ගිවිසුමක් අත්සන් කරන ලදී. නව බීජ උද්‍යානය වටා වැට ඉදිකිරීම සහ වාරිමාර්ග පද්ධතිය ස්ථාපනය කරන ලදී. පැල 650ක් සිටුවීම සඳහා මූලික බිම් සැකසීම සිදුකරන ලදී. වර්ෂාව හේතුවෙන් පැල සිටුවීම සිදුකළ නොහැකි විය.

වැඩි ඵලදාවක් දෙන ඉක්මණින් පීදෙන පොල් ප්‍රභේද වගාකරුවන් වෙත හඳුන්වා දීම



Tall x Brazilian Green dwarf වර්ග ප්‍රභේදය

දේශගුණික විපර්යාසයන්ට අනුවර්තනය වීම/ නව ශෂ්‍ය විද්‍යාත්මක ක්‍රම භාවිතය

- ✓ නාගරික අපද්‍රව්‍යවලින් පිළියෙල කරනු ලබන කොම්පෝස්ට්වල බැර ලෝහ ප්‍රතිශතය අධ්‍යයනය කරන ලදී.එම අගයන් අනුමත සම්මත අගයන්ට වඩා අඩු බව දක්නට ලැබිණි. කෙසේ නමුත් එය පොල් වගා කරන පස වැඩි දියුණු කිරීමේ කාබනික කාබන් ප්‍රභවයක් ලෙස නිර්දේශ කළ හැක.
- ✓ පොල් වගා කරන පසෙහි පාංශු පෝෂක භාවිතාවේ කාර්යක්ෂමතාවය වැඩි කිරීමට, තෙතමනය රඳවාගැනීම වැඩි කිරීමටත් සහ ක්ෂුද්‍රජීවී ක්‍රියාකාරීත්වය වැඩි කිරීමට හා පාංශු අවස්ථාපන ද්‍රව්‍ය ලෙස කාබනීකෘත ශාක ද්‍රව්‍ය (Bio char) යොදාගැනීමට අන්තර් නිර්දේශයන් නිකුත් කරන ලදී. කාබනීකෘත ශාක ද්‍රව්‍ය සෑදීමට යොදාගන්නා ඒකකය මේ වන විට පොල් පර්යේෂණ ආයතනයේ උප පර්යේෂණ මධ්‍යස්ථානයක ස්ථාපනය කර ඇත.
- ✓ රජයේ නව පොහොර ප්‍රතිපත්තියට අදාළව පොල් වගාව සඳහා විවිධ කාබනික ප්‍රභවයන් ඇතුලත් කාබනික පොහොර පැකේජයක් හඳුන්වා දෙන ලදී. මෙය පොල් පර්යේෂණ ආයතනය විසින් මීට පෙර හඳුන්වා දී තිබූ අකාබනික, කාබනික සහ කාබනික+අකාබනික පොහොර නිර්දේශවලට අමතර නිර්දේශයකි.

කාබනීකෘත ද්‍රව්‍යය (ජීව අඟුරු) භාවිතය පිළිබඳව අධ්‍යයනය

පොල් පර්යේෂණ ආයතනයට අයත් රත්මලාගාර උප මධ්‍යස්ථානය තුළ අක්කර 5ක භූමියක පොල් පැළ වගාව සඳහා පාංශු තෙතමන සංරක්ෂණ උපක්‍රමයක් ලෙස කාබනීකෘත ද්‍රව්‍යය (ජීව අඟුරු) භාවිතය පිළිබඳව අධ්‍යයනය සඳහා ක්ෂේත්‍ර පර්යේෂණයක් ආරම්භ කරන ලදී.



ජීව අඟුරු භාවිතය

පළිබෝධ සහ රෝග පාලනය

- ✓ රතු කුරුමිණි මර්දනය සඳහා ෆෙරමෝන නල 595ක් සහ පෙල් ෆෙරමෝන 50ක් වගාකරුවන්ට නිකුත් කරන ලදී.
- ✓ වැලිගම පොල් කොළ මැළවීමේ රෝගය දකුණු පළාතෙන් අනෙකුත් ප්‍රදේශවලට පැතිරීම වැළැක්වීම සඳහා ''ආරක්ෂිත කලාපයක්'' පවත්වාගෙන යාම සිදුකරන ලදී. මෙම ආරක්ෂිත කලාපයේ ඉඩම් 9,839 ක් පරීක්ෂා කර රෝගී ගස් 694 ක් හඳුනාගත් අතර, එයින් 225 ක් ඉවත් කරන ලදී.
- ✓ පොල් දළඹුවාගේ පැතිරීම (පුත්තලම සහ කුරුණෑගල දිස්ත්‍රික්ක), පළහැටියාගේ පැතිරීම (කුරුණෑගල සහ කෑගල්ල දිස්ත්‍රික්ක) සහ සුදු මැස්සාගේ හානිය (කෑගල්ල, නුවර, ගම්පහ සහ කුරුණෑගල දිස්ත්‍රික්ක) පාලනය කිරීමට පොල් වගාකිරීමේ මණ්ඩලය හා එක්ව වැඩසටහනක් ක්‍රියාත්මක කරන ලදී. පොල් දළඹුවාගේ පැතිරීම පාලනය සම්පූර්ණයෙන්ම පාහේ ජෛව විද්‍යාත්මක ක්‍රම මඟින් සිදුකරන ලදී.

පොල් ආශ්‍රිත නිෂ්පාදන දිරි ගැන්වීම හා තාක්ෂණය ව්‍යාප්ත කිරීම

- ✓ පැසවීම මඟින් නැවුම් පොල් තෙල් නිෂ්පාදනය වැඩිදියුණු කරන ලදී.
- ✓ අගය එකතු කළ පොල් මදය ආශ්‍රිත නිෂ්පාදනයක් ලෙස පොල් බටර් විසිරුමක් (Coconut Butter Spread) නිෂ්පාදනය කරන ලදී.
- ✓ පොල් පිටි හා තිරිඟු පිටි අඩංගු ආහාර, සෞඛ්‍යාරක්ෂිත ආහාර ලෙස වැඩි දියුණු කරන ලදී.
- ✓ පොල් ප්‍රෝටීන වියෝජක මඟින් ජෛවභායනය වන (ජෛවීය ලෙස ජීර්ණය වන) ඇසුරුමක් නිෂ්පාදනය කරන ලදී.
- ✓ සාම්ප්‍රදායික ලෙස රෑස් කරගන්නා ලද පොල් මී රාවලින් නිෂ්පාදනය කළ පොල් හකුරුවල ග්ලයිසමික් අගය නිර්ණය කරන ලදී.
- ✓ මේදහරණය කරන ලද පොල් කුරුටු පිටි එකතු කළ ආහාර වර්ග (රොටි, පිට්ටු) වැඩිදියුණු කරන ලදී.
- ✓ පොල් කුරුටු පිටි වල ෆීනොලික හා ෆ්ලේවනොයිඩ සංයුතිය නිර්ණය කරන ලදී.
- ✓ සුළු හා මධ්‍යස්ථ ඇල්සයිමර් රෝගයට ප්‍රතිකාර සඳහා නැවුම් පොල් තෙල්වල බලපෑම පරීක්ෂා කරන ලදී.
- ✓ දියවැඩියා රෝගයෙන් පෙළෙන හා දියවැඩියා රෝගය නොමැති මීයන්ට සුදු පොල් තෙල් හෝ සෝයා තෙල් ආහාරයට දීමෙන් එමගින් ඇතිවන ග්ලූකෝස් tolerance බලපෑම නිර්ණය කිරීම සඳහා අධ්‍යයනක් සිදුකරන ලදී.
- ✓ රබර් කිරි හා පොල් කොහු මිශ්‍රිත කුෂන් හා මෙට්ට නිෂ්පාදනය කිරීමේ හැකියාවන් සෙවීමට අධ්‍යයනක් සිදුකරන ලදී.
- ✓ පොල් ලෙලි පෙහවීමේ තාක්ෂණය දියුණු කිරීම සඳහා අධ්‍යයනයක් සිදු කරන ලදී.
- ✓ රබර් සපත්තු නිපදවීම සඳහා පොල් කෙඳි අමුද්‍රව්‍යයක් වශයෙන් යොදා ගැනීම පිළිබඳව අධ්‍යයනයක් සිදුකරන ලදී.



පොල් බටර් විසිරුම

තාක්ෂණික හුවමාරු ක්‍රියාකාරකම්

- ✓ නව පර්යේෂණ ක්ෂේත්‍රයන් හඳුනා ගැනීම, පොල් පර්යේෂණ ආයතනයේ නිර්දේශයන් පිළිබඳ වගාකරුවන්ගේ අදහස් හඳුනාගැනීම සහ පොල් සංවර්ධන නිලධාරීන් පුහුණු කිරීමේ සහ තාක්ෂණික දැනුම යාවත්කාලීන කිරීමේ අරමුණින් ද්විමාර්ග සංනිවේදන ක්‍රමයක් ලෙස පොල් පර්යේෂණ ආයතනයේ පර්යේෂණ නිලධාරීන් හා පොල් සංවර්ධන නිලධාරීන් අතර, පර්යේෂණ ව්‍යාප්ති සංවාද (Research extension dialogues) 3ක් පවත්වන ලදී.
- ✓ වගාකරුවන්ට සහ සිසුන්ට දැනුම බෙදා හැරීම සඳහා තාක්ෂණ උද්‍යාන සංවර්ධනය කළ අතර, වගාකරුවන්ට දැනුම සම්ප්‍රේෂණය කිරීම සඳහා මධ්‍යස්ථානයක් (crop clinic) එම ස්ථානයේ පවත්වා ගෙනයාම සිදු කරන ලදී.
- ✓ පොල් වගාව කළමනාකරණය පිළිබඳ 3වන අන්තර්ජාතික සහතික පත්‍ර පාඨමාලාව සාර්ථකව අවසන් කරන ලදී.
- ✓ පොල් වගාව සම්බන්ධ විවිධ මාතෘකා ඔස්සේ අත්පත්‍රිකා 81250ක් පුවත්පත් සමඟ බෙදා හරින ලදී.
- ✓ 'සුභාරති' වැඩසටහන් 4කට සහ 'ගොවිතැනට පැයක් ' වැඩසටහනට සහභාගී වන ලදී.
- ✓ පොල් වගාව පිළිබඳව ගුවන් විදුලි දැන්වීම් 620ක් සහ රූපවාහිනී දැන්වීමක් ප්‍රචාරය කරන ලදී.
- ✓ සෞභාග්‍යයේ කප්රුක වැඩසටහන් 2ක් ස්වාධීන රූපවාහිනිය සහ ජාතික රූපවාහිනිය මඟින් ප්‍රචාරය කරන ලදී.

ප්‍රතිපත්ති නිර්දේශයන් සකස් කිරීමට අවශ්‍ය වාර්තා පිළියෙල කිරීම

- ✓ පොල් තෙල් සහ පාම් තෙල්වල විශේෂ භාණ්ඩ බද්ද වෙනස් කිරීම සඳහා නිර්දේශ ඉදිරිපත් කරන ලදී.
- ✓ පොල් කර්මාන්තය සඳහා වන පොහොර අවශ්‍යතාවය පිලිබඳ වාර්තා ප්‍රතිපත්ති සම්පාදකයින් හට ඉදිරිපත් කරන ලදී.
- ✓ වැවිලි අමාත්‍යාංශය, ජනලේඛණ හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුව, මහා භාණ්ඩාගාරය, මහා බැංකුව සහ වගාකරුවන්ට පොල් ආශ්‍රිත සංඛ්‍යාලේඛන සැපයීම සිදුකරන ලදී.
- ✓ විවිධ අමාත්‍යාංශ සහ වගාකරුවන්ගේ ඉල්ලීම මත පොල් පිලිබඳ තක්සේරු වාර්තා ඉදිරිපත් කරන ලදී.

පොල් ඵලදාව පුරෝකථනය කිරීම හා ජාතික පොල් නිෂ්පාදනය ඇස්තමේන්තු කිරීම

- ✓ 2021 වසර සඳහා පුරෝකථනය කළ පොල් ඵලදාව ගෙඩි මිලියන 3353.1 ± 29.3 විය. මාස 8 කට පෙර පුරෝකථනය ගණනය කරන ලද අතර, සියළු පොල් වගා කරන දිස්ත්‍රික්කවල තෝරාගත් වතු නියදිවලින් ද්වි මාසිකව ලබා ගන්නා දත්ත මඟින් සත්‍ය පොල් නිෂ්පාදනය ඇස්තමේන්තු කරනු ලැබේ. 2021 වසරේ ගෙඩි මිලියන 3389ක් නිෂ්පාදනය කළ අතර එය ජාතික පොල් නිෂ්පාදන පුරෝකථනයෙන් 1%ක වෙනස් වීමකි.. 2022 පළමු මාස 6 සඳහා පුරෝකථනය කළ පොල් ඵලදාව ගෙඩි මිලියන 510.6(ජනවාරි-පෙබරවාරි); 503 (මාර්තු-අප්‍රේල්)සහ 603(මැයි -ජුනි) වේ. මේ අනුව 2022 පළමු මාස 6 තුළ ගෙඩි මිලියන 1677ක් බලාපොරොත්තු වේ.

පොල් කර්මාන්තය වෙනුවෙන් ලබාදෙන සේවාවන්

- ✓ විලෝපික මයිටා අභිජනන රසායනාගාර පවත්වා ගෙන යාම සහ මයිටා අඩංගු ඇසුරුම් 30,398 ක් නිෂ්පාදනය කිරීම.
- ✓ පොල් දළඹුවා පාලනය කිරීම සඳහා පරපෝෂිතයන් 634,790 ක් නිපදවීම.
- ✓ රතු කුරුමිණි පාලනය සඳහා රතු කුරුමිණි ෆෙරමෝන් අඩංගු ඇසුරුම් 595 ක් සහ රතු කුරුමිණි ජෙල් ෆෙරමෝන් ඇසුරුම් 50 ක් නිෂ්පාදනය කර සැපයීම.
- ✓ තැඹිළි අපනයනය කිරීම සඳහා කල් තබාගැනීමට අනුගමනය කළ යුතු ක්‍රියා පිළිවෙල පිළිබඳව තාක්ෂණික දැනුම නව ව්‍යාවසායකයින් 40 දෙනෙකුට ලබා දීම.
- ✓ වගාකරුවන් 16 දෙනෙකු සඳහා පාංශු යෝග්‍යතා නිර්දේශ නිකුත් කිරීම.
- ✓ නිකුත් කරන ලද විශ්ලේෂණ වාර්ථා : කොහු පදනම් කර ගත් නිෂ්පාදන සඳහා අපනයන සහතික 241 ක්, අකාබනික පොහොරවල ගුණාත්මකභාවය පිළිබඳ වාර්ථා 15ක්, කාබනික පොහොර / කොම්පෝස්ට්වල ගුණාත්මකභාවය පිළිබඳ වාර්තා 15 ක් සහ පොල් වගාවන් සඳහා පොහොර නිර්දේශ (DFR s) පිළිබඳ වාර්තා 19 ක් නිකුත් කිරීම.
- ✓ නිකුත් කරන ලද තත්ත්ව සහතික වාර්තා : නැවුම් පොල්තෙල් වාර්තා 29ක්, සුදු පොල්තෙල් වාර්තා 29ක්, දිසිදි පොල් වාර්තා 17ක්, පුන්නක්කු වාර්තා 5ක්, ගාන ලද පොල් වාර්තා 5ක්, වයින් වාර්තා 1 ක්, විනාකිරි වාර්තා 2ක් සහ පොල් රා වාර්තා 493ක් නිකුත් කිරීම.





ප්‍රශස්ථ ව්‍යාපාර පහසුකම්” සලසන මධ්‍යස්ථානය

පොල් ආශ්‍රිත නිෂ්පාදන පිළිබඳව උනන්දුවක් දක්වන ව්‍යවසායකයින් සඳහා “ප්‍රශස්ථ ව්‍යාපාර පහසුකම්” සලසන මධ්‍යස්ථානයක් ආරම්භ කෙරිණි. මෙම මධ්‍යස්ථානය ගරු වැවිලි අමාත්‍යවරයා විසින් ජාත්‍යන්තර පොල් වගා දිනයට සමගාමීව 2020 සැප්තැම්බර් මස 02 දින විවෘත කරන ලදී. මේ වන විට මෙහි වැඩමුළු දෙකක් පවත්වා ඇත.



ප්‍රශස්ථ ව්‍යාපාර පහසුකම්” මධ්‍යස්ථානය

පොල් වගාව ප්‍රවර්ධනය සඳහා ක්‍රියාත්මක කරනු ලබන අනෙකුත් විශේෂිත වැඩසටහන්/ව්‍යාපෘති/ ක්‍රියාකාරකම් - පොල් පර්යේෂණ ආයතනය

පොල් දළඹුවා පැතිරීම පාලනය කිරීම.

පුත්තලම හා කුරුණෑගල යන දිස්ත්‍රික්කවලින් තදබල පොල් දළඹු පැතිරීමක් වාර්තා වූ අතර, ගම්පහ ,කොළඹ, මොණරාගල හා අම්පාර දිස්ත්‍රික්කවලින් සුලු හානියක් වාර්තා විය. පොල් පර්යේෂණ ආයතනයේ හා පොල් වගා කිරීමේ මණ්ඩලයේ කීටාගාරවල බෝ කරන ලද පරපෝෂිතයින් මුදා හරිමින්, සුළු හානි පාලනය කරන ලදී. 2021 වසර තුළ, පොල් පර්යේෂණ ආයතනය විසින් පරපෝෂිතයින් 634,790 ක් ක්ෂේත්‍රයට නිදහස් කර ඇත. පොල් පර්යේෂණ ආයතනය යටතේ පාලනය වන කීටාගාරයේ ධාරිතාව වැඩි කිරීම සඳහා කටයුතු කරන ලදී.



පොල් දළඹු ගහනය ගණනය කිරීම

සුදු මැස්සාගේ හානිය පාලනය කිරීම.

2019 වසරේදී ප්‍රථම වරට වාර්තා වූ සුදු මැස්සාගේ හානිය 2021 වසර පුරාම ගම්පහ සහ කොළඹ දිස්ත්‍රික්කවලින් වැඩි වශයෙන් වාර්තා විය. මර්දනය සඳහා කෘමිනාශක 3ක් නිර්දේශ කළ අතර සුදු මැස්සන් විශේෂ 3ක් හඳුනා ගන්නා ලදී.



කොළඹ ප්‍රදේශයේ පොල්වල සහ අතුවල දැඩි ලෙස ආසාදනය වී ඇති සුදු මැස්සන්

තැඹිලි අපනයනය පිළිබඳව තාක්ෂණය ප්‍රචලිත කිරීම

පොල් පර්යේෂණ ආයතනයේ විද්‍යාඥයින් දෙරණ රූපවාහිනී සහ ස්වාධීන රූපවාහිනී නාලිකාවල පැවති රූපවාහිනී වැඩසටහන්වලට සහභාගි වී එමඟින් තැඹිලි අපනයනය සහ අනෙකුත් පොල් ආශ්‍රිත නිෂ්පාදන අපනයනය පිළිබඳව දැනුවත් කිරීම සිදු කරන ලදී. නව ව්‍යවසායකයින් 40ක් පොල් පර්යේෂණ ආයතනයෙන් තැඹිලි අපනයනය පිළිබඳව තාක්ෂණය ලබා ගෙන ඇත.

වැලිගම පොල් කොළ මැලවීමේ රෝගය පාලනයට නව අධ්‍යයන

වැලිගම පොල් කොළ මැලවීමේ රෝගය පාලනය සඳහා එයට ප්‍රතිරෝධීතාවය ඇති කරවන රසායන ද්‍රව්‍ය භාවිතය පිළිබඳව අධ්‍යයනයක් අරඹන ලදී.

පොල් පර්යේෂණ ආයතනය - 2021.12.31 දිනට මූල්‍ය ප්‍රගතිය (රුපියල් මිලියන)

	ප්‍රතිපාදන	ලැබීම්	මූල්‍ය ප්‍රගතිය	අතැති බිල්
ප්‍රාග්ධන	70	70	100%	--
පුනරාවර්තන	287	257.3	92%	-

2.1.5 පොල් ක්ෂේත්‍රය -අයවැය මඟින් වෙන් වූ ප්‍රතිපාදන යටතේ සංවර්ධන ව්‍යාපෘතීන්හි ප්‍රගතිය

2021.12.31 දිනට මූල්‍ය ප්‍රගතිය සාරාංශය

අනු අංකය	ව්‍යාපෘතිය	2021 මූල්‍ය ඉලක්කය (රු.මි)	2021 .12.31 දිනට සංශෝධිත වාර්ෂික ඉලක්කය (රු.මි)	මූල්‍ය ප්‍රගතිය (රු.මි)	අතැති බිල්
01	ශ්‍රී ලංකාවේ දැනට පවතින පොල් ඉඩම් ඵලදායිතාවය ඉහළ නැංවීම මඟින් 2021 වර්ෂයේදී පොල් අස්වැන්න ගෙඩි මිලියන 2800 සිට 10% කින් වර්ධනය කිරීම.	152.00	146	146	-
02	දිවයිනේ පවතින පුරන් කුඹුරු ඵලදායි වාණිජ ඒකක බවට පත් කිරීමට පොල් වගාව සිදු කිරීම	248.00	100	17.69	-
03	පොල් වගාව සඳහා බිංදු ජල සම්පාදනය	300.00	278.3	270.33	-

2021.12.31 දිනට භෞතික ප්‍රගතිය

ශ්‍රී ලංකාවේ දැනට පවතින පොල් ඉඩම් ඵලදායිතාවය ඉහළ නැංවීම මඟින් 2021 වර්ෂයේදී පොල් අස්වැන්න ගෙඩි මිලියන 2800 සිට 10% කින් වර්ධනය කිරීම.

- සහනාධාර ගෙවීම් නිර්දේශ කිරීම් - අක්කර 9983
- මව් ශාක1000 ක් තෝරා ගැනීම හා හැර ලණු 30,000 ක් මිලදී ගැනීම අවසන් කර ඇත. මව් ශාක 750ක හැරබැඳීම අවසන් කර පරාගණය සිදු කෙරේ. පරාගන බෑග් සඳහා රෙදි මිලදී ගැනීමට ඇණවුම් නිකුත් කර ඇත.

දිවයිනේ පවතින පුරන් කුඹුරු ඵලදායි වාණිජ ඒකක බවට පත් කිරීමට පොල් වගාව සිදු කිරීම

- ගෙවීම් නිර්දේශ කිරීම් අක්කර 3.25 , ලද ඉල්ලුම්පත්‍ර සංඛ්‍යාව 753 (අක්කර 959)
- මූලික ඉඩම් පරීක්ෂා කිරීම අක්කර 907 (ආදර්ශන ඉදිකිරීමට අනුමැතිය ලබාගැනීම සඳහා ගොවිජන සේවා දෙපාර්තමේන්තුව වෙත ඉදිරිපත් කර ඇත)

පොල් ක්ෂේත්‍රය -අයවැය මගින් වෙන් වූ ප්‍රතිපාදන යටතේ සංවර්ධන ව්‍යාපෘතීන්හි ප්‍රගතිය

2021.12.31 දිනට භෞතික ප්‍රගතිය

පොල් වගාව සඳහා බිංදු ජල සම්පාදනය

- සහනාධාර යටතේ ජල සම්පාදන පද්ධති ඉදිකිරීම - අක්කර 3540
- ණය යටතේ ජල සම්පාදන පද්ධති ඉදිකිරීම- 660
- ජල ප්‍රභව ඉදිකිරීම- අක්කර 1196

පොල් ක්ෂේත්‍රය - විශේෂ සංවර්ධන ව්‍යාපෘතීන්හි ප්‍රගතිය

මූල්‍ය ප්‍රගතිය සාරාංශය

අනු අංකය	ව්‍යාපෘතිය	2021 මූල්‍ය ඉලක්කය (රු.මි)	2021.12.31 දිනට සංශෝධිත වාර්ෂික ඉලක්කය රු.මි.	මූල්‍ය ප්‍රගතිය (රු.මි.)	අතැති බිල්
01	වැලිගම පොල් කොළ මැලවීමේ හා කුණුවීමේ රෝග මර්ධන වැඩසටහන (2018 සිට)	105	62.59	48.06	-
02	පොල් නැවත වගා කිරීමේ ජාතික ව්‍යාපෘතිය සඳහා දෙමුහුම් බීජ පොල් නිෂ්පාදනය කිරීමේ ව්‍යාපෘතිය (කිණියම බීජ පොල් උයන)	8	8.00	8.00	-
03	මයිටා හානිය වැළැක්වීම සඳහා විලෝපිත මයිටාවන් නිෂ්පාදනය හා බෙදාහැරීමේ ජාලය පුළුල් කිරීමේ ව්‍යාපෘතිය	15	15	10	-
04	තෙත් කලාප දෙමුහුම් බීජ ව්‍යාපෘතිය	6	6	6	-

වැලිගම පොල් කොළ මැළවීමේ හා කුණුවීමේ රෝග මර්ධන වැඩසටහන

භෞතික ප්‍රගතිය

වැඩසටහනේ අරමුණට අනුව, රෝගී කලාපයේ රෝගය සාර්ථකව කළමනාකරණය කර ඇත. රෝග කලාපයෙන් පිටතට රෝග ව්‍යාප්තිය පාලනය කර ඇත. රෝග කලාපයේ සහ රෝග මුක්ත කලාපයේ පොල් ගස් පරීක්ෂා කරන විට හමුවන රෝගී ගස් සංඛ්‍යාව ක්‍රමයෙන් පහළ ගොස් ඇත.

2021.12.31 දිනට භෞතික ප්‍රගතිය

- ග්‍රාම නිලධාරී වසම 202 ක් පරීක්ෂා කර අවසන් කර ඇත.
- රෝගී ගස් 8,389 ක් සලකුණු කර ඇත.
- රෝගී ගස් 656 ක් එන්නත් කර ඇත.
- රෝගී ගස් 4,863 ක් ඉවත් කර ඇත.

පොල් නැවත වගා කිරීමේ ජාතික ව්‍යාපෘතිය සඳහා දෙමුහුම් බීජ පොල් නිෂ්පාදනය කිරීමේ ව්‍යාපෘතිය (කිණියම බීජ පොල් උයන)

2021.12.31 දිනට භෞතික ප්‍රගතිය

- පරාග සැකසුම් විද්‍යාගාරය සඳහා පරාග සැකසුම් යන්ත්‍ර 02ක් මිලදී ගැනීම
- පරාග සැකසුම් විද්‍යාගාරය සඳහා පෙනේර කට්ටලයක් මිලදී ගැනීම
- පරාග සැකසුම් විද්‍යාගාරය සඳහා ගෘහ භාණ්ඩ මිලදී ගැනීම
- සැන්රාමන් හා කොළ කුන්දිරා පැල 850 පුරප්පාඩු පිරවීම

මයිටා හානිය වැළැක්වීම සඳහා විලෝපිත මයිටාවන් නිෂ්පාදනය හා බෙදාහැරීමේ ජාලය පුළුල් කිරීමේ ව්‍යාපෘතිය

2021.12.31 දිනට භෞතික ප්‍රගතිය

- විලෝපිත මයිටා පැකට් 219,145 ක් වගාකරුවන් සඳහා බෙදා දී ඇත.
- ගබඩා 3ක් සහ විද්‍යාගාර 2ක් ඉදිකිරීමේ කටයුතු අවසන් කර ඇත. උපකරණ 26 මිල දී ගෙන ඇත. Autoclave 3 ලැබිය යුතු වේ.

තෙත් කලාප දෙමුහුම් බීජ ව්‍යාපෘතිය

2021.12.31 දිනට භෞතික ප්‍රගතිය

- 2021 වර්ෂයේ පැල 650 සිටුවීම සඳහා වලවල් සලකුණු කිරීම, කැපීම හා පිරවීම සඳහා අවශ්‍ය මිල ගණන් කැඳවා අවසන් කිරීම
- බීජ පොල් උයන වටා වැට ඉදි කිරීම සඳහා මිල ගණන් කැඳවීම
- පරාග සැකසුම් විද්‍යාගාරය සඳහා පෙරහන කට්ටලයක් මිලදී ගැනීම
- පරාග සැකසුම් විද්‍යාගාරය සඳහා පරාග සැකසුම් යන්ත්‍රයක් මිලදී ගැනීම සඳහා ගැණුම් ඇණවුම් නිකුත් කිරීම
- බීජ පොල් උයනේ 2021 වර්ෂයේ සිටුවීම සඳහා අවශ්‍ය මව් ශාක නිෂ්පාදනය
- 2021 වර්ෂයේ සිටුවීමට නියමිත මව් ශාක නිපදවීම සඳහා අත් පරාගණ වැඩසටහන ක්‍රියාත්මක කිරීම

2.2 කිතුල් ක්ෂේත්‍රය

2.2.1 ක්ෂේත්‍රය - හැඳින්වීම

කිතුල් ශාකයේ ආර්ථිකමය භාවිතය



ශ්‍රී ලංකාවටම ආවේණික කර්මාන්තයක් වශයෙන් කිතුල් ආශ්‍රිත නිෂ්පාදන කර්මාන්තය දේශීය වශයෙන් ද විදේශීය වශයෙන් ද ඉහළ විභවතාවයක් පවතින කර්මාන්තයක් වශයෙන් හඳුනා ගෙන ඇත. කිතුල් ගම්මාන සංවර්ධන වැඩසටහන, කිතුල් කර්මාන්තය සඳහා වූ 2010 වර්ෂයේ එළි දක්වන ලද තුන් අවුරුදු ජාතික සැලැස්ම ආදී වැඩසටහන් ඔස්සේ කිතුල් කර්මාන්තය නගා සිටුවීමට විශාල දායකත්වයක් රාජ්‍ය අංශය විසින් සිදු කර ඇත.

වැවිලි අමාත්‍යාංශය යටතේ රාජ්‍ය අමාත්‍යාංශයක් ලෙස පොල්, කිතුල් හා තල් වගා ප්‍රවර්ධනය හා ආශ්‍රිත කාර්මික භාණ්ඩ නිෂ්පාදන හා අපනයන විවිධාංගීකරණ රාජ්‍ය අමාත්‍යාංශය ස්ථාපිත කිරීම තුළින් දේශීය නිෂ්පාදන ප්‍රවර්ධනය ඔස්සේ ජනතා කේන්ද්‍රීය ආර්ථිකයක් ඇති කිරීම කෙරෙහි අවධානය යොමු කර ඇති හෙයින් "කිතුල් බෝගය" ආශ්‍රිත ආර්ථිකමය විභවතාවයන් හඳුනාගෙන එය පුළුල් කිරීමට කටයුතු කරමින් පවතී.

කිතුල් ශාකයෙන් පැණි, හකුරු, මී රා, විනාකිරි හා කිතුල් පිටි ආහාර ලෙසත්, කිතුල් කඳ දැවමය වටිනාකමක් සහිත වන අතර කිතුල් පත්‍ර හා නාරටි විවිධ හස්ත කර්මාන්ත සඳහා යොදා ගැනේ. එසේම කිතුල් ශාකය පාරිසරික වශයෙන් පස සෝදායාම වලක්වන ශාකයක් ලෙස ද හඳුනාගෙන ඇත. කිතුල් විවිධ රෝගවලට සිදු කරන ප්‍රතිකාර සඳහා ඖෂධයක් ලෙස පමණක් නොව රූපලාවන්‍ය, කායික වර්ධනය ආදිය සඳහා වූ ඖෂධයක් ලෙස දේශීය වෙදකමේ භාවිතා කරන අතර එය ගව, අලි, ඇතුන් ආදී සතුන්ගේ රෝගාබාධ සඳහා වූ ප්‍රතිකාර වලදී ද භාවිතයට ගැනේ.

එසේම කිතුල් කෙඳි මෙන්ම මීරා ආශ්‍රිත නිෂ්පාදනයන් අපනයනය කරන අතර ඒ සඳහා විශාල විදේශීය වෙළඳපොළක් ද පවතී. කිතුල් කර්මාන්තය දිවයින පුරා දිස්ත්‍රික්ක 13ක පමණ ව්‍යාප්තව පවතින අතර සමස්ත කිතුල් ගස් ප්‍රමාණයෙන් 27% ක් පමණ ප්‍රමාණයක් රජය සතු ඉඩම්වල ව්‍යාප්තව ඇත. හෙක්ටර් කොබ්බෑකඩුව ගොවි කටයුතු පර්යේෂණ හා පුහුණු කිරීමේ ආයතනය සිදු කළ පර්යේෂණ දත්තයන්ට අනුව කිතුල් මල් මදින්නන් වැඩි ප්‍රමාණයක් රත්නපුර දිස්ත්‍රික්කයේ ද කිතුල් කර්මාන්තය ප්‍රධාන ජීවනෝපාය කරගත් පවුල් වැඩි ප්‍රමාණයක් නුවරඑළිය දිස්ත්‍රික්කයේ ද සිටින අතර, එම දිස්ත්‍රික්ක දෙක ද ඇතුළුව මහනුවර, බදුල්ල, මොණරාගල, මාතර, කෑගල්ල, කළුතර, ගාල්ල, කුරුණෑගල, මාතලේ, හම්බන්තොට, කොළඹ යන දිස්ත්‍රික්ක 13 ක් තුළ කිතුල් කර්මාන්තයක් ලෙස ආරම්භ කිරීමට හැකියාව ඇත.

2.2.2 ක්ෂේත්‍රය සංවර්ධනය කිරීම සඳහා වූ ඉදිරි දැක්ම

කිතුල් ක්ෂේත්‍රය උපායමාර්ගික රාමුව 2021-2025

ඉලක්ක

- ***2025 වන විට හොඳින් ස්ථාපිත වූ විධිමත් වගාවක් බවට කිතුල් වගාව පත් කිරීම***
- ***2025 වන විට නව තාක්ෂණය යොදා ගනිමින් අගය එකතු කරන ලද නව නිෂ්පාදන තුළින් දේශීය සම්පත් පදනම් කරගත් අපනයනයක් ලෙස කිතුල් ප්‍රවර්ධනය කිරීමෙන් අපනයන ඉපැයීම් 10% කින් ඉහළ නැංවීම.***

උපායමාර්ගික රාමුව

- *කිතුල් අංශය සඳහා නිසි ආයතනික රාමුවක් හඳුන්වා දීම*
- *පර්යේෂණ හා සංවර්ධනය තුළින් පවත්නා කිතුල් ගස් සහ කිතුල් කර්මාන්තකරුවන්ගේ ප්‍රශස්ත භාවිතය සහතික කිරීම*
- *කිතුල් පදනම් කරගත් නිෂ්පාදන අලෙවිකරණය හා ප්‍රමිතීන් වැඩි දියුණු කිරීම*
- *කිතුල් කර්මාන්තකරුවන්ගේ ඉපැයීම් සහ ජීවන තත්ත්වය වැඩි දියුණු කිරීම, ඔවුන්ගේ සමාජ පිළිගැනීම සහතික කිරීම*
- *කිතුල් වගා බිම් පුළුල් කිරීම සහ ඉඩම් පරිහරණයේ එදායිතාව ඉහළ නැංවීම*
- *කිතුල් නිෂ්පාදනයේ වටිනාකම් දාමය නවීකරණය කිරීම සහ යටිතල පහසුකම් සංවර්ධනය කිරීම*
- *කිතුල් නිෂ්පාදන විවිධාංගීකරණය කිරීම සහ අගය එකතු කිරීම වැඩි දියුණු කිරීම*
- *තරුණ කිතුල් කර්මාන්තකරුවන් පිරිසක් ගොඩනැගීම.*

කිතුල් ක්ෂේත්‍රය සංවර්ධනය කිරීම සඳහා වූ උපාය මාර්ගික සැලැස්ම යටතේ කිතුල් අංශය සඳහා නිසි ආයතනික රාමුවක් හඳුන්වා දීමට අපේක්ෂා කෙරේ. 1971 අංක 46 දරණ පොල් වගා මණ්ඩල පනතේ විධිවිධාන යටතේ කිතුල් අංශය විධිමත් කිරීම සඳහා වෙනම රාජ්‍ය ආයතනයක් ලෙස "කිතුල් සංවර්ධන මණ්ඩලය" පිහිටුවීම මඟින් කිතුල් වගාව ප්‍රධාන වගා බෝගයක් බවට පත් කිරීම අපේක්ෂා කෙරේ.

පර්යේෂණ හා සංවර්ධනය තුළින් දැනට පවතින කිතුල් වගාව හා කිතුල් කර්මාන්තකරුවන්ගේ ප්‍රශස්ත භාවිතය සහතික කිරීමට සාම්ප්‍රදායික කිතුල් කර්මාන්තකරුවන් පිළිබඳ සවිස්තරාත්මක දත්ත පද්ධතියක් සකස් කිරීම, පවත්නා කිතුල් වගාව සහ විභව වගා බිම් පිළිබඳ පුළුල් දත්ත පද්ධතියක් සකස් කිරීම සහ වාර්ෂිකව යාවත්කාලීන කිරීම, පර්යේෂණ, තත්ත්ව පාලන සංවර්ධනය සඳහා රසායනාගාර පහසුකම් වැඩි දියුණු කිරීම සිදු කෙරේ.

එමෙන්ම, කිතුල් පදනම් කරගත් නිෂ්පාදනවල අලෙවිකරණ ප්‍රමිතීන් ඇති කිරීම, දේශීය හා ජාත්‍යන්තර අලෙවිකරණ සඳහා ඊ-වාණිජ පද්ධතියක් හඳුන්වා දීම, දේශීය හා ජාත්‍යන්තර අලෙවිකරණ අවස්ථා පුළුල් කිරීම, අපනයනය සඳහා කිතුල් නිෂ්පාදන සන්නාමකරණය සහ කිතුල් නිෂ්පාදන ආකර්ශනීය ලෙස ඇසුරුම් කිරීම, භූගෝලීය ස්ථාන සහතික කිරීමේ පද්ධතියක් - Geographical Location Certification System ඇති කිරීම (උදා- මීමුරේ කිතුල්, නෙළුව කිතුල්...යනාදී), සාම්ප්‍රදායික කිතුල් නිෂ්පාදනයන්ට අලෙවි අවස්ථා වැඩි කිරීම සඳහා වෙළඳ ප්‍රදර්ශන පැවැත්වීම අපේක්ෂා කෙරේ.

කිතුල් කර්මාන්තකරුවන්ගේ ජීවන තත්ත්වය වැඩි දියුණු කිරීම වෙනුවෙන් කිතුල් කර්මාන්තකරුවන් සඳහා විශේෂ මූල්‍ය ආරක්ෂණ ක්‍රමයක් හඳුන්වා දීම, කිතුල් කර්මාන්තකරුවන් සඳහා විශ්‍රාම වැටුප් ක්‍රමයක් හඳුන්වා දීම, කිතුල් කර්මාන්තය සඳහා ආවේණික සාම්ප්‍රදායික දැනුම සහිත කිතුල් මැදීම පිළිගැනීමක් සහිත වෘත්තියක් බවට සමාජගත කිරීම, කිතුල් නිෂ්පාදන ප්‍රමිතිකරණ යන්ත්‍රණයක් ස්ථාපිත කිරීම, යනාදී වැඩසටහන් සිදුකිරීමට අපේක්ෂා කෙරේ.

තව ද, ඌණ උපයෝජිත කිතුල් වගාවන් හඳුනා ගැනීම මඟින් කිතුල් කර්මාන්තයේ විභවතාවය උකහා ගැනීම, දැනට හඳුනා ගන්නා ලද ඉහළ අස්වැන්නක් සහිත කිතුල් ප්‍රභේදයන්ගේ පැළ තවාන් ඇති කිරීම සහ කිතුල් වගාව සඳහා විභවතාවයක් සහිත නව දිස්ත්‍රික්ක හඳුනා ගැනීම මඟින් වගා බිම් පුළුල් කිරීම හා ඉඩම් පරිහරණය ඵලදායිතාවය ඉහළ නැංවීමට බලාපොරොත්තු වේ.

යටිතල පහසුකම් සංවර්ධනය කිරීම මඟින් කිතුල් නිෂ්පාදනයේ අගයදාමය නවීකරණය කිරීමට බලාපොරොත්තු වේ. අනුමත කිතුල් අගයදාම නවීකරණ ව්‍යාපෘතිය යටතේ අගයදාමයෙහි පාර්ශවකරුවන් පුහුණු කිරීම, රාජ්‍ය පෞද්ගලික හවුල්කාරිත්වය යටතේ කිතුල් යුෂ හා කිතුල් පැණි එකතු කිරීම සඳහා මධ්‍යස්ථානයක් පිහිටුවීම, සහතිකලත් කිතුල් සැකසුම් මධ්‍යස්ථාන පිහිටුවීම, අලෙවිසැල් හා කිතුල් සංචාරක උද්‍යාන ස්ථාපිත කිරීම ද මෙහිදී අපේක්ෂා කෙරේ.

කිතුල් නිෂ්පාදන විවිධාංගීකරණය කිරීම සහ අගය එකතු කිරීම වැඩි දියුණු කිරීම තුළින් අගය එකතු කරන ලද ආහාර නිෂ්පාදන ප්‍රවර්ධනය කිරීම, දිරිගැන්වීම හා කිතුල් පදනම් කරගත් වෙනත් නිෂ්පාදන ප්‍රවර්ධනය කිරීම මඟින් කිතුල් කර්මාන්තය සංවර්ධනය කිරීමට බලාපොරොත්තු වේ. මේ සඳහා ලබන වර්ෂයේදී ප්‍රතිපාදන අපේක්ෂා කෙරේ.

තවදුරටත්, කිතුල් කර්මාන්තකරුවන්ගේ තරුණ පත්තියක් ගොඩ නැගීම සඳහා හඳුනාගත් සාම්ප්‍රදායික දැනුම සහිත කිතුල් කර්මාන්තකරුවන් මඟින් කිතුල් කර්මාන්තය සඳහා දැනට බහුල වශයෙන් පවතින ප්‍රදේශවල පුහුණු වැඩසටහන් පැවැත්වීම, කිතුල් කර්මාන්තය පාසල් විෂය නිර්දේශයට ඇතුළත් කිරීම, කිතුල් සම්බන්ධයෙන් වෘත්තීය පුහුණු අධිකාරිය මඟින් පුහුණු පාඨමාලා පැවැත්වීම, මාධ්‍ය මඟින් දැනුවත්භාවය වැඩි කිරීමේ වැඩසටහන් පැවැත්වීම ආදිය මඟින් කිතුල් ක්ෂේත්‍රය සංවර්ධනය කිරීමට අපේක්ෂා කෙරේ.

කිතුල් ක්ෂේත්‍රය 2021- ඉලක්ක

කිතුල් ක්ෂේත්‍රයේ සංවර්ධනය උදෙසා 2021 වර්ෂයේ දී පහත සඳහන් ව්‍යාපෘති කිරීමට රු.මි. 120ක් අමාත්‍යාංශය වෙත වෙන් ව තිබිණි.

අංකය	ක්‍රියාත්මක කරනු ලබන ව්‍යාපෘතිය	2021 ප්‍රතිපාදන (රු.මි.)	ව්‍යාපෘතියේ අරමුණු	අපේක්ෂිත ප්‍රතිඵල/ ඉලක්ක	ක්‍රියාත්මක කරන ආයතනය
අයවැය යෝජනා මගින් වෙන් වූ ප්‍රතිපාදන					
1	කිතුල් නිෂ්පාදන හා අගයදාම ප්‍රවර්ධන ව්‍යාපෘතිය.	100.00	කිතුල් ක්ෂේත්‍රය සංවර්ධනය කිරීම සඳහා නිසි ආයතනික රාමුවක් සකස් කිරීම. කිතුල් නිෂ්පාදනය සඳහා පහසුකම් සැපයීම හා කර්මාන්තක රුවන් දිරිමත් කිරීම.	• පර්යේෂණ හා සංවර්ධනය තුළින් පවත්නා කිතුල් ගස් සහ කිතුල් කර්මාන්තකරුවන්ගේ ප්‍රශස්ත භාවිතය සහතික කිරීම • කිතුල් පදනම් කරගත් නිෂ්පාදන අලෙවිකරණය හා ප්‍රමිතීන් වැඩි දියුණු කිරීම • කිතුල් කර්මාන්තකරුවන්ගේ ඉපැයීම් සහ ජීවන තත්ත්වය වැඩි දියුණු කිරීම, ඔවුන්ගේ සමාජ පිළිගැනීම සහතික කිරීම • කිතුල් වගා බිම් පුළුල් කිරීම සහ ඉඩම් පරිහරණ එදායිතාව ඉහළ නැංවීම • කිතුල් නිෂ්පාදනයේ වටිනාකම් දාමය නවීකරණය කිරීම සහ යටිතල පහසුකම් සංවර්ධනය කිරීම	කිතුල් සංවර්ධන මණ්ඩලය

අංකය	ක්‍රියාත්මක කරනු ලබන ව්‍යාපෘතිය	2021 ප්‍රතිපාදන (රු.මි.)	ව්‍යාපෘතියේ අරමුණු	අපේක්ෂිත ප්‍රතිඵල/ ඉලක්ක	ක්‍රියාත්මක කරන ආයතනය
විශේෂ සංවර්ධන ව්‍යාපෘති					
1	කිතුල් සංවර්ධනය	20.00	කිතුල් අංශය යටිතල පහසුකම් සංවර්ධනය කිරීම.	• කාර්මික තාක්ෂණික ආයතනය සමඟ ගුණාත්මක භාවයෙන් යුතු කිතුල් නිෂ්පාදන සකස් කිරීම හා කිතුල් ශාකයට වැළඳෙන රෝග සම්බන්ධ පර්යේෂණ ව්‍යාපෘති සිදු කිරීම.	කිතුල් සංවර්ධන මණ්ඩලය

2.2.3 ක්ෂේත්‍රය සංවර්ධනය කිරීම සඳහා වූ අභියෝග

කිතුල් වගාව සම්බන්ධ ගැටළු

- කිතුල් විධිමත් වගාවක් ලෙස ව්‍යාප්ත වී නොතිබීම හා වගාව පිළිබඳ දත්ත නොමැති වීම
- කිතුල් ශාක වනාන්තර හා ලහාවීමට දුෂ්කර කඳු ආශ්‍රිතව බහුලව ව්‍යාප්ත වී තිබුණ ද එම ගස් වෙත ප්‍රවේශ වීම දුෂ්කර වීම

කිතුල් කර්මාන්තකරුවන්හට තිබෙන ගැටළු

- සාම්ප්‍රදායික දැනුම මත පදනම් වූ දේශීය කර්මාන්තයක් වන කිතුල් කර්මාන්තය පිළිබඳ දැනුම සමාජගත නොවීම නිසා කර්මාන්තය පිළිබඳ දැනුම ප්‍රවලිත වීම මන්දගාමීව සිදු වේ.
- සාම්ප්‍රදායික දැනුම සුරක්ෂිත කිරීමට ක්‍රමවේදයක් නොමැති වීම
- නව තාක්ෂණ ක්‍රමවේදයක් වශයෙන් කැස්පර් තාක්ෂණය හඳුන්වා දුන්න ද, එම තාක්ෂණය ප්‍රාදේශීය මට්ටමින් බෙදා හැරීමේ ක්‍රමවේදයන් ප්‍රමාණවත් නොවීම හා කැස්පර් නිෂ්පාදනය ප්‍රමාණවත් නොවීම.
- කිතුල් මල් කැපීමේ දී සිදුවන වන සතුන්ගේ හානිය අවම කර ගැනීමට ක්‍රමවේදයක් නොමැති වීම.
- තරුණ ප්‍රජාව කිතුල් කර්මාන්තය සඳහා යොමු නොවීම.
- කිතුල් ශාකය උසින් වැඩිවීම හා ගස් නැගීම සඳහා ආරක්ෂිත හැර කට්ටල නොමැති වීම.
- කිතුල් ශාකය උසින් වැඩිවීම නිසා ගස් නැගීම ජීවිත අවදානම් සහගත වීම හා එබැවින් කිතුල් කාර්මිකයන්ගේ නිවෙස්වල කාන්තාවන් මෙම රැකියාව සඳහා පෙළඹවීමක් නොමැති වීම.
- තෙලිදිය ප්‍රවාහනයේ දී නීතිමය වශයෙන් බාධා පැවතීම නිසා කර්මාන්තය වර්ධනය වීමට බාධාවක් ව තිබීම, කිතුල් රා දැනට ළඟ තබා ගත හැක්කේ බෝතල් පහක ප්‍රමාණයක් පමණක් වීම හා එය කර්මාන්තය ප්‍රවර්ධනයට බාධාවක් වීම .
- අවධානම වැඩි රැකියාවක් වන අතර, මල් කැපීමේ දී සිදු වන අනතුරු වෙනුවෙන් දැනට රක්ෂණ ක්‍රමයක් නොමැති වීම.

වෙළඳපොළ සම්බන්ධ ගැටළු

- බාල ප්‍රමිතියෙන් යුතු නිෂ්පාදන වෙළඳපළට ඉදිරිපත් කිරීම
- කිතුල් නිෂ්පාදන ප්‍රමිතියෙන් බාල කිරීම සඳහා සිදු කරන සීනි කවලම් කිරීම වැනි ක්‍රියා නියාමනය කිරීම සඳහා නීතිමය රාමුවක් ක්‍රියාත්මක නොවීම.
- කිතුල් පැණිවල ප්‍රමිතිය පරීක්ෂා කරන උපකරණ හඳුන්වා දුන්න ද ඒවා මිලදී ගැනීම සඳහා ක්‍රමවේදයක් නොමැති වීම හා සුලභ නොවීම.

ආයතනික ගැටළු

- යෝජිත කිතුල් සංවර්ධන මණ්ඩලය නිසි පරිදි ස්ථාපිත කර කඩිනමින් කාර්ය මණ්ඩලය බඳවා ගත යුතුව ඇත
- කිතුල් නිෂ්පාදන ජාතික වැඩසටහන් පිළිබඳ සමාජය තුළ තිබෙන පිළිගැනීම මඳවීම.
- ප්‍රතිලාභ ලබාදීමේදී ප්‍රතිලාභීන් සියළුම දෙනා ආවරණය වන පරිදි ප්‍රතිලාභ ලබාදීමට ප්‍රමාණවත් ප්‍රතිපාදන නොලැබීම.

කිතුල් ක්ෂේත්‍රය සංවර්ධනය සඳහා පහසුකම් සැලසීම

"කිතුල් සංවර්ධන මණ්ඩලය" ස්ථාපිත කිරීම

කාර්යයන්

- සාම්ප්‍රදායික කිතුල් කර්මාන්තයේ නියැලෙන්නන් පිළිබඳව විධිමත් අධ්‍යයනය කිරීම, දැනට කර්මාන්තයේ සිටින අය හඳුනා ගැනීම හා ලියාපදිංචිය
- තාක්ෂණික ස්වභාවයෙන් යුත් සියලු කාරණා පිළිබඳ ව කිතුල් කර්මාන්තය සඳහා උපදෙස් ලබා දීම හා මඟ පෙන්වීම;
- කිතුල් කර්මාන්තය සඳහා සහාය ලබා දීමට උපදේශක හා ව්‍යාපෘති වැඩකරුවන් පුහුණු කිරීම;
- කිතුල් නිෂ්පාදන සම්මති පිහිටුවීම, ආරක්ෂක උපකරණ කට්ටල හඳුන්වාදීම, වෘත්තීය ඇඳුම් කට්ටල හඳුන්වා දීම හා රක්ෂණ ආවරණ ලබාදීම
- කිතුල් කර්මාන්තයේ නියැලෙන්නන් ලියාපදිංචි කිරීම හා හැඳුනුම්පත් ලබාදීම
- කිතුල් නිෂ්පාදන නිපදවීම හා ඒ පිළිබඳ සහාය ලබා දීම හා ප්‍රවර්ධනය සහ විධිමත් කිරීම;
- කිතුල් නිෂ්පාදන සකස් කිරීම සඳහා නියමු පිරියත පිහිටුවීම හා පවත්වාගෙන යාම සහ අත්හදා බැලීමේ සැකසුම් උපකරණ තැනීම;
- කිතුල් නිෂ්පාදන එකතු කිරීමේ මධ්‍යස්ථාන ඇතිකිරීම
- කිතුල් නිෂ්පාදන සැකසීම සම්බන්ධයෙන් වන නවීන තාක්ෂණය ප්‍රවර්ධනය කිරීම;
- කිතුල් නිෂ්පාදන නිපදවීම සිදු කරනු ලබන ආයතනවල කාර්යක්ෂමතාව වැඩි කිරීම සඳහා සහාය ලබා දීම හා ඒවා නවීකරණය කිරීම ප්‍රවර්ධනය කිරීම හා මෙහෙයවීම;

ඇතුළුව කිතුල් ක්ෂේත්‍රය සංවර්ධනය සඳහා වූ හඳුනාගත් කාර්යයන් ඉටු කෙරෙනු ඇත.

ශ්‍රී ලංකාව තුළ කිතුල් වගාව හා කර්මාන්තය සංවර්ධනය කිරීම සඳහා ඒ සඳහාම වෙන් වූ ආයතනික ව්‍යුහයක් ස්ථාපිත කිරීමේ අවශ්‍යතාවය හඳුනාගෙන ඇත. වැවිලි කර්මාන්ත අමාත්‍යාංශයේ මඟ පෙන්වීම මත මෙම රාජ්‍ය අමාත්‍යාංශය මඟින් දැනටමත් මේ සඳහා කටයුතු සිදු කර ඇත. 1971 අංක 46 දරණ පොල් සංවර්ධන පනතේ 2(1) වන වගන්තියෙන් වැවිලි අමාත්‍යවරයා වෙත පැවරී ඇති බලතල ප්‍රකාරව, **කිතුල් ක්ෂේත්‍රය සඳහා නිසි ආයතනික රාමුවක් ස්ථාපිත කිරීම සඳහා** "කිතුල් සංවර්ධන මණ්ඩලය" ස්ථාපිත කර ඇත.

කිතුල් බෝගය ප්‍රධාන වැවිලි බෝගයක් ලෙස නම් කිරීම

කිතුල් නිෂ්පාදන පුළුල් කිරීම සඳහා විශේෂ විභවතාවයක් පවතින අතර, කිතුල් කර්මාන්තය ප්‍රවර්ධනය කිරීමට පහසුකම් සැලසීම සඳහා කිතුල් බෝගය ප්‍රධාන වැවිලි බෝගයක් ලෙස නම් කිරීමට වැවිලි අමාත්‍යාංශයේ මඟ පෙන්වීම යටතේ මෙම රාජ්‍ය අමාත්‍යාංශය විසින් කටයුතු කෙරේ. එසේම කිතුල් ආශ්‍රිත කර්මාන්තය අස්පර්ශණීය (Intangible) ලෝක සංස්කෘත උරුමයක් ලෙස එක්සත් ජාතීන්ගේ අධ්‍යාපනික, විද්‍යාත්මක සහ සංස්කෘතික සංවිධානය (UNESCO) හරහා නම් කිරීමට ද අවශ්‍ය මූලික කටයුතු සැකසෙමින් පවතී.

එබැවින් කිතුල් බෝගය ප්‍රධාන වැවිලි බෝගයක් ලෙස නම් කිරීමෙන් ඉදිරියේ දී ඒ ආශ්‍රිතව සිදු කරන වගා ප්‍රවර්ධනයන්, සංවර්ධන වැඩ පිළිවෙලවල් ක්‍රියාත්මක කිරීම, නීති අණපනත් සැකසීම ඔස්සේ නියාමනය කිරීම ආදී වූ කිතුල් බෝගය ආශ්‍රිත කර්මාන්තය නඟා සිටුවීමට ගන්නා වූ සියලු ක්‍රියාදාමයන් දිවයිනටම බල පැවැත්වෙන ආකාරයට සිදු කිරීමට පහසුවක් වනු ඇත. කිතුල් බෝගය ආශ්‍රිත අපනයන ඉලක්ක සපුරා ගැනීමට ද ග්‍රාමීය කර්මාන්තයක් වශයෙන් ප්‍රවර්ධනයට ද අවශ්‍ය වන්නා වූ ඉලක්ක සපුරා ගැනීමට පහසුවක් වන හෙයින් කිතුල් බෝගය ප්‍රධාන වැවිලි බෝගයක් ලෙස නම් කිරීම කාලීනව වැදගත් වනු ඇත. **කිතුල් ප්‍රධාන වැවිලි බෝගයක් වශයෙන් නම් කිරීම හා "කිතුල් සංවර්ධන මණ්ඩලය" පිහිටුවීම සඳහා අමාත්‍ය මණ්ඩල අනුමැතිය ලබා ගන්නා ලදී.**

රාජ්‍ය අමාත්‍යාංශය විසින් කිතුල් ක්ෂේත්‍රයේ උන්නතිය උදෙසා ගෙන ඇති සුවිශේෂී ක්‍රියාමාර්ගයන්හි ප්‍රගතිය

වර්ෂ 2020.08.01 දින නිකුත් කරන ලද අංක 2187/27 දරණ අතිවිශේෂ ගැසට් නිවේදනය අනුව මෙම රාජ්‍ය අමාත්‍යාංශය මූලිකව ස්ථාපිත වූ දින සිට කිතුල් ක්ෂේත්‍රයේ උන්නතිය උදෙසා සුවිශේෂී ක්‍රියාමාර්ග රැසක් ගෙන ඇත.

ඒ යටතේ,

- 2021 – 2025 කිතුල් ක්ෂේත්‍රය සංවර්ධනය සඳහා පස් අවුරුදු උපායමාර්ගික සැලැස්මක් පිළියෙල කර තිබේ.
- කිතුල් බෝගය ප්‍රධාන වැවිලි බෝගයක් ලෙස නම් කිරීම සඳහා සහ "කිතුල් සංවර්ධන මණ්ඩලය" ස්ථාපිත කිරීම සඳහා අමාත්‍ය මණ්ඩල අනුමැතිය ලබා ගැනීමට අමාත්‍ය මණ්ඩල සංදේශයක් ඉදිරිපත් කිරීම.
- 2020.12.14 දිනැති සහ අංක අමප/20/1882/326/019 දරණ අමාත්‍ය මණ්ඩල තීරණය අනුව කිතුල් වාණිජ බෝගයක් ලෙස වගා කිරීම දිරිගැන්වීමේ අරමුණින් කිතුල් ප්‍රධාන වැවිලි බෝගයක් ලෙස නම් කිරීම.
- අංක 2206/13 සහ 2020.12.16 දිනැති අතිවිශේෂ ගැසට් පත්‍රයෙන් 1971 අංක 46 දරණ පොල් සංවර්ධන පනතේ බලතල ප්‍රකාරව කටයුතු කළ හැකි වන සේ කිතුල් බෝගය ද පොල් සංවර්ධන පනතට ඇතුළත් කර ඇත.
- 1971 අංක 46 දරණ පොල් සංවර්ධන පනත යටතේ වැවිලි අමාත්‍යවරයා වෙත පැවරී ඇති බලතල ප්‍රකාරව "කිතුල් සංවර්ධන මණ්ඩලය" ස්ථාපිත කර ඇත.
- කිතුල් නිෂ්පාදනයන් භාවිතයෙන් ඇති සෞඛ්‍යමය ප්‍රතිලාභ හා කිතුල් කර්මාන්තයේ පවතින සාම්ප්‍රදායික දැනුම සම්බන්ධයෙන් සමාජය දැනුවත් කිරීම සඳහා මෙම අමාත්‍යාංශයේ මග පෙන්වීම හා අනුග්‍රහයෙන් රජයේ වෛද්‍ය නිලධාරීන්ගේ සංගමයේ හා වෘත්තිකයන්ගේ සංගමයේ දායකත්වයෙන් “අපේ කිතුල” නමින් කිතුල් පිළිබඳ විද්වත් කතිකාවක් පවත්වා ඇත.
- කිතුල් කර්මාන්තයේ අභිවෘද්ධිය උදෙසා වැය ශීර්ෂ 431-2-3-2-2507 යටතේ, 2021 වසරේ රුපියල් 83 646 850.00 (මිලියන 83.6ක) ප්‍රතිපාදන කිතුල් පවතින දිස්ත්‍රික්ක 11ක ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශ 70කට ආසන්න ප්‍රමාණයක් වෙනුවෙන් රාජ්‍ය අමාත්‍යාංශය විසින් වෙන් කරන ලදී. 2021 වර්ෂ අවසානයේ දී ප්‍රතිලාභීන් 5000කට අධික ප්‍රමාණයක් වෙනුවෙන් පුහුණු වැඩසටහන්, අවශ්‍ය උපකරණ හා කිතුල් නිෂ්පාදනාගාර අළුත්වැඩියා කිරීමට අවශ්‍ය යටිතල පහසුකම් සැපයීම ආදී කටයුතු සිදු කර ඇත.
- අපනයන සංවර්ධන මණ්ඩලය මගින් සිදු කළ කිතුල් ආශ්‍රිත නිෂ්පාදන සඳහා අගයදාම ව්‍යාපෘතිය වෙනුවෙන් අමාත්‍යාංශ වැය ශීර්ෂ 431-2-3-2-2507 යටතේ වෙන් කළ ප්‍රතිපාදනවලින් රුපියල් මිලියනයක මුදලක් ලබා දී ඇත.
- 2021 වර්ෂයේ දී අමාත්‍යාංශ වැය ශීර්ෂ 431-2-3-2-2506 යටතේ වෙන් කළ ප්‍රතිපාදනවලින් රුපියල් මිලියන 3.9ක මුදල් ප්‍රමාණයක් ගාල්ල, කොළඹ හා කළුතර යන දිස්ත්‍රික්ක 03 හි වෙසෙන කිතුල් කාර්මිකයන් 956 දෙනෙක් සඳහා කිතුල් කර්මාන්තයට අත්‍යාවශ්‍ය වන උපකරණ ලබා දීම.
- කාර්මික තාක්ෂණික ආයතනය හා සම්බන්ධ වී කිතුල් ශාකවලට හානි කරන පළිබෝධකයන් හඳුනා ගැනීම, කිතුල් පැළ තවාන් පිහිටුවීම ආදී තාක්ෂණික කටයුතු සඳහා මිලියන 5.58ක මුදල් ප්‍රමාණයක් අමාත්‍යාංශය විසින් වැය කර ඇත.

කිතුල් සංවර්ධන වැඩසටහන් මගින් අපේක්ෂිත ප්‍රතිඵල

වැඩසටහන	අපේක්ෂිත ප්‍රතිඵල
කිතුල් කර්මාන්තයේ අභිවෘද්ධිය උදෙසා ප්‍රතිපාදන ලබා දීම	කිතුල් ව්‍යාප්තව පවතින දිස්ත්‍රික්කවල ජීවත්වන අඩු ආදායම්ලාභී කිතුල් කාර්මිකයන් උදෙසා අවශ්‍ය උපකරණ හා පුහුණුව ලබා දීම මගින් ඔවුන්ගේ ජීවන තත්ත්වය උසස් කිරීම. වැය කර ඇති මුළු මුදල රුපියල් මිලියන 83.6 කි.
කිතුල් සංවර්ධන මණ්ඩලය ස්ථාපිත කිරීම.	වර්ෂ 2025 වන විට හොඳින් ස්ථාපිත වූ විධිමත් වගාවක් බවට කිතුල් වගාව පත් කිරීම හා නව තාක්ෂණය යොදා ගනිමින් අගය එකතු කරන ලද නව නිෂ්පාදන තුළින් දේශීය සම්පත් පදනම් කරගත් අපනයනයක් ලෙස කිතුල් ප්‍රවර්ධනය කිරීම හා එමගින් අපනයන ඉපයීම් 10% කින් වැඩි කර ගැනීම සඳහා වූ ඉලක්ක සපුරා ගැනීමට අවශ්‍ය විධිමත් ආයතනික රාමුවක් ස්ථාපිත වීම.
අගය දාම ව්‍යාපෘතිය	අපනයන සංවර්ධන මණ්ඩලය මගින් සිදු කරනු ලබන මෙම ව්‍යාපෘතිය මගින් තෝරා ගත් කිතුල් කාර්මිකයන් උදෙසා කිතුල් නිෂ්පාදනවල ගුණාත්මකභාවය ඉහළ නැංවීමට අවශ්‍ය පුහුණුව හා අත්‍යාවශ්‍ය උපකරණ ලබා දීම. වැය කර ඇති මුළු මුදල රුපියල් මිලියන 1 කි
කාර්මික තාක්ෂණික ආයතනය සමඟ සිදු කරනු ලබන ව්‍යාපෘතිය	කිතුල් ශාකයට වැළඳෙන රෝග හඳුනා ගැනීම, කිතුල් තවාන් සකස් කිරීම සහ කිතුල් රා සම්බන්ද පර්යේෂණ සිදු කිරීම. වැය කර ඇති මුළු මුදල රුපියල් මිලියන 5.58 කි

2.2.4 ක්ෂේත්‍රය - සමස්ත ප්‍රගතිය

කිතුල් අපනයනය

කිතුල් කර්මාන්තය මගින් දේශීය අවශ්‍යතාවයන් සපුරනවාට අමතරව 2021 වර්ෂයේ කිතුල් පැණි හා කිතුල් හකුරු අපනයනයෙන් ඇ.ඩො. 943,489 ක ආදායමක් උපයාගෙන ඇත. එය 2010 වර්ෂයේ අපනයන ආදායම වන ඇ.ඩො. 45,112 හා සසඳන කළ 20% පමණ වර්ධනයකි. නමුත් 2017 හා 2018 යන වර්ෂයන්ට සාපේක්ෂව කිතුල් නිෂ්පාදන අපනයන ආදායමෙහි අඩුවීමක් දක්නට ලැබේ. ශ්‍රී ලංකාවේ කිතුල් පැණි හා කිතුල් හකුරු නිෂ්පාදන ඕස්ට්‍රේලියාව, කැනඩාව, එංගලන්තය, එක්සත් අරාබි එමීර් රාජ්‍ය ඇතුළු රටවල් 20 කට පමණ අපනයනය කෙරේ.



	2010	2011	2012	2013	2014	2015	2016	2017	2018	2019	2020	2021
H.17029030 කිතුල් පැණි	37,335	111,011	183,225	228,360	241,037	245,170	343,182	417,094	385,195	217,547	382,695	420,964
H.17029022 කිතුල් හකුරු	7,777	127,241	272,033	308,408	307,869	309,327	260,677	295,749	394,573	307,639	560,794	616,873

දේශීය කර්මාන්තයක් වශයෙන් සුළු පරිමාණයෙන් සිදු කෙරෙන කිතුල් කර්මාන්තයේ හා කිතුල් ක්ෂේත්‍රය සම්බන්ධයෙන් දත්ත යාවත්කාලීන නොවීම හේතුවෙන් මෙම ක්ෂේත්‍රය සම්බන්ධයෙන් සමස්ත ප්‍රගතිය පිළිබඳ විශ්වාසනීය මූලාශ්‍ර නොමැත.

කෙසේ වුව ද, 2009 වර්ෂයේදී ජන හා සංඛ්‍යා ලේඛන දෙපාර්තමේන්තුව විසින් සිදු කරන ලද සංගණන තොරතුරු මූලාශ්‍ර අනුව 2009 වර්ෂය වන විට කිතුල් කර්මාන්තය සිය ජීවනෝපාය කරගත් පවුල් 2,587 ක් පමණ සිට ඇත. මේ වන විට මැදිය හැකි මට්ටමේ කිතුල් ගස් 574,259 ක් තිබූ අතර ඉන් ප්‍රයෝජනයට ගෙන ඇත්තේ ගස් 89,855 ක් පමණි.

ඒ අනුව ප්‍රයෝජනයට නොගත් කිතුල් ගස් 84% ක් පමණ ප්‍රමාණය ප්‍රයෝජනයට ගනිමින් මෙම ක්ෂේත්‍රය වර්ධනය කිරීමට විභවතාවයක් ඇති අතර, අගය එකතු කරන ලද කිතුල් නිෂ්පාදන දිරි ගැන්වීම මගින් කිතුල් ආශ්‍රිත අපනයන ආදායම් සැලකිය යුතු ලෙස වර්ධනය කර ගත හැකි වනු ඇත.

කිතුල් ගස් සංඛ්‍යාව හා කිතුල් සිය ජීවනෝපාය කරගත් පවුල් පිළිබඳ තොරතුරු

පළාත	කිතුල් ගස් සංඛ්‍යාව				දැනට මල් මදින ගස් සංඛ්‍යාව	පැණි ,හකුරු නිෂ්පාදනය සඳහා යොදා ගන්නා ගස් සංඛ්‍යාව	මල් මදින්නන් ගණන	කිතුල් කර්මාන්තය ප්‍රධාන ජීවනෝපාය කරගත් පවුල් ගණන
	(පැළ සංඛ්‍යාව අවු 05ට අඩු)	මධ්‍යම වයසේ ගස් සංඛ්‍යාව	පිදුණු ගස් සංඛ්‍යාව	මුළු ගස් සංඛ්‍යාව				
සබරගමුව	372,331	246,924	133,743	752,998	21,667	14,174	6,828	459
මධ්‍යම	336,687	195,991	126,168	658,846	25,930	20,913	8,167	1,159
ඌව	348,622	183,923	104,035	636,580	13,067	9,583	5,259	432
දකුණ	187,004	134,765	117,399	439,168	19,918	15,036	7,258	315
බස්නාහිර	145,783	88,454	59,462	293,699	7,634	5,719	1,629	210
වයඹ	80,186	42,054	26,834	149,074	1,563	562	418	12
නැගෙනහිර	14,615	9,257	3,294	27,166	20	2	5	
උතුරු මැද	10,888	5,518	3,324	19,730	56	18	43	
එකතුව	**1,496,116**	**906,886**	**574,259**	**2,977,261**	**89,855**	**66,007**	**29,607**	**2,587**

මූලාශ්‍රය :ජන හා සංඛ්‍යා ලේඛන දෙපාර්තමේන්තුව 2009

කිතුල් ක්ෂේත්‍රය -අයවැය මඟින් වෙන් කල ප්‍රතිපාදන යටතේ සංවර්ධන ව්‍යාපෘතීන්හි ප්‍රගතිය

2021.12.31 දිනට මූල්‍ය ප්‍රගතිය

අනු අංකය	ව්‍යාපෘතිය	2021 මූල්‍ය ඉලක්කය (රු.මි)	2021.09.30 දිනට සංශෝධිත වාර්ෂික ඉලක්කය රු.මිලි	මූල්‍ය ප්‍රගතිය (රු.මි)	අතැති බිල්
01	කිතුල් නිෂ්පාදන හා අගයදාම ප්‍රවර්ධන ව්‍යාපෘතිය (නැවත පවරා දීම රු මි 10.12)	100	90	29.4	44.35

කිතුල් ක්ෂේත්‍රය - සංවර්ධන ව්‍යාපෘතීන්හි ප්‍රගතිය

2021.12.31 දිනට මූල්‍ය ප්‍රගතිය

අනු අංකය	ව්‍යාපෘතිය	2021 මූල්‍ය ඉලක්කය (රු.මී)	2021.09.30 දිනට සංශෝධිත වාර්ෂික ඉලක්කය රු.මී	මූල්‍ය ප්‍රගතිය (රු.මී)	අතැති බිල්
01	කිතුල් සංවර්ධන ව්‍යාපෘතිය	20	20	9.524	0

කිතුල් ක්ෂේත්‍රය -අයවැය මඟින් වෙන් වූ ප්‍රතිපාදන යටතේ සංවර්ධන ව්‍යාපෘතීන්හි ප්‍රගතිය

2021.12.31 දිනට භෞතික ප්‍රගතිය

කිතුල් නිෂ්පාදන හා අගයදාම ප්‍රවර්ධනය සඳහා මෙම ව්‍යාපෘතිය යටතේ හම්බන්තොට, බදුල්ල ඇතුළු දිස්ත්‍රික්ක 11 ක ප්‍රාදේශිය ලේකම් කාර්යාල 70 ක් සඳහා රු.මී.83.65 ක ප්‍රතිපාදන ලබා දී ඇත.

- කිතුල් කර්මාන්තකරුවන් දිරි ගැන්වීම.
- පුහුණු වැඩසටහන් පැවැත්වීම.
- කිතුල් මල් කැපීමට අවශ්‍ය උපකරණ ලබා දීම.
- කිතුල් ආශ්‍රිත නිෂ්පාදන දිරි ගැන්වීම.
- අවශ්‍ය යටිතල පහසුකම් සැලසීම.

කිතුල් ක්ෂේත්‍රය - සංවර්ධන ව්‍යාපෘතීන්හි ප්‍රගතිය

2021.12.31 දිනට භෞතික ප්‍රගතිය

කිතුල් සංවර්ධන ව්‍යාපෘතිය (රු.මි.20)
කිතුල් ක්ෂේත්‍රයේ අභිවෘද්ධිය සඳහා ඉදිරිපත් කර ඇති ව්‍යාපෘතිය සඳහා කාර්මික තාක්ෂණ ආයතනය වෙත රු.මි.5.5805 ක ප්‍රතිපාදන ලබා දී ඇති අතර එමඟින් පහත සඳහන් ක්‍රියාකාරකම් සිදු කරනු ලබයි.

- කිතුල් කෙඳි නිස්සාරණය කිරීම.
- කිතුල් පිටි සකස් කර ගැනීම.
- කිතුල් ශාකයට හානි කරන පලිබෝධකයන් හඳුනා ගැනීම හා එම හානි මර්දනය කිරීමට හා රෝග පැතිරීම වලක්වා ගත හැකි ක්‍රියාමාර්ග ඉදිරිපත් කිරීම.
- කිතුල් නිෂ්පාදන සඳහා නියමිත ප්‍රමිති සහතිකයක් ලබා දීමේ ක්‍රමවේදයක් හඳුන්වා දීම.

අපනයන සංවර්ධන මණ්ඩලය සඳහා රු. මි. 1 ක ප්‍රතිපාදන ලබා දී ඇති අතර, ගාල්ල, මාතර, හම්බන්තොට, යන දිස්ත්‍රික්කවල තෝරාගත් කර්මාන්තකරුවන් 10 දෙනෙකු සඳහා GMP තත්ත්ව සහතික ලබා ගැනීමට අවශ්‍ය තාක්ෂණික උපදේශන හා උපකරණ ලබා දීම.

කිතුල් කෙඳි නිස්සාරණය කිරීම.



කිතුල් තවාන් ඇති කිරීම සඳහා බීජ ප්‍රරෝහණය කිරීම



කිතුල් ශාකය ආශ්‍රිත ව්‍යාධිජනක රෝග පිළිබඳ පරීක්ෂාව



කිතුල් ක්ෂේත්‍රය - සංවර්ධන ව්‍යාපෘතීන්හි ප්‍රගතිය

- කිතුල් ශාකයට වැළඳෙන ව්‍යාධිජනක රෝගයන්ට සුදුසු ප්‍රතිකාර සෙවීම, කිතුල් කෙඳි නිස්සාරණය කිරීම, කෘතිම රා හඳුනාගැනීමට ක්‍රමවේදයක් සකස් කිරීම හා කිතුල් පිටි සකස්කර ගැනීම, සහ කිතුල් තවාන් 10ක් ස්ථාපිත කිරීම සඳහා කාර්මික තාක්ෂණික ආයතනය සමඟ එකඟතා ගිවිසුමක් 2021.04.30 දින අත්සන් කර ඇත. තව ද, ඉහත කාර්මික තාක්ෂණ ආයතන ව්‍යාපෘති යෝජනාව මඟින් කිතුල් පැළ තවාන් 10ක් ආරම්භ කිරීමට කටයුතු කිරීම.
- කිතුල් රා සම්බන්ධයෙන් පවතින නෛතික තත්ත්වය කලීනව ගැළපෙන පරිදි සංශෝධනය කිරීමට මුදල් අමාත්‍යාංශයට යෝජනා කිරීමෙන් අනතුරුව 05/2021 නම් සුරාබදු නිවේදනය 2021.01.07 දිනැතිව නිකුත් කර ඇත. තව ද කාර්මික පුහුණු ආයතනයේ සහයෝගයෙන් ස්වාභාවික හා කෘතීම රා (පොල්, කිතුල් සහ තල්) වෙන් කර හඳුනා ගැනීම සඳහා විද්‍යාත්මක ක්‍රමයක් සකස් කිරීමට ද විද්‍යාත්මක පරීක්ෂණ සිදු කරමින් පවතී.

වලල්ලාවිට කිතුල් පැල තවාන ආරම්භය





ස්වාභාවික හා කෘතීම රා (පොල්, කිතුල් සහ තල්) වෙන් කර හඳුනා ගැනීම සඳහා විද්‍යාත්මක ක්‍රමයක් සකස් කිරීම





කිතුල් ක්ෂේත්‍රය - විශේෂ සංවර්ධන ව්‍යාපෘතීන්හි ප්‍රගතිය

- වලපනේ ප්‍රාදේශීය ලේකම් කාර්යාලය කේන්ද්‍ර කර ගනිමින් කිතුල් සංවර්ධන නියමු ව්‍යාපෘතියක් දියත් කර තිබේ. තව ද, කිතුල් කර්මාන්තකරුවන් දිරිගැන්වීමේ අරමුණින් නුවරඑළිය දිස්ත්‍රික්කයේ වලපනේ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයේ ප්‍රතිලාභීන් 120 දෙනෙකුට කිතුල් කර්මාන්තය සඳහා අවශ්‍ය උපකරණ වන ප්ලාස්ටික් බාස්කට් එකක්, පැණි උණු කරන තාච්චියක්, තොප්පියක්, වැහි කබායක් සහ විදුලි පන්දම් 2021.01.24 දින බෙදා දීම සිදු කර ඇත.
- දේශීය පාරම්පරික ඥානය ජනගත කිරීමේ අරමුණු පෙරදැරි කරගෙන රජයේ වෛද්‍ය නිලධාරීන්ගේ සංගමය, සෞඛ්‍ය පරීක්ෂණ හා නවෝත්පාදන සංගමය සහ වෘත්තිකයන්ගේ ජාතික පෙරමුණ එක්ව 2021.01.16 දින අපේ කිතුල් විද්වත් කතිකාවත පවත්වන ලදී.

වලපනේ පැවති නියමු ව්‍යාපෘතිය







2.3 තල් ක්ෂේත්‍රය

2.3.1 ක්ෂේත්‍රය - හැඳින්වීම

ශ්‍රී ලංකාවේ තල් ගස් ව්‍යාප්තිය පහත සඳහන් වේ.

දිස්ත්‍රික්කය	තල් ගස් සංඛ්‍යාව
යාපනය	3,500,000
කිලිනොච්චිය	3,500,000
මන්නාරම	3,000,000
මුලතිව්	500,000
ත්‍රිකුණාමලය	210,000
මඩකලපුව	200,000
පුත්තලම	120,000
අම්පාර	40,000
අනුරාධපුරය	40,000
වවුනියාව	8,000
හම්බන්තොට	2,000
එකතුව	11,120,000

2021 වර්ෂය	
සමස්ත තල් ගස් ගණන	11,120,000
ප්‍රයෝජනයට ගන්නා තල් ගස් ගණන	1,112,000
කපන ලද තල් ගස් ගණන	15,000,000

තල් ආශ්‍රිත නිෂ්පාදන කර්මාන්තය ප්‍රවර්ධනය කිරීම සඳහා ඉහළ විභවතාවයක් පවතින කර්මාන්තයක් වශයෙන් හඳුනාගෙන ඇත. තල් ආශ්‍රිත ආහාරපාන නිෂ්පාදන හා වෙනත් විසිතුරු නිෂ්පාදන සඳහා දේශීය හා විදේශීය වශයෙන් ඉහළ ඉල්ලුමක් පවතී. ප්‍රධාන වශයෙන් ශ්‍රී ලංකාවේ උතුරු හා නැගෙනහිර පළාත් කේන්ද්‍ර කරගනිමින් තල් ශාක ව්‍යාප්තව ඇති අතර තල් ආශ්‍රිත කර්මාන්තයන් සිය ජීවනෝපාය කරගත් ජනතාව මෙම ප්‍රදේශවල බහුලව දැකිය හැක.

රජයේ ප්‍රතිපත්තිමය රාමුවට අනුව, දේශීය නිෂ්පාදන ප්‍රවර්ධනය ඔස්සේ ජනතා කේන්ද්‍රීය ආර්ථිකයක් බිහි කිරීමේදී ග්‍රාමීය ආර්ථිකය සවිබලගැන්වීමේ අරමුණෙන් යුතුව, තල් ක්ෂේත්‍රය සංවර්ධනය කිරීම සම්බන්ධයෙන් කටයුතු කිරීමට 2020.09.25 දිනැති අංක 2194/74 දරණ අතිවිශේෂ ගැසට් පත්‍රයෙන් වැවිලි අමාත්‍යාංශය යටතේ වූ රාජ්‍ය අමාත්‍යාංශයක් ලෙස පොල්, කිතුල් හා තල් වගා ප්‍රවර්ධනය හා ආශ්‍රිත කාර්මික භාණ්ඩ නිෂ්පාදන හා අපනයන විවිධාංගීකරණ රාජ්‍ය අමාත්‍යාංශය ස්ථාපිත කර ඇත. මෙම අමාත්‍යාංශය මඟින් තල් බෝගය ආශ්‍රිත ආර්ථිකමය විභවතාවයන් හඳුනා ගෙන එය පුළුල් කිරීම කෙරෙහි අවධානය යොමුව ඇත.

තල් ගසේ ප්‍රයෝජන සැකවින්..



පොල්, කිතුල් හා තල් වගා ප්‍රවර්ධනය හා ආශ්‍රිත කාර්මික භාණ්ඩ නිෂ්පාදන හා අපනයන විවිධාංගීකරණ රාජ්‍ය අමාත්‍යාංශය

2.3.2 ක්ෂේත්‍රය සංවර්ධනය කිරීම සඳහා වූ ඉදිරි දැක්ම

තල් ක්ෂේත්‍රය උපායමාර්ගික රාමුව 2021-2025

උපායමාර්ගික රාමුව 2021-2025

- **තල් වගාව ප්‍රතිසංස්කරණය හා සංවර්ධනය කිරීම සහ අවිධිමත් ගස් කැපීම පාලනය කිරීම**
- **ආදර්ශ ගොවිපලවල් පුනරුත්ථාපනය කිරීම හා ස්ථාපිත කිරීම**
- **තාක්ෂණ හුවමාරු වැඩසටහන (හස්ත කර්මාන්ත / තල් යුෂ /රා/ මී රා/ නාර් / දැව ආදී..)**
- **තල් නිෂ්පාදනය තුළින් යැපෙන්නන්ගේ ඉපැයීම් සහ ජීවන තත්වයන් වැඩි දියුණු කිරීම**
- **තල් පදනම් කරගත් නිෂ්පාදනවල නිෂ්පාදන ප්‍රමිතිය වැඩි දියුණු කිරීම.**
- **තල් නිෂ්පාදකයින් සහ පාරිභෝගිකයින් සඳහා අවස්ථා සහ සේවාවන් වැඩි දියුණු කිරීම.**
- **තල් පදනම් කරගත් නිෂ්පාදනවල අලෙවිකරණ ප්‍රමිතිය වැඩි දියුණු කිරීම.**
- **පර්යේෂණ හා තත්ත්ව පාලන සංවර්ධනය තුළින් ස්වාභාවික සම්පතක් වන තල් ගස් වඩා හොඳින් භාවිතා කිරීම**
- **තල් කර්මාන්තය ආශ්‍රිත යටිතල පහසුකම් සංවර්ධනය කිරීම සහ වත්කම් ප්‍රසම්පාදනය හා නඩත්තු කිරීම.**
- **තල් කර්මාන්තයේ අවශ්‍යතා සපුරාලීම සඳහා මානව සම්පත් සංවර්ධනය කිරීම**

තල් ක්ෂේත්‍රය සංවර්ධනය කිරීම සඳහා වූ පස් අවුරුදු උපායමාර්ගික සැලැස්ම යටතේ තල් වගාව ප්‍රතිෂ්ඨාපනය කිරීම හා සංවර්ධනය කිරීම, තල් ගස් කැපීම පාලනය කිරීම අපේක්ෂා කෙරේ. තල් ගස් පදනම් කරගත් කර්මාන්තවල තිරසාර සංවර්ධනය සඳහා නව තල් වගාවන් ඇති කිරීම, තල් ආශ්‍රිත නිෂ්පාදන පදනම් කර ගත් කර්මාන්ත සහ ව්‍යවසායකයින් හරහා නව ආදර්ශ ගොවිපලවල් ස්ථාපිත කිරීම, නීති විරෝධී තල් ගස් කැපීම වැළැක්වීම සඳහා කටයුතු කිරීමට අපේක්ෂිතය.

තාක්ෂණ හුවමාරු වැඩසටහන යටතේ ස්වයං රැකියාවන් සඳහා තල් ආශ්‍රිත හස්ත කර්මාන්ත පිළිබඳ පුහුණු වැඩසටහන් පැවැත්වීම, පුහුණුකරුවන් පුහුණු කිරීම, තල් යුෂ, තල් දැව පදනම් කරගත් නිෂ්පාදන සංවර්ධනය කිරීමට අපේක්ෂිතය. මේ සඳහා ලබන වර්ෂයේදී ප්‍රතිපාදන අපේක්ෂා කෙරේ.

එසේම, තල් නිෂ්පාදන කර්මාන්ත මත යැපෙන්නන්ගේ ඉපැයීම් සහ ජීවන තත්ත්වයන් වැඩි දියුණු කිරීම, තල් නිෂ්පාදනවල ප්‍රමිතිය ඉහළ නැංවීම සඳහා නිෂ්පාදන මධ්‍යස්ථාන වැඩි දියුණු කිරීම, කාර්මික මට්ටමේ නිෂ්පාදන ඉහළ නැංවීම හා ගුණාත්මකභාවය වැඩි දියුණු කිරීම අපේක්ෂා කෙරේ.

තල් නිෂ්පාදකයින් සඳහා අලෙවිකරණ අවස්ථා සහ පාරිභෝගිකයින් සඳහා ගුණාත්මක නිෂ්පාදන මිලදී ගැනීමේ අවස්ථා යන උපායමාර්ගය යටතේ නිෂ්පාදනයන්ගේ සහ අලෙවිකරණයේ ප්‍රමිතිය වැඩි දියුණු කිරීම, අලෙවිකරණ සේවයේ නව ක්‍රමවේදයන් හඳුන්වා දීම, දේශීය හා ජාත්‍යන්තර අලෙවිකරණ අවස්ථා පුළුල් කිරීම ආදී වැඩසටහන් සිදු කිරීමට බලාපොරොත්තු වේ.

තව ද, පර්යේෂණ හා තත්ත්ව පාලන සංවර්ධනය තුළින් තල් ක්ෂේත්‍රය ශක්තිමත් කිරීම සඳහා රසායනාගාර සේවා සැපයීමට රසායනාගාර පහසුකම් වැඩි දියුණු කිරීම, තත්ත්ව පාලනය හා තත්ත්ව සහතික කිරීම තුළින් තල් ආශ්‍රිත කර්මාන්තය සංවර්ධනය කිරීමට අපේක්ෂිතය.

යටිතල පහසුකම් සංවර්ධනය කිරීම, වත්කම් නඩත්තු කිරීම හා මනා ප්‍රසම්පාදන ක්‍රියාවලියක් තුළින් තල් ක්ෂේත්‍රයේ සංවර්ධනය අපේක්ෂා කරන අතර, ඒ යටතේ යටිතල පහසුකම් හඳුනා ගැනීම සහ සංවර්ධනය කිරීම, වත්කම් නැවත ස්ථාපිත කිරීම හා නඩත්තු කිරීම, කාර්ය මණ්ඩල අවශ්‍යතා සහ පුහුණු අවශ්‍යතා හඳුනා ගැනීම හා සැපයීම ආදී වැඩසටහන් සිදුකිරීමට යෝජිතය.

තල් ක්ෂේත්‍රය 2021- ඉලක්ක

තල් ක්ෂේත්‍රයේ සංවර්ධනය උදෙසා 2021 වර්ෂයේ දී පහත සඳහන් ව්‍යාපෘති කිරීමට රු.මි. 200 ක් අමාත්‍යාංශය වෙත හා රු.මි.40ක් තල් සංවර්ධන මණ්ඩලය වෙත ලැබිණි.

	ක්‍රියාත්මක කරනු ලබන ව්‍යාපෘතිය	2021 ප්‍රතිපාදන (රු.මි.)	ව්‍යාපෘතියේ අරමුණු	අපේක්ෂිත ප්‍රතිඵල/ ඉලක්ක	ක්‍රියාත්මක කරන ආයතනය
අයවැය යෝජනා මගින් වෙන් වූ ප්‍රතිපාදන					
1	දේශීය තල් කර්මාන්ත නිෂ්පාදන විවිධාංගී කරණයට යොමු කිරීම.	200.00	දේශීය තල් කර්මාන්තය සංවර්ධනය කිරීම හා තිරසර පැවැත්ම සහතික කරමින් විවිධාංගී කරණයෙන් යුතුව තල් කර්මාන්තය ප්‍රවර්ධනය කිරීම	• ආදර්ශ ගොවිපලවල් ස්ථාපිත කිරීම තුළින් නව තල් වගාවන් සංවර්ධනය කිරීම • පත්‍ර පදනම් කරගත් හස්ත කර්මාන්ත නිෂ්පාදනය සඳහා සහ තල් මැදීම සඳහා නිපුණතාව සහ ඵලදායිතාව වැඩි දියුණු කිරීම මූලික පුහුණු කිරීම හා උපකරණ ලබාදීම. • තාක්ෂණික උපකරණ සැපයීම සහ සමිතිවලට සහාය වීම, පවත්නා යන්ත්‍රෝපකරණ ප්‍රතිෂ්ඨාපනය කිරීම සහ නිෂ්පාදන මධ්‍යස්ථාන හා ගබඩා ගොඩනැගිලි ඉදිකිරීම. • පර්යේෂණ සංවර්ධනය, ජාත්‍යන්තර සහයෝගිතාවය මගින් කාර්ය මණ්ඩලයට පුහුණුව ලබා දීම, තල් ආශ්‍රිත පර්යේෂණ කිරීම හා දැනුම බෙදා හැරීම. • තල් පුහුණු ආයතනය ඉදි කිරීම් කටයුතු සම්පූර්ණ කිරීම. • නව කටිපහම් හල් පිහිටුවීම, උපාංග මිලදී ගැනීම, විකුණුම් ප්‍රවර්ධන කටයුතු වැඩි දියුණු කිරීම, අලෙවිකරණය හා සම්බන්ධ කාර්ය මණ්ඩල ධාරිතාව වැඩි දියුණු කිරීම සඳහා පුහුණු හා සියළුම දිස්ත්‍රික්ක ආවරණය වන පරිදි ප්‍රදර්ශන හා ජංගම විකුණුම් පැවැත්වීම.	තල් සංවර්ධන මණ්ඩලය

	ක්‍රියාත්මක කරනු ලබන ව්‍යාපෘතිය	2021 ප්‍රතිපාදන (රු.මී.)	ව්‍යාපෘතියේ අරමුණු	අපේක්ෂිත ප්‍රතිඵල/ ඉලක්ක	ක්‍රියාත්මක කරන ආයතනය
විශේෂ සංවර්ධන ව්‍යාපෘති					
1	රා බෝතල් කිරීම හා හකුරු නිෂ්පාදනය	5.00	දේශීය රා සහ හකුරු කර්මාන්තය සංවර්ධනය කිරීම	• ප්‍රතිලාභීන් 40 දෙනෙකු සඳහා සැකසුම් උපකරණ සහ යන්ත්‍රෝපකරණ මිලදී ගැනීම. • ප්‍රතිලාභීන් 140 දෙනෙකු සඳහා හකුරු සැකසුම් උපකරණ සහ යන්ත්‍රෝපකරණ මිලදී ගැනීම.	තල් සංවර්ධන මණ්ඩලය

2021 තල් ක්ෂේත්‍රයේ නිෂ්පාදන ඉලක්ක සැකෙවින්..

අංකය	විස්තරය	2021	ඉලක්ක 2021
01	හකුරු (MT)	55	70
02	තල් රා (LT)	10,050,000	10,500,000
03	පල්ප (MT)	50	60
04	තල් අල (MT)	350	400
05	තල් කෙඳි (MT)	67	75
06	අත්කම් (LKR Mn)	50	55

2.3.3 ක්ෂේත්‍රය සංවර්ධනය කිරීම සඳහා වූ අභියෝග

තල් වගාව සම්බන්ධ ගැටළු

- යටිතල පහසුකම් සංවර්ධනය සඳහා තල් ගස් බහුල ලෙස බිඳ හෙලීම නිසා පවතින තල් ගස් ප්‍රමාණය අඩුවීම.
- තල් ආශ්‍රිත නිෂ්පාදන සිදු කිරීම සඳහා අවශ්‍ය තල් අමුද්‍රව්‍ය ලබා ගැනීමේ හැකියාව වසරේ එක් කාල සීමාවකට (ඍතුවකට) පමණක් සීමා වීම.

තල් වගා කරුවන්හට තිබෙන ගැටළු

- සාම්ප්‍රදායිකව තල් ආශ්‍රිත කර්මාන්තයෙහි නිරත වීම සමාජයෙහි සීමිත ජන කොට්ඨාශයකට පමණක් සීමා වී පැවතීම හේතු කොටගෙන කර්මාන්තය ආශ්‍රිතව රැකියා උත්පාදනය සීමා වීම.
- ක්ෂේත්‍රයේ නිරත වීම සම්බන්ධයෙන් ජන සමාජයේ පවතින ඍණාත්මක ආකල්ප හේතුවෙන් තල් මැදීමේ කර්මාන්තයේ නියැලෙන තල් මැදුම්කරුවන් සංඛ්‍යාව සීඝ්‍ර ලෙස අඩුවීම.

තල් ආශ්‍රිත කර්මාන්ත හා සම්බන්ධ ගැටළු

- තල් කර්මාන්තයේ නිරත වන හස්ත කර්මාන්ත ශිල්පීන්ගේ සංඛ්‍යාව අවම මට්ටමක පැවතීම.
- තල් කර්මාන්තය ආශ්‍රිතව පුහුණු තාක්ෂණික නිලධාරීන් සහ තාක්ෂණික දැනුම අවම වීම.
- තල් කර්මාන්තය ආශ්‍රිතව නව තාක්ෂණික දැනුම භාවිතය අවම මට්ටමක පැවතීම.

තල් වෙළඳපොළ සම්බන්ධ ගැටළු

- කෘත්‍රිම ආහාර සඳහා වෙළෙඳපොළෙ හි වැඩි පරාසයක් වෙන්වීම හේතුවෙන් තල් පදනම් කරගත් ස්වාභාවික ආහාර සඳහා වෙළෙඳපොළහි පවතින අවකාශයන් අවම මට්ටමක පැවතීම.
- වෙළඳපොළෙහි පවතින අධික තරහකාරීත්වය හේතුවෙන් තල් ආශ්‍රිත කර්මාන්තයෙහි නිරත වන කර්මාන්තකරුවන් ශ්‍රම සූරා කෑමකට ලක් වීම.

තල් නිෂ්පාදන සඳහා අගය එකතු කළ නිෂ්පාදන සංවර්ධනය

තල් රා/මී රා පදනම් කරගත් නිෂ්පාදන:

- රස කැවිලි නිෂ්පාදන වර්ග: හකුරු, පැණි, තල් මී රා, තල් සූකිරි
- මධ්‍යසාර: අරක්කු, බෝතල් රා
- පැසුණු නිෂ්පාදනය: විනාකිරි

තල් යුෂ පදනම් කරගත් නිෂ්පාදන:

- බෝතල් කළ නිෂ්පාදන : තල් යුෂ, පිනාටු, පැණි පිනාටු, ජෑම්, කෝඩියල් බීම, ක්ෂණික බීම වර්ග, තල් අයිස්ක්‍රීම්, යෝගට්, දන්තාලේප, මුහුණු ආලේපන, සබන්, චොක්ලට්

තල් අල පදනම් කරගත් නිෂ්පාදන:

- තල් අල (අමු අල), වියළි අල, වියලන ලද අල පිටි, තම්බපු අල, බිස්කට්, කේක්, "ක්ෂණික කුල්" මිශ්‍රණය, තල් පිටි සුප්

තල් කොළ මත පදනම් වූ නිෂ්පාදන:

- සාම්ප්‍රදායික හස්ත කර්මාන්ත: කූඩ විවීම, පුටු විවීම, කජු, තේ සහ කුළුබඩු ඇසුරුම් සඳහා යොදාගන්නා පෙට්ටි, තොප්පි, පැදුරු, කොසු, දත් කූරු, ස්කී කූරු ආදිය, මල් පෝච්චි, විසිතුරු භාණ්ඩ, බිත්ති සැරසිලි වැනි නිෂ්පාදන

තල් කෙඳි පදනම් කරගත් නිෂ්පාදන:

- දෘඩ කෙඳි :බහු කාර්ය බුරුසු
- මධ්‍යම කෙඳි :පිරිසිදු කිරීම සහ ගෘහස්ථ බුරුසු
- මෘදු කෙඳි : හස්ත කර්මාන්ත සඳහා
- කොහු බත්: රෝපණ මාධ්‍ය හා ජල සංරක්ෂණ කටයුතු සඳහා

තල් දැව පදනම් කරගත් නිෂ්පාදන:

- වහල සෙවිලි කිරීම සඳහා දැව,
- ගෘහ භාණ්ඩ සෑදීම සඳහා,
- දර සඳහා දැව, විසිතුරු භාණ්ඩ සහ චිප් බෝඩ් සඳහා,

2.3.4 ක්ෂේත්‍රයේ සමස්ත ප්‍රගතිය

විස්තරය			වාර්ෂික ප්‍රගතිය		
			2019	2020	2021
තල් ආශ්‍රිත කර්මාන්ත කරුවන් සංඛ්‍යාව	රා/ මී රා ආශ්‍රිත නිෂ්පාදන	මදින්නන්	8,800	8,800	9,000
		කාර්මිකයන්	54	56	60
	කොළ ආශ්‍රිත නිෂ්පාදන (අත්කම්)	නිෂ්පාදකයන්	2,315	3,351	3,661
		කණ්ඩායම්	40	40	40
	අල ආශ්‍රිත නිෂ්පාදන	නිෂ්පාදකයන්	5,000	5,620	6,950
		කණ්ඩායම්	54	59	69
	යුෂ ආශ්‍රිත නිෂ්පාදන	නිෂ්පාදකයන්	500	550	620
		කණ්ඩායම්	40	45	52
	කෙඳි ආශ්‍රිත නිෂ්පාදන		4	5	6
	ආහාරමය නිෂ්පාදන [බීම වර්ග හා රස කැවිලි]		20	30	33
දේශීය ආදායම (රු.මි)	රා/ මී රා ආශ්‍රිත නිෂ්පාදන		1,400	1,700	1,780
	කොළ ආශ්‍රිත නිෂ්පාදන (අත්කම්)		61.3	47.29	48.20
	අල ආශ්‍රිත නිෂ්පාදන		54.0	56	60
	යුෂ ආශ්‍රිත නිෂ්පාදන		5.0	4.5	5.0
	කෙඳි ආශ්‍රිත නිෂ්පාදන		58.0	36	36
	ආහාරමය නිෂ්පාදන [බීම වර්ග හා රස කැවිලි]		17.72	8.50	9.28
අපනයන ආදායම (රු.මි)	රා/ මී රා ආශ්‍රිත නිෂ්පාදන		56	37	40
	කොළ ආශ්‍රිත නිෂ්පාදන (අත්කම්)		48.60	–	51
	අල ආශ්‍රිත නිෂ්පාදන		20	17	2,734.4
	යුෂ ආශ්‍රිත නිෂ්පාදන		5.00	4.00	5.39
	කෙඳි ආශ්‍රිත නිෂ්පාදන		දත්ත නොමැත		2090.10
	ආහාරමය නිෂ්පාදන [බීම වර්ග හා රස කැවිලි]		2.0	1	2.5

2.3.5 තල් සංවර්ධන මණ්ඩලය

දැක්ම

"ජීවනෝපාය සංවර්ධනය කිරීම සඳහා ජවයෙන් යුතු ක්ෂේත්‍රයක් වශයෙන් තල් අංශය සංවර්ධනය කිරීම."

මෙහෙවර

"දේශයේ දළ දේශීය නිෂ්පාදිතය වෙත සුවිශේෂී දායකයකු වනු පිණිස තිරසාර තල් කර්මාන්තය සංවර්ධනය කිරීම, ප්‍රවර්ධනය කිරීම, ජනප්‍රිය කරවීම හා නියාමනය කිරීම."

තල් සංවර්ධන මණ්ඩලය තල් වගාව සම්බන්ධයෙන් වූ කාර්යයන් ඉටු කරනු පිණිස 1971 අංක 46 දරණ ශ්‍රී ලංකා පොල් සංවර්ධන පනත 1975 අංක 24 දරන පනත මගින් කරන ලද සංශෝධනය ප්‍රකාරව 1978 අගෝස්තු 18 දින ප්‍රකාශයට පත් කරන ලද ගැසට් නිවේදනය මගින් සංස්ථාපනය කරන ලදී.

. එමගින්;

- තල් වගාවන් යථා තත්ත්වයට පත් කිරීම
- දැනට ඇති ආදර්ශ ගොවිපලවල් නවීකරණය කිරීම හා දියුණු කිරීම,
- හස්ත කර්මාන්ත පුහුණු වැඩසටහන් මෙහෙයවීම,
- විවිධ තල් භාණ්ඩ නිපදවීම, හා තල් නිපැයුම් ප්‍රවර්ධනය කිරීම,
- ආහාර නිෂ්පාදන හා වෙනත් නිෂ්පාදන සංවර්ධනය කිරීම ආශ්‍රිතව පර්යේෂණ පැවැත්වීම.
- කට්පහම් අලෙවිසල් පවත්වා ගෙන යාම
- තල් ක්ෂේත්‍රයේ සංවර්ධනය සඳහා වූ වැඩසටහන් ක්‍රියාත්මක වේ.

තල් කර්මාන්තය මත යැපෙන්නන් දහස් ගණනකගේ ජීවනෝපාය වැඩි දියුණු කිරීම සඳහා තල් ආශ්‍රිත පර්යේෂණ ක්‍රියාකාරකම් සඳහා පහසුකම් සැපයීමට තල් සංවර්ධන මණ්ඩලය යටතේ තල් පර්යේෂණ ආයතනය පිහිටුවා (PRI) ඇත. මෙම ආයතනය රසායනාගාර හතරකින් සමන්විත වේ.

- විශ්ලේෂණ රසායනාගාරය - නිෂ්පාදනවල තත්ත්වය ඉහළ නැංවීම සහ තල් ආශ්‍රිත ආහාර නිෂ්පාදන පිළිබඳ පෝෂණ සංරවක පිළිබඳ දැනුවත් කිරීම.
- ආහාර හා තාක්ෂණ විද්‍යාගාරය - ශ්‍රී ලංකා ප්‍රමිති ආඥාපනතට අනුව තල් ආශ්‍රිත රසවත් ආහාර ද්‍රව්‍ය නිසි පරිදි පෝෂ්‍යදායීව නිෂ්පාදනය කිරීම අරමුණු කරගත් පර්යේෂණ කාර්යයන් ඉටු කිරීම.
- ක්ෂුද්‍රජීව විද්‍යාගාරය -තල් දියර නිෂ්පාදන ඖෂධීය වැදගත්කම තහවුරු කිරීම සහ නිෂ්පාදන මත ක්ෂුද්‍රජීව විද්‍යාත්මක බලපෑම් තුළින් නිෂ්පාදනය වැඩි දියුණු කිරීම.
- අධි තාක්ෂණික රසායනාගාරය - ඉහළ තාත්වික ද්‍රවණික වර්ණාලක චුම්බක සහ වායු කෝෂය වැනි අධි තාක්ෂණිකක රසායනාගාර උපකරණවල ආධාරය සහිත ආහාරවල සංචලන ප්‍රමාණයන් හඳුනා ගැනීමට ක්‍රියා කරයි.

එපමණක් නොව PRI විසින්, පර්යේෂණ යන හුවමාරු කටයුතු, රසායනාගාර සේවා සැපයීම සහ පර්යේෂණ සොයා ගැනීම් ප්‍රකාශයට පත් කිරීම සහ බෙදා හැරීම වැනි ක්‍රියාකාරකම් රාශියකට සම්බන්ධ වී ඇත. රසායනාගාරය විසින් සපයනු ලබන පරීක්ෂණ වාර්තා අන්තර්ජාතිකව වලංගු වන පරිදි ආයතනය විසින් ISO ප්‍රතිනතය ලබාගැනීම සඳහා අවසන් පියවර ගෙන තිබේ.

තල් සංවර්ධන මණ්ඩලයේ පරමාර්ථ සහ අරමුණු

- තල් ආශ්‍රිත සංවර්ධනය සහ ප්‍රජාව නගා සිටුවීම සඳහා මනා සංවිධානමය පදනමක් සැපයීම.
- ශ්‍රී ලංකාවේ තල් ආශ්‍රිත කර්මාන්තයේ ක්ෂුද්‍ර ව්‍යාපාර, අතරමැදි කර්මාන්ත හා අධිතාක්ෂණ කර්මාන්ත මට්ටම්වල තිරසාර සංවර්ධනය සඳහා මනා විද්‍යාත්මක පදනමක් සැපයීම.
- අධි තාක්ෂණ සංවර්ධනය වෙත මහ පාදමින්, මූලික උපායමාර්ගික හා ව්‍යවහාරික පර්යේෂණ හරහා තල් සම්පත් සඳහා උචිත බෝග සංරක්ෂණ, පිරිසැකසුම් හා නිෂ්පාදන සංවර්ධන තාක්ෂණවේදයන් සංවර්ධනය කිරීම.
- සමෝධානිත සංවර්ධන ප්‍රයත්නයන් දායාද කරනු පිණිස දියුණු තල් ආශ්‍රිත බෝග හා පශු සම්පත් නිෂ්පාදන පද්ධති හා ක්‍රම සංවර්ධනය කිරීම.
- තල් සංවර්ධන මණ්ඩලය විසින් සංවර්ධනය කරන ලද, යැපෙන්නන්ට හා කර්මාන්තකරුවන්ට උචිත තාක්ෂණවේදයන් සඵලදායී ලෙස ලබා දීම.
- තල් ජාන සම්පත් සඳහා ජාතික සුරක්ෂිතාගාරයක් ලෙස සේවය සැලසීම සහ දියුණු රෝපණ ද්‍රව්‍ය නිපදවීම.
- ප්‍රායෝගික ව්‍යවහාරයන් සහිත ජනප්‍රිය අනුවර්තන ද සමගින් තල් පිළිබඳ තාක්ෂණික තොරතුරු රැස් කිරීම හා ප්‍රචලිත කිරීම.
- නිෂ්පාදන පද්ධති කළමනාකරණය කිරීම පිළිබඳ විවිධ විකල්ප තේරීම් බිහි කළ හැකි වන පරිද්දෙන් තල් ආශ්‍රිත ආයතනික සංවර්ධනය සහ උපකාර ප්‍රශස්ථ තත්ත්වයට ගෙන ඒම.

තල් සංවර්ධන මණ්ඩලය ක්‍රියාත්මක කරන ලද ව්‍යාපෘති වල මූල්‍ය හා භෞතික ප්‍රගතිය - (2021. 01.01 සිට 2021.12.31 දක්වා)

1: තල් සම්පත් සංවර්ධනය

වැඩසටහන	ඒකකය	භෞතික ඉලක්කය	භෞතික ප්‍රගතිය	මූල්‍ය ප්‍රගතිය (රු. මී)
තල් පුනර්වගාව හා සංවර්ධනය කිරීම	රෝපණය කළ යුතු බීජ ගණන	බීජ 500,000	80%	
පවතින ආදර්ශ ගොවිපල ප්‍රතිසංස්කරණය කිරීම	පවත්නා ආදර්ශ	ආදර්ශ ගොවිපලවල් ගණන -04	80%	1.95
එකතුව				1.95

තල් ගස් කර්මාන්තය නියාමනය සඳහා වන එකම රාජ්‍ය සංවිධානය වන තල් සංවර්ධන මණ්ඩලය (PDB) තල් වගාව ව්‍යාප්ත කිරීම සහ පවත්නා තල් ගස් ආරක්ෂා කිරීම කෙරෙහි පූර්ණ අවධානය යොමු කරයි. මේ සඳහා 2020 සැප්තැම්බර් සිට දෙසැම්බර් දක්වා කාලය තුළ වාර්ෂික රෝපණ වැඩසටහන ක්‍රියාත්මක කරන ලදී. මෙම වැඩසටහන සාර්ථක කර ගැනීම සඳහා ප්‍රාදේශීය ලේකම් කාර්යාල, තල් සංවර්ධන සමුපකාර සමිති, සමෘද්ධි සහ ප්‍රජා පාදක සංවිධාන තල් සංවර්ධන මණ්ඩලය සමඟ සහයෝගයෙන් කටයුතු කලහ.
ඊට අමතරව නීතිවිරෝධී තල් ගස් කැපීම පාලනය කිරීම සඳහා වූ දැනුවත් කිරීමේ වැඩසටහන් ද වාර්ෂිකව සංවිධානය කරන ලදී. අනවසරයෙන් ගස් කැපීමේ කටයුතු නියාමනය කිරීම සඳහා ක්ෂේත්‍ර කාර්ය මණ්ඩලය ප්‍රාදේශීය හා දිස්ත්‍රික් මට්ටමින් කටයුතු කරයි.

2. තාක්ෂණ හුවමාරු පුහුණු වැඩසටහන්

වැඩසටහන	ඒකකය	භෞතික ඉලක්කය	භෞතික ප්‍රගතිය	2021 .12.31 දිනට මූල්‍ය ප්‍රගතිය (රු. මී)
ස්වයංරැකියා සඳහා තල් ආශ්‍රිත හස්ත කර්මාන්ත පුහුණුව සඳහා	පුහුණුලාභීන්	325	3.00	1.18
තල් කර්මාන්තයේ අවශ්‍යතා සපුරාලීම සඳහා පුහුණුකරුවන් පුහුණු කිරීම තුළින් යටිතල පහසුකම් සංවර්ධනය	පුහුණු උපදේශකයින්	46	0.10	
දැව ආශ්‍රිත සැපයුම් නිෂ්පාදනය වැඩි දියුණු කිරීම	පුහුණුලාභීන්	75	0.15	
තල් ආශ්‍රිත ආහාර පුහුණු වැඩසටහන	පුහුණුලාභීන් 46	50	0.15	
තල් යුෂ ආහාර පුහුණු වැඩසටහන	පුහුණුලාභීන්	150	2.45	
එකතුව			**5.80**	**1.18**

තල් සංවර්ධන මණ්ඩලය තාක්ෂණික හුවමාරු පුහුණු වැඩසටහන් සඳහා ද සම්බන්ධ වේ. තල් කොළ හස්ත කර්මාන්ත පුහුණු වැඩසටහන් පවත්වනු ලබන්නේ තල් සංවර්ධන මණ්ඩලයෙහි හස්ත කර්මාන්ත උපදේශිකාවන් විසිනි. සම්මත හස්ත කර්මාන්ත පුහුණුව මාස 6 ක කාලයක් සඳහා පවත්වනු ලැබේ. නව නිර්මාණ හා කුසලතා හඳුන්වා දීම සඳහා හස්ත කර්මාන්ත නිෂ්පාදකයින්ට මාස 3 ක කාලයක් සඳහා විශේෂ පුහුණුවක් ද පවත්වනු ලැබේ. පුහුණුව සාර්ථකව නිම කිරීමෙන් පසු පුහුණුවන්නන් නිෂ්පාදන කණ්ඩායම් ලෙස සංවිධානය කරනු ලැබේ.

මෙම නව සහ තත්ත්ව වැඩි දියුණු කිරීමේ පුහුණු කිරීම් මඟින් නිෂ්පාදන කණ්ඩායම්වලට සහාය සහ ධෛර්යය ලැබේ. ඔවුන්ගේ ගුණාත්මක නිෂ්පාදන තල් සංවර්ධන මණ්ඩලය විසින් "කටිපහම්" හරහා අලෙවිකරණය සඳහා මිලදී ගනු ලැබේ. නිෂ්පාදන හා පර්යේෂණ ඒකකයේ සහාය ඇතිව හකුරු, පල්ප් සංරක්ෂණය සහ දැව පදනම් කරගත් නිෂ්පාදන නිපදවීම සඳහා පුහුණුව ද සංවිධානය කර ඇත. තල් සංවර්ධන සමුපකාර සමිතිවල ඉල්ලීම මත තල් මදින්නන් සඳහා පුහුණු වැඩසටහන් සංවිධානය කෙරේ.

3. තල් ආශ්‍රිත නිෂ්පාදනය වැඩි දියුණු කිරීම

වැඩසටහන	ඒකකය	භෞතික ඉලක්කය	භෞතික ප්‍රගතිය	2021 .12.31 දිනට මූල්‍ය ප්‍රගතිය (රු මි.ලි)
තල් ආශ්‍රිත නිෂ්පාදන තුළින් තල් කර්මාන්තයෙන් යැපෙන්නන්ගේ ඉපයීම් සහ ජීවන තත්ත්වය වැඩි දියුණු කිරීම	නවීකරණය කරන ලද නිෂ්පාදන මධ්‍යස්ථාන ගණන	06	90%	8.06
තල් පදනම් කරගත් නිෂ්පාදනවල නිෂ්පාදන ප්‍රමිතිය ඉහළ නැංවීම	කාර්යය මණ්ඩලය සඳහා පුහුණු වැඩසටහන්	06	70%	
තල් පදනම් කරගත් නිෂ්පාදනවල නිෂ්පාදන ප්‍රමිතිය ඉහළ නැංවීම	ප්‍රමිතිගත කළ යුතු නිෂ්පාදන මධ්‍යස්ථාන ගණන	03	60%	
එකතුව				8.06

තල් සංවර්ධන මණ්ඩලය විසින් ආහාරමය හා ආහාරමය නොවන විවිධාකාර තල් ආශ්‍රිත නිෂ්පාදනයන් සිදු කරයි. තල් ගස් පදනම් කරගත් නිෂ්පාදන කටයුතු මහජනතාව අතර ජනප්‍රිය වී ඇති අතර කුඩා කර්මාන්ත කිහිපයක් ද බිහි විය. තල් සංවර්ධන මණ්ඩලය නිෂ්පාදන මධ්‍යස්ථාන විසින් මෙම අංශය කෙරෙහි උනන්දුවක් දක්වන මහජනතාව සඳහා ආදර්ශ සහ සිය නිපැයුම් ප්‍රදර්ශනය කළ හැකි නිෂ්පාදන මධ්‍යස්ථාන ලෙස ක්‍රියා කරයි. නව යන්ත්‍රෝපකරණ සහ මෙවලම් හඳුන්වාදීම නිසා ගෘහාශ්‍රිත මට්ටමේ ආහාර නිෂ්පාදන ක්‍රියාකාරකම් සුළු කාර්මික පරිමාණය දක්වා වෙනස් විය. එමඟින් සෞඛ්‍යාරක්ෂිත ආහාර නිෂ්පාදනයට මග පෑදෙනු ඇත.

4. කටිපහම් හරහා අලෙවිකරණ ජාලය වැඩි දියුණු කිරීම

වැඩසටහන	**ඒකකය**	**භෞතික ඉලක්කය**	**භෞතික ප්‍රගතිය**	**2021 .12.31 දිනට මූල්‍ය ප්‍රගතිය (රු මි.ලි)**
කටිපහම් හරහා අලෙවිකරණ කටයුතු වැඩි දියුණු කිරීම	කටිපහම් විකුණුම් මධ්‍යස්ථාන ගණන	10	80%	5.98
ප්‍රචාරක වැඩසටහන්	අපනයනකරුවන්ගේ රැස්වීම්, ප්‍රදර්ශනයන්, ජංගම විකුණුම් සහ පොළවල් ගණන		80%	
එකතුව				5.98

තල් සංවර්ධන මණ්ඩලය සිය නිෂ්පාදන අලෙවි කිරීම පමණක් නොව, නිෂ්පාදකයින්ගෙන් භාණ්ඩ මිලදී ගෙන එහි “කටිපහම්” ලෙස නම් කර ඇති අලෙවිසැල් දහතුන වන යාපනය, කොළඹ, ත්‍රිකුණාමලය, මඩකලපුව, කල්මුනේ, වවුනියාව, හම්බන්තොට සහ මන්නාරම් යන නගරවල ක්‍රියාත්මක වන “කටිපහම්” විකුණුම් මධ්‍යස්ථාන හරහා අලෙවි කෙරේ. එමඟින් තල් ගස් නිෂ්පාදකයින් දහස් ගණනකට වාර්ෂිකව තම නිෂ්පාදන අලෙවි කිරීමෙන් ප්‍රතිලාභ හිමිවේ. පලතුරු යුෂ, හකුරු, පැණි සහ කෝඩියල් අපනයනය වැඩි කිරීමෙන් අපනයන ආදායම ද වැඩි වේ. තල් ගස් නිෂ්පාදන අලෙවිය වැඩි කිරීම සඳහා මීගමුව, කොළඹ සහ සමුපකාර වෙළඳසැල්වල නව තල් ප්‍රදර්ශනාගාර පිහිටුවා ඇත.

5. පර්යේෂණ සහ තත්ත්ව පාලනය (තල් පර්යේෂණ ආයතනය)

වැඩසටහන	ඒකකය	භෞතික ඉලක්කය	2021 ප්‍රතිපාදන (රු.මි.)	2021 .12.31 දිනට භෞතික ප්‍රගතිය	2021 .12.31 දිනට මූල්‍ය ප්‍රගතිය (රු මි.)
කර්මාන්තයට ගුණාත්මක හා යාවත්කාලීන රසායනාගාර සේවා සැපයීම සඳහා රසායනාගාර පහසුකම් වැඩි දියුණු කිරීම.(උදා-විද්‍යාගාර උපකරණ, වීදුරු භාණ්ඩ, සේවා, ක්‍රමාංකයන්)	ආහාර කර්මාන්ත සඳහා ලබා දී ඇති සමස්ත පරීක්ෂණ වාර්තා ගණන	05	1.50	85%	4.94
අගය එකතු කිරීම පිළිබඳ පර්යේෂණ වැඩසටහන් පැවැත්වීම නව නිෂ්පාදන සංවර්ධනය	පර්යේෂණ වැඩසටහන් ගණන	08	1.00	100%	
පර්යේෂණ ව්‍යාපෘතිය (වැඩමුළු පුහුණු කිරීම් සහ බාහිර ක්‍රියාකාරකම්)	පවත්වන ලද වැඩසටහන් ගණන	10	0.90	80%	
ප්‍රකාශන හා විමර්ශන ද්‍රව්‍ය	පර්යේෂණ ප්‍රකාශ ගණන	05	0.10	90%	
තල් පර්යේෂණ ආයතනයෙහි (PRI) යටිතල පහසුකම් වැඩි දියුණු කිරීම	සම්පූර්ණ කරන ලද පර්යේෂණ ගණන	15	1.00	70%	
PRI කාර්යය මණ්ඩලය සඳහා ධාරිතා වර්ධන පුහුණු කිරීම	පුහුණු කළ යුතු කාර්යය මණ්ඩල සංඛ්‍යාව	05	0.50	70%	
ක්ෂුද්‍ර ජීව විද්‍යාගාරය සඳහා ISO ප්‍රතිතනය	අවසන් කරන ලද පර්යේෂණ ගණන	05	1.00	85%	
එකතුව			**6.00**		**4.94**

තල් සම්පත් භාවිතා කරමින් ක්ෂණික අත් සෝදන විෂබීජ නාශක දියර සකස් කිරීම, රා අවසාදිත භාවිතා කරමින් කුකුළු ආහාර නිෂ්පාදනය කිරීම, ප්‍රනීත තල් වයින් සකස් කිරීම, තල් ගෙඩියෙන් ලබා ගන්නා පල්ප සහ කෝමාරිකා මද භාවිතයෙන් ප්‍රතිඔක්සිකාරකවලින් පොහොසත් සබන් සකස් කිරීම සහ ප්‍රමිතිකරණය කිරීම, තල් ගෙඩියෙන් ලබා ගන්නා පල්ප මගින් නව දන්තාලේප සැකසීම හා ප්‍රමිතිකරණය කිරීම, තල් ගෙඩියෙන් ලබා ගන්නා පල්ප පදනම් කරගත් සෝස්වල ක්ෂුද්‍රජීවී, භෞතික රසායනික හා සංවේදක ඇගයීම, ඉසිරුම් වියළනයන් භාවිතා කරමින් තල් පල්ප පිටි සැකසීම සහ එහි පෝෂණ ගුණය විශ්ලේෂණය, විටමින් සංයුතිය, ඛනිජ සංයුතිය, ප්‍රතිඔක්සිකාරක ගුණ සහ තල් පල්ප නිෂ්පාදනවල සම්පූර්ණ ෆිනෝලික් අන්තර්ගතය කෙරෙහි සැකසීමේ ක්‍රමවල බලපෑම, තල්පැණි භාවිතා කර රස කළ තේ සිරප් සැකසීම හා ප්‍රමිතිකරණය කිරීම, තල් අල තැම්බීමෙන් තොරව තින්ත රස නොමැතිව පිටි සඳහා ඵලදායීව සැකසීමේ ක්‍රම නිරණය කිරීම යන ක්ෂේත්‍රවල පර්යේෂණ අධ්‍යයන දහයක් සිදු කෙරෙමින් පවතී.



ආයතන වත්කම් සංවර්ධනය

වැඩසටහන	ඒකකය	භෞතික ඉලක්කය	භෞතික ප්‍රගතිය	මූල්‍ය ප්‍රගතිය (රු. මි)
යටිතල පහසුකම් සංවර්ධනය	කාර්යාල ගණන සහ වැඩි දියුණු කරන ලද	02	95%	
වත්කම් නැවත ස්ථාපනය කිරීම හා නඩත්තු කිරීම	කාර්යාල ගණන	12	90%	6.4
මානව සම්පත් සංවර්ධන මාණ්ඩලික පුහුණු වැඩසටහන	කාර්ය මණ්ඩල පුහුණු වැඩසටහන්	10	80%	
එකතුව				**6.4**

2021.12.31 දිනට මූල්‍ය ප්‍රගතිය

මාස	ප්‍රාග්ධන		පුනරාවර්තන		අතැති බිල්
	ප්‍රතිපාදන [රු. මි]	ලැබීම් [රු. මි]	ප්‍රතිපාදන [රු. මි]	ලැබීම් [රු. මි]	[රු. මි]
ජන - දෙසැ	40	28.34	130	130	0.75

තල් නව වගාව තොරතුරු

අංක	දිස්ත්‍රික්කය	2019 දෙසැ. 31 දක්වා		2020 දෙසැ. 31 දක්වා		2021 දෙසැ. 31 දක්වා	
		බීජ	හෙක්	බීජ	හෙක්	බීජ	හෙක්
1	යාපනය	101,950	127.44	109,000	136.25	100,000	125
2	කිලිනොච්චිය	10,000	12.5	12,500	15.63	75,000	93.75
3	මුලතිවු	10,000	12.5	27,750	34.68	125,000	156.50
4	වව්නියාව	5,000	6.25	91,000	113.75	150,000	187.50
5	මන්නාරම	10,000	12.5	89,221	111.53	75,000	93.75
6	මඩකලපුව	40,000	50	39,000	48.75	100,000	125
7	ත්‍රිකුණාමලය	5,000	6.25	2,500	3.13	100,000	125
8	අම්පාර	5,000	6.25	10,000	12.50	50,000	62.5
9	හම්බන්තොට	40,500	50.63	-	-	50,000	62.5
10	පුත්තලම	-	-	-	-	75,000	93.75
	එකතුව	186,950	284	380,971	476.22	875,000	1,125.25

මූලාශ්‍ර -තල් සංවර්ධන මණ්ඩලය

2021 වර්ෂයේ දී තල් ක්ෂේත්‍රයේ උන්නතිය සඳහා තල් සංවර්ධන මණ්ඩලය විසින් ගත් ක්‍රියාමාර්ග

නව කට්පහම් අලෙවි මධ්‍යස්ථාන විවෘත කිරීම

- කොවිඩ්-19 තත්ත්ව යටතේ වුව ද තල් ආශ්‍රිත නිෂ්පාදන ජනතාව අතරට ගෙන යාම සඳහා ඊ-කට්පහම් යාන්ත්‍රණය ක්‍රියාත්මක කිරීම. දේශීය තල් ආශ්‍රිත නිෂ්පාදන ප්‍රදර්ශනය කිරීම සහ අලෙවිය ඉහළ නැංවීම සඳහා සුපිරි වෙළඳසැල් ජාලයන් සමඟ එක්ව කටයුතු කිරීම.
- උත්සව සමයන්හි දී කට්පහම් අලෙවි මධ්‍යස්ථානවල විශේෂ ප්‍රවර්ධන වැඩසටහන් ක්‍රියාත්මක කිරීම සහ තල් ආශ්‍රිත නිෂ්පාදන මහජනතාව අතර ප්‍රචලිත කිරීමට දිවයින පුරා පැවැත්වෙන විවිධ ප්‍රදර්ශනවලට සහභාගී විය.



- තව ද දැනට පවතින කට්පහම් අලෙවි මධ්‍යස්ථාන වැඩි දියුණු කිරීම සහ විවිධ තල් නිෂ්පාදන සඳහා අත්පත්‍රිකා ලබා දීම ද සිදු කරයි.

තල් ආශ්‍රිත හස්ත කර්මාන්ත සහ තල් රා පුහුණු වැඩසටහන් පැවැත්වීම

- තල් සංවර්ධන සමූපකාර සමිති සඳහා රා බෝතල් කිරීමේ කර්මාන්ත ශාලා සහ රා අලෙවි කිරීමේ මධ්‍යස්ථාන ක්‍රියාත්මක කිරීමට පහසුකම් සැලසීමට සුරාබදු දෙපාර්තමේන්තුව, දිසාපතිවරුන් සහ ප්‍රාදේශීය බලධාරීන් සමඟ සාකච්ඡා කරමින් සමිති සඳහා අවශ්‍ය පහසුකම් සැපයීම



තල් යුෂ සාරයෙන් සකස්කරන ලද නිෂ්පාදනය වාණිජකරණය



- තල් ආශ්‍රිත නිෂ්පාදනයන් වන අයිස් ක්‍රීම්, දත් පේස්ට්, වයින්, සෝස්, රූපලාවණ්‍ය නිෂ්පාදන වාණිජකරණය සඳහා පුද්ගලික සමාගම්වල දායකත්වය ලබා ගැනීම

යාපනයේ කයිතඩ්හි තල් පුහුණු ආයතනයක් (පීටීඅයි) පිහිටුවීම

- තල් පුහුණු මධ්‍යස්ථානයෙහි ඉදිකිරීමේ කටයුතු 50% පමණ මේ වන විට අවසන්ව ඇත. මෙම පුහුණු මධ්‍යස්ථානය මගින් තල් ආශ්‍රිත නිෂ්පාදන පිළිබඳව නව පර්යේෂණ සහ සොයාගැනීම් සිදු කිරීමට ද එමගින් ව්‍යවසායකයින්ගේ දැනුම වර්ධනය කිරීමට අපේක්ෂිතය. තව ද, තල් ආශ්‍රිත නිෂ්පාදන පිළිබඳව වෘත්තීය පුහුණු පාඨමාලාවන් සිදුකිරීමට ද සැලසුම් කර ඇත.
- එම වෘත්තීය පුහුණු පාඨමාලාවන් ක්‍රියාත්මක කිරීම සඳහා වෘත්තීය පුහුණු අධිකාරිය(VTA) සහ තල් සංවර්ධන මණ්ඩලය අතර අවබෝධතා ගිවිසුමක් ද මේ වන විට ද අත්සන් කර ඇත. තල් පර්යේෂණායතනය මගින් මෙහෙයවන එම පුහුණු වැඩසටහන්හී විෂය පථයට තල් ආශ්‍රිත ආහාර ආහාර සකස් කිරීම, තාක්ෂණ වැඩසටහන්, මදින්නන් පුහුණු කිරීම, නිෂ්පාදනවල ගුණාත්මකභාවය ඉහළ නැංවීම පිළිබඳ වැඩසටහන් ද ඇතුළත් වේ. ජාතික ආදායම ඉහළ නැංවීමේ අරමුණින් මෙම වෘත්තීය පාඨමාලා හැදෑරීමට ජාත්‍යන්තර සිසුන්ට ද අවස්ථා ලබා දෙනු ඇත.

සෙල්වරි තන්තු නිෂ්පාදන මධ්‍යස්ථානය ප්‍රතිසංස්කරණය

- තල් අපනයනකරුවන් සමඟ එක්ව සෙල්වරි තන්තු නිෂ්පාදන මධ්‍යස්ථානය ප්‍රතිසංස්කරණය කිරීමට පියවර ගන්නා ලදී.

තික්කම ස්කාගාරය ප්‍රතිෂ්ඨාපනය කිරීම

- තික්කම ස්කාගාරය ප්‍රතිෂ්ඨාපනය කිරීම, පරිපාලන ගොඩනැගිල්ල, ජල ටැංකිය සහ ගේට්ටු ඉදි කිරීමේ කටයුතු සිදු කරමින් පවතියි

තල් ආශ්‍රිත අපනයන සහයෝගීතාවය ඉහළ නැංවීම

- තල් සංවර්ධන මණ්ඩලය මගින් තල් ආශ්‍රිත අපනයනකරුවන්ගේ අලෙවි ජාලය ශක්තිමත් කිරීමේ අරමුණින් රැස්වීමක් 2021 වර්ෂයේ මැයි මස කොළඹ දී පවත්වන ලදී

තල් නිෂ්පාදන සඳහා ජාත්‍යන්තර අලෙවිකරණ අවස්ථා ලබා කර ගැනීම

- ප්‍රංශය සහ ශ්‍රී ලංකාව අතර විදේශ සහයෝගීතා තහවුරු කිරීමේ අරමුණින් ගරු රාජ්‍ය අමාත්‍යතුමා සහ තල් සංවර්ධන මණ්ඩලයේ නිලධාරීන්ගේ සහභාගිත්වයෙන් 2021 සැප්තැම්බර් මස සිදු කරන ලද නිල සංචාරයේදී ශ්‍රී ලාංකික වෘත්තිකයින් සඳහා පුහුණු අවස්ථා සහ සාම්ප්‍රදායික හා අගය එකතු කළ නිෂ්පාදන සඳහා අලෙවි කිරීමේ අවස්ථා ප්‍රවර්ධනය සඳහා මෙම සංචාරයේදී පැරිසියේ ගුවායාපි ප්‍රදර්ශනාගාරයේ ඉහළ කළමනාකාරිත්වය අතර හමුවක් පවත්වන ලදී.

- ප්‍රංශයේ ගුවායාපි හි පොල්, තල් සහ කිතුල් ආශ්‍රිත නිෂ්පාදන ප්‍රවර්ධනය කර විකිණීමට කටයුතු සම්පාදනයට ද පියවර ගන්නා ලදී. තව ද තල් ආශ්‍රිත නිෂ්පාදන ප්‍රංශය තුළ අලෙවිය ප්‍රවර්ධනය සඳහා අවබෝධතා ගිවිසුමක් ද අත්සන් කරන ලදී.





3 2021 දෙසැම්බර් මස 31 දිනෙන් අවසන් වූ වසර සඳහා වන සමස්ත මූල්‍ය කාර්යසාධනය

3.1. මූල්‍ය ප්‍රගතිය පිළිබඳ ප්‍රකාශය

2021 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා
මූල්‍ය කාර්යසාධන ප්‍රකාශය

අයවැය 2021		සටහන	2021	සැලකිය යුතු ලෙස වෙනස් කළ 2020	
-	ආදායම් ලැබීම්			-	
-	ආදායම් බදු	1	-	-	
-	දේශීය භාණ්ඩ හා සේවා මත බදු	2	-	-	එකඟ-1
-	ජාත්‍යන්තර වෙළඳාම් මත බදු	3	-	-	
1,360,000	බදු නොවන ආදායම් හා වෙනත්	4			
1,360,000	මුළු ආදායම් ලැබීම් (අ)		-	-	
-	ආදායම් නොවන ලැබීම්		-	-	
-	භාණ්ඩාගාර අයිති		1,045,858,000	13,532,000	එකඟ-3
-	කැන්පතු		43,412	176,250	එකඟ-4
-	අක්තිකාරම් ගිණුම්		4,069,274	358,339	එකඟ-5
	වෙනත් ප්‍රධාන ලෙජර් ගිණුම් ලැබීම්		-	-	
-	මුළු ආදායම් නොවන ලැබීම් (ආ)		1,049,970,686	14,066,589	
1,360,000	මුළු ආදායම් ලැබීම් සහ ආදායම් නොවන ලැබීම් ඇ = (අ)+(ආ)		1,049,970,686	14,066,589	
	භාණ්ඩාගාරයට ප්‍රේෂණ (ඇ)		-	-	
1,360,000	ඉද්ධ ආදායම් ලැබීම් සහ ආදායම් නොවන ලැබීම් ඉ = (ඇ)-(ඇ)		1,049,970,686	14,066,589	
	අඩු කළා : වියදම්				
-	ප්‍රතිලාභ		-	-	
	වැටුප්, වේතන සහ අනෙකුත් සේවක				
65,800,000	ප්‍රතිලාභ	5	45,401,987	10,307,489	
51,300,000	අනෙකුත් භාණ්ඩ හා සේවා	6	63,232,810	7,407,020	එකඟ-2(ii)
114,000,000	සහනාධාර, ප්‍රදාන සහ මාරුකිරීම්	7	1,031,494,871	1,024,500,000	
-	පොළී ගෙවීම්	8	-	-	
-	වෙනත් ප්‍රතිලාභ වියදම්	9	-	-	
231,100,000	මුළු ප්‍රතිලාභ වියදම් (ඊ)		1,140,129,668	1,042,214,509	
	මූලධන වියදම්				
	මූලධන වත්කම් ප්‍රතිස්ථාපනය හා				
7,000,000	වැඩිදියුණු කිරීම්	10	14,771,684	214,220	
7,500,000	මූලධන වත්කම් අත්පත් කර ගැනීම්	11	11,499,790	1,773,130	
1,135,000,000	ප්‍රාග්ධන මාරුකිරීම්	12	862,324,000	932,007,992	එකඟ-2(ii)
-	මූල්‍ය වත්කම් අත්පත් කර ගැනීම	13	-	-	
1,000,000	භෞතික වර්ධනය	14	4,876,190	-	
154,000,000	වෙනත් මූලධන වියදම්	15	674,606,826	76,505,241	
1,304,500,000	මුළු මූලධන වියදම් (උ)		1,568,078,490	1,010,500,583	
	කැන්පතු ගෙවීම්		17,825	175,000	එකඟ-4
	අක්තිකාරම් ගෙවීම්		3,149,588	5,367,507	එකඟ-5
	වෙනත් ප්‍රධාන ලෙජර් ගිණුම් ගෙවීම්		-	-	
	ප්‍රධාන ලෙජර් වියදම් (ඌ)		3,167,413	5,542,507	
1,535,600,000	මුළු වියදම් එ = (ඊ+උ+ඌ)		2,711,375,571	2,058,257,599	
(1,534,240,000)	දෙසැම්බර් 31 දිනට ශේෂය ඒ = (ඉ-එ)		(1,661,404,885)	(2,044,191,010)	
(1,534,240,000)	අලුත් කැසඳුම් ප්‍රකාශය අනුව ශේෂය		(1,661,404,885)	-	එකඟ-7
	දෙසැම්බර් 31 දිනට අයිති ශේෂය		-		එකඟ-3
			(1,661,404,885)	-	

1

3.2. මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශය

	සටහන	2021	2020
මූල්‍ය නොවන වත්කම්			
දේපළ, පිරියත හා උපකරණ	ඒසීඒ-6	17,336,272.00	1,773,130.00
මූල්‍ය වත්කම්			
අත්තිකාරම් ගිණුම්	ඒසීඒ-5/5(ඒ)	4,089,481.00	5,009,167.00
මුදල් හා මුදල් සමාන දෑ	ඒසීඒ-3		
මුළු වත්කම්		21,425,753.00	6,782,297.00
ශුද්ධ වත්කම් / ස්කන්ධය			
භාණ්ඩාගාරය වෙත ශුද්ධ වත්කම්		4,062,619.00	5,007,892.00
දේපළ පිරියත හා උපකරණ සංචිතය		17,336,272.00	1,773,130.00
කුලී හා වැඩ අත්තිකාරම් සංචිතය	ඒසීඒ-5(බී)		
ජංගම වගකීම්			
තැන්පතු ගිණුම්	ඒසීඒ-4	26,862.00	1,275.00
අග්‍රිම ශේෂය	ඒසීඒ-3	-	-
මුළු වගකීම්		21,425,753.00	6,782,297.00

පිටු අංක7 සිට 73 දක්වා ඒසීඒ 1 සිට ඒසීඒ 7 දක්වා වූ ආකෘති පත්‍රවලින් ඉදිරිපත් කෙරෙන ගිණුම් තොරතුරු සහ සටහන් පිටු අංක 74 සිට 82 දක්වා ඇතුළත් ගිණුම් සටහන් විස්තර ද මෙම අවසන් ගිණුමෙහිම අන්තර්ගත කොටස් වේ. මෙම මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම පොදුවේ පිළිගත් ගිණුම් මූලධර්මවලට අනුකූලව සිදුකර ඇති අතර මෙහිදී මූල්‍ය ප්‍රකාශයන්හි සටහන් මගින් හෙළදිරව කර ඇති පරිදි වඩාත් සුදුසු ගිණුම්කරණ ප්‍රතිපත්ති භාවිත කර ඇත. ඉහත අවසන් ගිණුමෙහි සඳහන් සංඛ්‍යා, ඊට අදාළ ගිණුම් සටහන් හා අනෙකුත් ගිණුම් තොරතුරු භාණ්ඩාගාර ගිණුම් පොත් සමඟ සැසඳීම් කර ඇති බවටත් ඒවා එම සංඛ්‍යා සමඟ එකඟ වන බවටත් මෙයින් සහතික කරමු.

මූල්‍ය පාලනය සඳහා ඵලදායී අභ්‍යන්තර පාලන පද්ධතියක් වාර්තාකරණ ආයතනය තුළ පවතින බවත් මූල්‍ය පාලනය සඳහා අභ්‍යන්තර පාලන පද්ධතියේ සඵලතාවය අධීක්ෂණය කිරීමටත් ඒ අනුව එම පද්ධති ඵලදායී ලෙස ක්‍රියාත්මක කිරීමට අවශ්‍ය පරිදි වෙනස් කිරීම් සිදුකිරීමට වරින් වර සමාලෝචන සිදුකරන බවත් මෙයින් සහතික කරමු.

.....	.....	.....
ප්‍රධාන ගණන්දීමේ නිලධාරි	ගණන්දීමේ නිලධාරි	ප්‍රධාන මූල්‍ය නිලධාරි/ප්‍රධාන ගණකාධිකාරි/ අධ්‍යක්ෂ (මුදල්)/ කොමසාරිස් (මුදල්)
නම : රවීන්ද්‍ර හේවාවිතාරණ ලේකම්	නම : කිල්ලු හේවාවිතාන ලේකම්	නම : පොල්, කිතුල් හා තල් වගා ප්‍රවර්ධනය හා ආශ්‍රිත කාර්මික භාණ්ඩ නිෂ්පාදන හා අපනයන විවිධාංගීකරණ රාජ්‍ය අමාත්‍යාංශය නො.239/1, කන්දුවත්ත පාර, පැලවත්ත, බත්තරමුල්ල.
තනතුර : වැවිලි අමාත්‍යාංශය 11 වන මහල,	පොල්, කිතුල් හා තල් වගා ප්‍රවර්ධනය හා ආශ්‍රිත කාර්මික භාණ්ඩ නිෂ්පාදන හා අපනයන විවිධාංගීකරණ රාජ්‍ය අමාත්‍යාංශය නො.239/1, කන්දුවත්ත පාර, පැලවත්ත, බත්තරමුල්ල.	
දිනය : [illegible] බත්තරමුල්ල.	දිනය : [illegible]	දිනය : [illegible] නො.239/1, කන්දුවත්ත පාර, පැලවත්ත, බත්තරමුල්ල.

2

3.3 මුදල් ප්‍රවාහ පිළිබඳ ප්‍රකාශය

ඒසීඒ-සී

2021 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා

මුදල් ප්‍රවාහ ප්‍රකාශය

		තත්‍ය
		නැවත ගලපන ලද
	2021	**2020**
	රු.	රු.
මෙහෙයුම් ක්‍රියාකාරකම්වලින් ජනිත වූ මුදල් ප්‍රවාහයන්		
මුළු බදු ලැබීම්	-	-
ගාස්තු, අධිභාර, දඩමුදල් සහ බලපත්‍ර	-	-
ලාභ	-	-
ආදායම් නොවන ලැබීම්	1,612,947	-
වෙනත් ආදායම් ශීර්ෂ වෙනුවෙන් එකතු කරන ලද ආදායම්	-	-
අග්‍රිම ලැබීම්	1,045,858,000	-
අත්තිකාරම් අයකර ගැනීම්	1,456,306	-
තැන්පතු ලැබීම්	43,412	-
මෙහෙයුම් ක්‍රියාකාරකම්වලින් ජනිත වූ මුදල් ප්‍රවාහය (අ)	**1,048,970,665**	**13,532,000**
අඩුකළා : මුදල් වැය කිරීම්		
පුද්ගල පඩිනඩි හා මෙහෙයුම් වියදම්	736,999,447	-
සහනාධාර සහ මාරුකිරීම්	9,694,871	7,006,428
වෙනත් වැය ශීර්ෂ වෙනුවෙන් දරන ලද වියදම්	285,000,000	-
භාණ්ඩාගාරයට පියවන ලද අග්‍රිම	-	-
අත්තිකාරම් ගෙවීම්	1,486,549	-
තැන්පතු ගෙවීම්	17,825	-
මෙහෙයුම් ක්‍රියාකාරකම් සඳහා වැය කරන ලද මුදල් ප්‍රවාහය (ආ)	**1,033,198,692**	**7,006,428**
මෙහෙයුම් ක්‍රියාකාරකම්වලින් ජනිත වූ ශුද්ධ මුදල් ප්‍රවාහය (ඇ)=(අ)-(ආ)	**15,771,973**	**6,525,572**
ආයෝජන ක්‍රියාකාරකම්වලින් ජනිත වූ මුදල් ප්‍රවාහයන්		
පොළී	-	-
ලාභාංශ	-	-
හිමිකම් ඉවත්වීමේ ප්‍රතිපාදන හා භෞතික වත්කම් විකිණීම්	-	-
උපණය අයකර ගැනීම්	-	-
ආයෝජන ක්‍රියාකාරකම්වලින් ජනිත වූ මුදල් ප්‍රවාහය (ඈ)	**-**	**-**
අඩුකළා : මුදල් වැය කිරීම්		
භෞතික වත්කම් ඉදිකිරීම් හෝ මිලදී ගැනීම් හා වෙනත්		
ආයෝජන අත්කර ගැනීම්	15,771,973	5,818,899
අත්තිකාරම් ගෙවීම්		706,673
ආයෝජන ක්‍රියාකාරකම් සඳහා වැය කරන ලද මුළු මුදල් ප්‍රවාහය (ඉ)	**15,771,973**	**-**
ආයෝජන ක්‍රියාකාරකම්වලින් ජනිත වූ ශුද්ධ මුදල් ප්‍රවාහය (ඊ)=(ඇ)-(ඉ)	**(15,771,973)**	**-**
මෙහෙයුම් හා ආයෝජන ක්‍රියාකාරකම්වලින් ජනිත වූ ශුද්ධ මුදල් ප්‍රවාහය (උ)=(ඇ) + (ඊ)	**-**	**6,525,572**
මූල්‍ය ක්‍රියාකාරකම්වලින් ජනිත වූ මුදල් ප්‍රවාහයන්		
දේශීය ණය ගැනීම්	-	-
විදේශීය ණය ගැනීම්	-	-
ප්‍රදානයන් ලැබීම්	-	-
තැන්පතු ලැබීම්		175,000
මූල්‍ය ක්‍රියාකාරකම්වලින් ජනිත වූ මුළු මුදල් ප්‍රවාහය (ඌ)	**-**	**-**
අඩුකළා : මුදල් වැය කිරීම්		
දේශීය ණය ආපසු ගෙවීම්	-	-
විදේශීය ණය ආපසු ගෙවීම්	-	-
තැන්පතු ගෙවීම්		175,000
මූල්‍ය ක්‍රියාකාරකම් සඳහා වැය කරන ලද මුළු මුදල් ප්‍රවාහය (එ)	**-**	**-**
මූල්‍ය ක්‍රියාකාරකම්වලින් ජනිත වූ මුදල් ප්‍රවාහය (ඒ)=(ඌ)-(එ)	**-**	**-**
මුදල්වල ශුද්ධ වෙනස්වීම් (ඔ) = (උ)+(ඒ)	-	-
ජනවාරි 01 දිනට ආරම්භක මුදල් ශේෂය	-	-
දෙසැම්බර් 31 දිනට අවසාන මුදල් ශේෂය	-	-

3.4 මූල්‍ය ප්‍රකාශ සටහන්

වාර්තාකිරීමේ පදනම්

1) **වාර්තාකරණ කාලපරිච්ඡේදය**

2021 ජනවාරි 01 සිට දෙසැම්බර් 31 දක්වා වූ කාලපරිච්ඡේදය මෙම මූල්‍ය ප්‍රකාශයන්ට අදාළ වාර්තාකරණ කාලපරිච්ඡේදය වේ.

2) **මිනුම්කරණ පදනම**

මූල්‍ය ප්‍රකාශ ඓතිහාසික පිරිවැය මත පිළියෙල කර ඇති අතර සමහර වත්කම් නැවත තක්සේරු කරන ලද වටිනාකමට ඉදිරිපත් කර ඇත. අන්‍යාකාරයෙන් දක්වා නොමැති විට ගිණුම් පිළියෙල කිරීම වැඩිදියුණු කළ මුදල් පදනම මත සිදුකරයි.

මූල්‍ය ප්‍රකාශ ශ්‍රී ලංකා රුපියල්වලින් ආසන්නතම රුපියලට ඉදිරිපත් කර ඇත.

3) **ආදායම් හඳුනාගැනීම**

හුවමාරු හා හුවමාරු නොවන ආදායම් ඒවා ලැබිය යුතු කාලසීමාව නොසලකා, මුදල් ලැබෙන කාලපරිච්ඡේදයේදී ආදායම් ලෙස හඳුනාගනු ලැබේ.

4) **දේපළ, පිරියත හා උපකරණ හඳුනාගැනීම හා මැනීම**

වත්කමට අදාළ අනාගත ආර්ථික ප්‍රතිලාභ ආයතනයට ලැබෙන බවට තහවුරුවක් ඇති විට හා එම වත්කම් විශ්වාසනීයව මැනිය හැකි නම් එම වත්කම් දේපළ, පිරියත හා උපකරණ ලෙස හඳුනාගනු ලැබේ.

දේපළ, පිරියත හා උපකරණ පිරිවැයට හඳුනාගන්නා අතර පිරිවැය ආකෘතිය අදාළ නොවන අවස්ථාවලදී නැවත තක්සේරු කරන ලද අගය යොදාගනී.

5) **දේපළ, පිරියත හා උපකරණ සංචිතය**

මෙම සංචිත ගිණුම් දේපළ, පිරියත හා උපකරණවල අනුරූප ගිණුම් වේ.

6) **මුදල් හා මුදල් සමාන දෑ**

2021 දෙසැම්බර් 31 දිනට මුදල් හා මුදල් සමාන දෑ අතැති දේශීය ව්‍යවහාර මුදල් නෝට්ටු සහ කාසිවලින් සමන්විත වේ.

7) **මූල්‍ය ප්‍රකාශන ආකෘතියෙහි සිදුකරන ලද වෙනස්කම් හා පෙර වර්ෂයේ සංසන්දනාත්මක අගයන් නැවත ගැලපීම.**

2021 වසර සඳහා වන මූල්‍ය ප්‍රකාශන ආකෘතිවල සිදුකරන ලද වෙනස්කම් අනුව 2020 වසර සඳහා වන සංසන්දනාත්මක සංඛ්‍යාවල අදාළ ගැලපුම් සිදුකර ඇත.

3.5 ආදායම් එකතු කිරීමේ කාර්ය සාධනය

රු. ,000

ආදායම් ක්ෂේත්‍රය	ආදායම් ක්ෂේත්‍රයේ විස්තරය	ආදායම් ඇස්තමේන්තුව		එකතු කරන ලද ආදායම	
		මුල් ඇස්තමේන්තුව	අවසන් ඇස්තමේන්තුව	ප්‍රමාණය (රු)	අවසාන ආදායම් ඇස්තමේන්තුවේ % ලෙස
නැත.					

3.6 වෙන් කරන ලද ප්‍රතිපාදන උපයෝගී කර ගැනීමේ කාර්ය සාධනය

රු. ,000

ප්‍රතිපාදන වර්ගය	වෙන් කරන ලද ප්‍රතිපාදන		තත්‍ය වියදම	උපයෝගී කර ගනු ලැබූ ප්‍රතිපාදන, අවසන් කරන ලද අවසාන ප්‍රතිපාදනයේ % ලෙස
	මුල් ප්‍රතිපාදනය	අවසාන ප්‍රතිපාදන		
පුනරාවර්තන	1,081,500,000	1,081,500,000	1,046,000,000	97%
ප්‍රාග්ධන	1,080,350,000	1,080,350,000	1,010,013,233	93%
එකතුව	2,161,850,000	2,161,850,000	2,056,013,233	95%

3.7 මු.රෙ. 208 ප්‍රකාරව, වෙනත් අමාත්‍යාංශ / දෙපාර්තමේන්තුවල නියෝජිතයෙකු ලෙස මෙම දෙපාර්තමේන්තුවට / දිස්ත්‍රික් ලේකම් කාර්යාලයට/ පළාත් සභාවට ප්‍රදානය කරන ලද ප්‍රතිපාදන

රු. ,000

අනු අංකය	ප්‍රතිපාදන ලද අමාත්‍යාංශය / දෙපාර්තමේන්තුව	ප්‍රතිපාදනයේ අරමුණ	ප්‍රතිපාදන		තත්‍ය වියදම	උපයෝගී කරගන්නා ලද ප්‍රතිපාදන, ලබාදුන් අවසාන ප්‍රතිපාදනවල % ලෙස
			මුල් ප්‍රතිපාදන	අවසන් ප්‍රතිපාදන		

නැත.

3.8 මූල්‍ය නොවන වත්කම් වාර්තා කිරීමේ කාර්යසාධනය

වත්කම් කේතය	කේත විස්තරය	2020.12.31 දිනට භාණ්ඩ සමීක්ෂණ වාර්තා අනුව ශේෂය	2020.12.31 දිනට මූල්‍ය තත්ත්ව වාර්තාව අනුව ශේෂය	ඉදිරියේදී ගිණුම්කරණයට නියමිත	ප්‍රගතිය % ලෙස වාර්තා කිරීම
9151	ගොඩනැගිලි හා ව්‍යුහයන්	-	-	-	-
9152	යන්ත්‍රෝපකරණ	-	-	-	-
9153	ඉඩම්	-	-	-	-
9154	අස්පෘශ්‍ය වත්කම්	-	-	-	-
9155	ජීව විද්‍යාත්මක වත්කම්	-	-	-	-
9160	කෙරීගෙන යන වැඩ	-	-	-	-
9180	බදු දෙන ලද වත්කම්	-	-	-	-

3.9 Auditor General's Report

ජාතික විගණන කාර්යාලය
தேசிய கணக்காய்வு அலுவலகம்
NATIONAL AUDIT OFFICE

මගේ අංකය / எனது இல. / My No. PAL/E/SMCKP/02/21/03 ඔබේ අංකය / உமது இல. / Your No.

දිනය / திகதி / Date 2022 මැයි 31 දින

ලේඛනම්

පොල්, කිතුල් හා තල් වගා ප්‍රවර්ධනය හා ආශ්‍රිත කාර්මික භාණ්ඩ නිෂ්පාදන හා අපනයන විවිධාංගීකරණ රාජ්‍ය අමාත්‍යාංශය

පොල්, කිතුල් හා තල් වගා ප්‍රවර්ධනය හා ආශ්‍රිත කාර්මික භාණ්ඩ නිෂ්පාදන හා අපනයන විවිධාංගීකරණ රාජ්‍ය අමාත්‍යාංශයේ 2021 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන පිළිබඳව 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 11(1) වගන්තිය ප්‍රකාරව විගණකාධිපති සම්පිණ්ඩන වාර්තාව

1. මූල්‍ය ප්‍රකාශන

1.1 නත්ත්වාගණනය නොකළ මතය

පොල්, කිතුල් හා තල් වගා ප්‍රවර්ධනය හා ආශ්‍රිත කාර්මික භාණ්ඩ නිෂ්පාදන හා අපනයන විවිධාංගීකරණ රාජ්‍ය අමාත්‍යාංශයේ 2021 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්වය ප්‍රකාශය, එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය කාර්යසාධන ප්‍රකාශය හා මුදල් ප්‍රවාහ ප්‍රකාශවලින් සමන්විත 2021 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ විධිවිධාන සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවේ ඇතුලත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 11(1) වගන්තිය ප්‍රකාරව පොල්, කිතුල් හා තල් වගා ප්‍රවර්ධනය හා ආශ්‍රිත කාර්මික භාණ්ඩ නිෂ්පාදන හා අපනයන විවිධාංගීකරණ රාජ්‍ය අමාත්‍යාංශය වෙත ඉදිරිපත් කරනු ලබන මෙම මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ සඳහන් වේ. ශ්‍රී ලංකා ප්‍රජාතන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(6) ව්‍යවස්ථාව සමඟ සංයෝජිතව කියවිය යුතු 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 10 වගන්තිය ප්‍රකාරව ඉදිරිපත් කළ යුතු විගණකාධිපති වාර්තාව යථා කාලයේදී පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කරනු ලැබේ.

පොල්, කිතුල් හා තල් වගා ප්‍රවර්ධනය හා ආශ්‍රිත කාර්මික භාණ්ඩ නිෂ්පාදන හා අපනයන විවිධාංගීකරණ රාජ්‍ය අමාත්‍යාංශයේ මූල්‍ය ප්‍රකාශනවලින් 2021 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා මූල්‍ය කාර්යසාධනය හා මුදල් ප්‍රවාහ ප්‍රකාශනය පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

No. 306/72, Polduwa Road, Battaramulla, Sri Lanka.
+94 11 2 88 70 28 - 34 | +94 11 2 88 72 23 | ag@auditorgeneral.gov.lk | www.naosl.gov.lk

3.9 Auditor General's Report

1.2 මතය සඳහා පදනම

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර) අනුකූලව මා විගණනය සිදු කරන ලදී. මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් මාගේ වගකීම, විගණකගේ වගකීම යන වගන්තියේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබා ගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

1.3 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ හා ගණන්දීමේ නිලධාරීගේ වගකීම

පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව හා 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 38 වගන්තියේ සඳහන් විධිවිධානවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිඹිබු කෙරෙන පරිදි මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම හා වංචා සහ වැරදි හේතුවෙන් ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකි වනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ වගකීම වේ. 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) වගන්තිය ප්‍රකාරව අමාත්‍යාංශය විසින් වාර්ෂික හා කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වා ගෙන යා යුතුය.

ජාතික විගණන පනතේ 38(1)(ඇ) උප වගන්තිය ප්‍රකාරව අමාත්‍යාංශයේ මූල්‍ය පාලනය සඳහා සඵලදායි අභ්‍යන්තර පාලන පද්ධතියක් සකස් කර පවත්වා ගෙන යනු ලබන බවට ප්‍රධාන ගණන්දීමේ නිලධාරී සහතික විය යුතු අතර එම පද්ධතියේ සඵලදායිත්වය පිළිබඳව කලින් කල සමාලෝචනයක් සිදු කර ඒ අනුව පද්ධතිය ඵලදායි ලෙස කරගෙන යාමට අවශ්‍ය වෙනස්කම් සිදු කරනු ලැබිය යුතුය.

1.4 මූල්‍ය ප්‍රකාශන විගණනය පිළිබඳ විගණකගේ වගකීම

සමස්තයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා හා වැරදි හේතුවෙන් ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණන වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සෑම විටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් අනාවරණය කර ගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇති විය හැකි අතර, එහි ප්‍රමාණාත්මක භාවය මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කර ගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි වන බලපෑම මත රඳා පවතී.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනයේ කොටසක් ලෙස මා විසින් විගණනයේදී වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ක්‍රියා කරන ලදී. මා විසින් තවදුරටත්,

3.9 Auditor General's Report

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයා ගැනීමේදී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවීමේ අවදානම් හඳුනාගැනීම හා තක්සේරු කිරීම සඳහා අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලැසුම් කර ක්‍රියාත්මක කරන ලදී. වරදවා දැක්වීම් හේතුවෙන් සිදුවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම ප්‍රබල වන්නේ ඒවා දුස්සන්ධානයෙන්, ව්‍යාජ ලේඛන සැකසීමෙන්, චේතනාන්විත මහහැරීමෙන්, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මඟ හැරීමෙන් වැනි හේතු නිසා වන බැවිනි.
- අභ්‍යන්තර පාලනයේ සඵලදායීත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමේ අදහසින් නොවුවද, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස අභ්‍යන්තර පාලනය පිළිබඳව අවබෝධයක් ලබා ගන්නා ලදී.
- හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය සහ අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණ අයුරින් මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත් බව ඇගැයීම.
- මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව සහ හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ත ඉදිරිපත් කිරීම අගයන ලදී.

මාගේ විගණනය තුළදී හඳුනාගත් වැදගත් විගණන සොයාගැනීම්, ප්‍රධාන අභ්‍යන්තර පාලන දුර්වලතා හා අනෙකුත් කරුණු පිළිබඳව ප්‍රධාන ගණන්දීමේ නිලධාරී දැනුවත් කරමි.

1.5 වෙනත් නෛතික අවශ්‍යතා පිළිබඳ වාර්තාව

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 6(1)(ඇ) වගන්තිය ප්‍රකාරව පහත සඳහන් කරුණු මා ප්‍රකාශ කරමි.

(අ) මූල්‍ය ප්‍රකාශන ඉකුත් වර්ෂය සමඟ අනුරූප වන බවට,

1.6 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම

1.6.1 මූල්‍ය කාර්යසාධන ප්‍රකාශය

(අ) භාණ්ඩාගාර පරිගණක මුද්‍රිත සටහන (එස් ඒ 52) අනුව වර්ෂය තුළ රජයේ නිලධාරීන්ගේ අත්තිකාරම් මුදලින් ලැබීම් ශේෂය රු.4,074,536 ක් සහ මුදලින් ගෙවීම් ශේෂය රු.3,154,850 ක් වුවද, මූල්‍ය කාර්යසාධන ප්‍රකාශයේ එම ශේෂයන් පිළිවෙලින් රු.4,069,274 ක් සහ රු.3,149,588 ක් ලෙස රු.5,262 ක් අඩුවෙන් දක්වා තිබුණි.

(ආ) භාණ්ඩාගාර පරිගණක මුද්‍රිත සටහන (එස් ඒ 30) අනුව තැන්පතු ලැබීම් ශේෂය රු.28,787 ක් වූ අතර මූල්‍ය කාර්යසාධන ප්‍රකාශයේ තැන්පතු ලැබීම් ශේෂය රු.43,412 ක් ලෙස දැක්වීමෙන් රු.15,125 ක නොසැසඳූ වෙනසක් නිරීක්ෂණය විය.

3.9 Auditor General's Report

ජාතික විගණන කාර්යා
தேசிய கணக்காய்வு அலுவல
NATIONAL AUDIT OFF
NAOSL

1.6.2 මුදල් ප්‍රවාහ ප්‍රකාශය

1.6.2.1 මෙහෙයුම් ක්‍රියාකාරකම්වලින් ජනිත වූ මුදල් ප්‍රවාහය

2021 නොවැම්බර් 21 දිනැති අංක 2021 /03 දරන රාජ්‍ය ගිණුම් මාර්ගෝපදේශ චක්‍රලේඛයේ 7.6 ඡේදය පරිදි රජයේ නිලධාරීන්ගේ අත්තිකාරම් ගිණුමේ හරස් සටහන් මගින් ලැබීම් සහ ගෙවීම් මුදල් ප්‍රවාහ ප්‍රකාශයේ ඇතුළත් කළ යුතු වුවද හරස් සටහන් මගින් ලැබීම් රු.1,910,325 ක් ද, හරස් සටහන් මගින් ගෙවීම් රු. 1,910,325 ක් ද ඇතුළත් කර නොතිබුණි.

2. මූල්‍ය සමාලෝචනය

2.1 වියදම් කළමනාකරණය

මේ සම්බන්ධයෙන් පහත සඳහන් කරුණු නිරීක්ෂණය විය.

(අ) සමාලෝචිත වර්ෂයේ පුනරාවර්තන වැය විෂයයන් 10 ක් සඳහා සලසා තිබුණු එකතුව රු.128,653,500 ක ශුද්ධ ප්‍රතිපාදනවලින්, සමාලෝචිත වර්ෂය තුළදී රු. 48,651,121 ක මුදලක් එනම් ශුද්ධ ප්‍රතිපාදිත මුදලින් සියයට 20 ත් සියයට 85 ත් අතර ප්‍රතිශතයක් උපයෝජනය කර නොතිබුණි.

(ආ) සමාලෝචිත වර්ෂයේ ප්‍රාග්ධන වැය විෂයයන් 07 ක් සඳහා සලසා තිබුණු එකතුව රු.1,172,630,000 ක ශුද්ධ ප්‍රතිපාදනවලින් සමාලෝචිත වර්ෂය තුළදී රු.463,241,357 ක මුදලක් එනම් ශුද්ධ ප්‍රතිපාදිත මුදලින් සියයට 13 සිට සියයට 100 දක්වා ඉතිරිව පැවතිණි.

(ඇ) සමාලෝචිත වර්ෂයේ පුරන් කුඹුරුවල වාණිජමය පරමාර්ථයෙන් පොල් වගා කිරීම, කිතුල් නිෂ්පාදන දිරිගැන්වීම සහ දේශීය තල් කර්මාන්තය විවිධාංගිකරණය කිරීම යන සංවර්ධන ව්‍යාපෘති 03 ක් සඳහා සලසා තිබුණු එකතුව රු.400,000,000 ක පරිපූරක ප්‍රතිපාදනවලින් රු.244,024,218 ක් හෙවත් සියයට 82 ක ඉතිරියක් පැවතිණි. ඒ අනුව අදාළ කාර්යයන් සැලසුම් කළ පරිදි වර්ෂය තුළදී අවසන් කර ගැනීමට නොහැකිව තිබුණි.

3.9 Auditor General's Report

ජාතික විගණන කාර්ය
NATIONAL AUDIT OF
NAOSL

3. මානව සම්පත් කළමනාකරණය

3.1 අනුමත කාර්ය මණ්ඩලය හා තථ්‍ය කාර්ය මණ්ඩලය

සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට අනුමත සේවක සංඛ්‍යාව 66 ක් වූ අතර, එයින් 33 ක් පුරප්පාඩුව පැවතුණි.

ආර්.එම්.රත්නායක

නියෝජ්‍ය විගණකාධිපති

විගණකාධිපති වෙනුවට
ආර්.එම්. රත්නායක
නියෝජ්‍ය විගණකාධිපති
ජාතික විගණන කාර්යාලය

4 කාර්ය සාධන දර්ශක

4.1 ආයතනයේ කාර්ය සාධන දර්ශක (ක්‍රියාකාරී සැලැස්ම මත පදනම්ව)

විශේෂිත දර්ශක	අපේක්ෂිත නිමැවුමේ ප්‍රතිශතයක් (%) ලෙස තත්‍ය නිමැවුම		
	100% - 90%	75% - 89%	50% - 74%
පවත්වන ලද ප්‍රගති සමාලෝචන රැස්වීම් සංඛ්‍යාව	✓		
අනුමත කරන ලද ක්‍රියාත්මක සැලසුම් සංඛ්‍යාව	✓		
අවසන් කළ වාර්ෂික කාර්යසාධන ඇගයුම් සංඛ්‍යාව	✓		
යාවත්කාලීන කළ පෞද්ගලික ලිපිගොනු සංඛ්‍යාව	✓		
මහා භාණ්ඩාගාරයට ඉදිරිපත් කළ මූල්‍ය වාර්තා සංඛ්‍යාව	✓		
යොමු කළ අමාත්‍ය මණ්ඩල සංදේශ සංඛ්‍යාව	✓		
ප්‍රතිපත්ති හා වැඩසටහන් ක්‍රියාත්මක කිරීමට සමාලෝචනය කළ උපක්‍රම සංඛ්‍යාව		✓	

5 තිරසර සංවර්ධන අරමුණු සපුරා ගැනීමේ කාර්යසාධනය

5.1 හඳුනා ගන්නා ලද තිරසාර සංවර්ධන අරමුණු

ඉලක්කය /අරමුණු	ඉලක්ක	ජයග්‍රහණ දර්ශක	මේ දක්වා ජයග්‍රහණ ලබා ගැනීමේ ප්‍රගතිය		
			0%-49%	50%-74%	75%-100%
02	තිරසර පොල් කිතුල් තල් අංශයක් ප්‍රවර්ධනය කිරීම	හෙක්ටයාරයකට නව වගාව, නැවත පැල සිටුවීම, පාළු පැල සිටුවීම් උසස් මට්ටමක පවත්වා ගැනීම		56	
02	තිරසර පොල් කිතුල් තල් අංශයක් ප්‍රවර්ධනය කිරීම	සාපේක්ෂ ඵලදායිතාවය ඉහල නැංවීම (අස්වැන්න/ හෙක්ටයාරයකට)		65	
02	තිරසර පොල් කිතුල් තල් අංශයක් ප්‍රවර්ධනය කිරීම	උසස් තත්ත්වයේ පැල නිෂ්පාදනය සහ සහතික කිරීම (සහතික කරන ලද පැළ තවාන් සංඛ්‍යාව)		55	
09	පොල් තල් කිතුල් ක්ෂේත්‍රයේ තිරසර බෝග නිෂ්පාදනය සහ අපනයන රටාවන් සහතික කිරීම	අගය එකතු කළ නිෂ්පාදන ඒකක ප්‍රමාණය ඉහළ නංවමින් අපනයන ප්‍රවර්ධනය සිදු කිරීම (නිෂ්පාදන ඒකක ප්‍රමාණය)			79
09	පොල් තල් කිතුල් ක්ෂේත්‍රයේ තිරසර බෝග නිෂ්පාදනය සහ අපනයන රටාවන් සහතික කිරීම	බෝග පදනම් කර ගත් නිෂ්පාදන අපනයනය සිදු කරන නව ව්‍යවසායකයින් සංඛ්‍යාව		60	
17	සම්ප්‍රදායික නොවන අපනයන වෙළෙඳ පොළෙහි තිරසාර බව සහතික කිරීම	සම්ප්‍රදායික නොවන අපනයන වෙළඳපොළ සංඛ්‍යාව		55	

5.2 තිරසාර සංවර්ධන අරමුණු සපුරා ගැනීමේ ජයග්‍රහණ හා අභියෝග

5.2.1 තිරසාර සංවර්ධන අරමුණු සපුරා ගැනීමේ ජයග්‍රහණ

- ✓ තිරසාර සංවර්ධන අභිමතාර්ථ වලට අදාළ ව ක්‍රියාත්මක කළ හැකි තිරසර සංවර්ධන ඉලක්ක පිළිබඳව අමාත්‍යාංශයේ නිලධාරීන් දැනුවත් වීම
- ✓ තිරසර සංවර්ධන අභිමතාර්ථ සැලකිල්ලට ගනිමින් අමාත්‍යාංශයේ 2021-2025 පස් අවුරුදු උපාය මාර්ගික සැලැස්ම පිළියෙල කිරීම
- ✓ තිරසර සංවර්ධන අභිමතාර්ථ සැලකිල්ලට ගනිමින් සාම්ප්‍රදායික නොවන ප්‍රදේශ වෙත පොල්, කිතුල් හා තල් වගාව ව්‍යාප්ත කිරීම සඳහා විශේෂයෙන් ක්‍රියාත්මක කළ හැකි ව්‍යාපෘති හඳුනා ගැනීම
- ✓ සාම්ප්‍රදායික නොවන පොල්, කිතුල් හා තල් ආශ්‍රිත නිෂ්පාදන ප්‍රවර්ධනය සඳහා ඉදිරි වර්ෂවලදී වැඩසටහන් ක්‍රියාත්මක කිරීමට සැලසුම් කිරීම
- ✓ සාම්ප්‍රදායික වෙළඳපොලවල් වලින් ඔබ්බට ගොස් ජාත්‍යන්තර වෙළෙඳ ජාලය පුළුල් කිරීම කෙරෙහි අවධානය යොමු කිරීම
- ✓ 2021 වර්ෂයේ දී අධි ඵලදා බීජ නිෂ්පාදනය සඳහා පර්යේෂණ හා නිෂ්පාදන ඵලදායීතාව වැඩි කිරීමට හා ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීමට සැලසුම් කිරීම

5.2.2 තිරසාර සංවර්ධන අරමුණු සපුරා ගැනීමේ අභියෝග

- කොවිඩ් - 19 වසංගතය හමුවේ දේශීය වශයෙන් පොල්, තල් හා කිතුල් ආශ්‍රිත කර්මාන්ත ප්‍රවර්ධනය කිරීමට බාධක ඇති වී තිබීම
- ගෝලීය දේශගුණික විපර්යාස හා ස්වාභාවික උපක්‍රම විවිධ ලෙඩ රෝග හා සත්ව හානි මගින් වගාවන් විනාශ වීම හා ඵලදාව අඩු වීම
- කොවිඩ් - 19 වසංගතය හමුවේ ඇති වී තිබෙන ගෝලීය ආර්ථික අර්බුදය හේතුවෙන් අපනයන ප්‍රවර්ධනයට බාධාවන් ඇති වී තිබීම
- විධිමත් වගාවක් ලෙස ස්ථාපිත වී නොමැති සාම්ප්‍රදායික කර්මාන්තයක් වශයෙන් පවතින කිතුල් හා තල් වගාවන් පිළිබඳව, කර්මාන්තකරුවන් පිළිබඳව හා වගාව ආශ්‍රිතව දත්ත නොමැති වීම
- මෙම සාම්ප්‍රදායික ග්‍රාමීය වැවිලි ආර්ථිකයන් මගින් ජාතික ආර්ථිකයට ලබා දෙන දායකත්වය ගණනය කිරීමට ක්‍රමවේදයක් නොමැති වීම
- කෘෂිකාර්මික ශ්‍රම බලකාය සීඝ්‍රයෙන් අඩු වීම හා තරුණ ශ්‍රමිකයන් සීඝ්‍රයෙන් සේවා අංශ වෙත යොමු වීම හේතුවෙන් මෙම වැවිලි ක්ෂේත්‍රයන්ගේ තිරසර සංවර්ධනයක් පවත්වාගෙන යෑමට බාධා ඇති වීම
- කිතුල් හා තල් වගාවන් ආශ්‍රිතව විසිරුණු හෝ කුඩා පරිමාණයේ සාම්ප්‍රදායික ගෘහ කර්මාන්තයක් ලෙස ව්‍යාප්ත වී ඇති නිසා මධ්‍යම හෝ මහා පරිමාණයෙන් සංවර්ධනය කිරීමට යාන්ත්‍රීකරණය / තාක්ෂණය යොදා ගැනීමට අපහසු වීම

6 මානව සම්පත් පැනිකඩ

6.1 සේවක සංඛ්‍යා කළමනාකරණය

	අනුමත සේවක සංඛ්‍යාව	පවතින සේවක සංඛ්‍යාව	ඇබෑර්තු/ (අතිරික්ත)***
ජ්‍යෙෂ්ඨ	11	11	0
තෘතීයික	0	0	0
ද්විතීයික	38	38	0
ප්‍රාථමික	17	13	04
එකතුව	66	62	04

6.2 *** ආයතනයේ කාර්යසාධනය උදෙසා මානව සම්පත් හිඟය බලපානු ලැබ ඇති ආකාරය

- අනුමත කාර්ය මණ්ඩලයේ ජ්‍යෙෂ්ඨ මට්ටමේ නිලධාරීන්ගෙන් ප්‍රාථමික මට්ටමේ නිලධාරීන්ගෙන් 23%ක ද හිඟයක් පවතී. ඒ අනුව සමස්ථ කාර්ය මණ්ඩලයෙන් 6%ක ප්‍රමාණයක කාර්ය මණ්ඩල හිඟයක් පවතී.
- දැනට අමාත්‍යාංශයේ සේවය කරන නිලධාරීන් විසින් අනලස්ව දැඩි කැපවීමකින් යුතුව ආයතනයේ කාර්යසාධනය අත්පත් කර ගැනීම උදෙසා රාජකාරි ඉටු කරනු ලබන අතර ආයතනයේ කාර්යසාධනය නංවාලමින් තිරසරභාවය සහතික කිරීම උදෙසා පවතින පුරප්පාඩු කඩිනමින් සම්පූර්ණ කර ගැනීමට පියවර ගනිමින් පවතී.
- අප අමාත්‍යාංශයේ සේවය කරන බහුතරයක් නිලධාරීන් රාජ්‍ය සේවයට නවක නිලධාරීන් වන අතර පවතින තත්ත්වය යටතේ පුහුණු නිලධාරීන් ගේ සේවය ලබා ගැනීම දුෂ්කර වී ඇත. පුහුණු වැඩමුළු පවත්වමින් නවක නිලධාරීන් පුහුණු කිරීම සඳහා කටයුතු කරමින් පවතී.

6.3 මානව සම්පත් සංවර්ධනය

වැඩසටහනේ නම	පුහුණු කරන ලද සේවක සංඛ්‍යාව	වැඩසටහනේ කාල සීමාව	සමස්ත ආයෝජනය (රු.)		වැඩසටහනේ ස්වභාවය (දේශීය / විදේශීය)	නිමැවුම / ලබා ගත් දැනුම
			දේශීය	විදේශීය		
ආකල්ප සංවර්ධනය,	21	2021.10.12	-	-	දේශීය	
ලිපි ගොනුකරණය	16	2021.10.15				
හා ලිපි සැකසීම	20	2021.10.29				
ආයතන සංග්‍රහය,		2021.10.12			දේශීය	
තැපෑල හා විනය	01	2021.10.15				
	07	2021.10.26				
	09	2021.11.09				
	08					
සාමාන්‍ය	20	2021.10.22			දේශීය	
ගිණුම්කරණය සහ	11	2021.10.29				
වවුචර සැකසීම	05	2021.11.02				
	19	2021.11.05				
	12	2021.11.10				
	20	2021.11.16				
	11	2021.11.23				
ධනාත්මක ආකල්ප	60	2021.11.25	6520.00		දේශීය	
සංවර්ධනය සඳහා		2021.11.26				
වන උපදේශන						
වැඩසටහන						
පෞර්ෂ වර්ධන	70	2021.12.05	346,670.00		දේශීය	
පුහුණුව ඇතුළත්						
එක් දිනක වැඩමුළුව						
කාර්යාල හා	60	2021.12.22	54,000.00		දේශීය	
ආයතනික කටයුතු		2021.12.23				
සම්බන්ධ දේශනය -						
(ආරාධිත දේශක)						
ගිණුම්කරණය සහ						
ආශ්‍රිත වවුචර්						
සැකසීම සම්බන්ධ						
දේශනය - (ආරාධිත						
දේශක)						

6.3 මානව සම්පත් සංවර්ධනය

වැඩසටහනේ නම	පුහුණු කරන ලද සේවක සංඛ්‍යාව	වැඩසටහනේ කාල සීමාව	සමස්ත ආයෝජනය (රු.)		වැඩසටහනේ ස්වභාවය (දේශීය / විදේශීය)	නිමැවුම /ලබා ගත් දැනුම
			දේශීය	විදේශීය		
ජාතික ශ්‍රම අධ්‍යයන ආයතනය මඟින් පවත්වන ලද- කාර්යාල කළමණාකරණය හා මුදල් රෙගුලාසි	09	2021.11.11 2021.11.12	90,000.00	-	දේශීය	
ජාතික ශ්‍රම අධ්‍යයන ආයතනය මඟින් පවත්වන ලද - වාර්ෂික භාණ්ඩ සමීක්ෂණය	09	2021.11.19 2021.11.26 2021.12.03	135,000.00	-	දේශීය	
ජාතික ශ්‍රම අධ්‍යන ආයතනය මඟින් පවත්වන ලද - වැටුප් සකස් කිරීම	02	2021.11.29	10,000.00	-	දේශීය	
ජාතික ශ්‍රම අධ්‍යයන ආයතනය මඟින් පවත්වන ලද - පෞද්ගලික ලිපි ගොනු ඵලදායී ආකාරයට පවත්වාගෙන යාම	02	2021.11.23	10,000.00	-	දේශීය	

6.3 මානව සම්පත් සංවර්ධනය

වැඩසටහනේ නම	පුහුණු කරන ලද සේවක සංඛ්‍යාව	වැඩසටහනේ කාල සීමාව	සමස්ත ආයෝජනය සමස්ත ආයෝජනය (රු.)		වැඩසටහනේ ස්වභාවය (දේශීය / විදේශීය)	නිමැවුම / ලබා ගත් දැනුම
			දේශීය	විදේශීය		
ජාතික ශ්‍රම අධ්‍යයන ආයතනය මඟින් පවත්වන ලද - හානිපාඩු හා මු රෙ 104	02	2021.11.02	10,000.00	-	දේශීය	
Foreign Training Online Programme Seminars On Animal And Plant Quarantine for Developing Country (Participated Director Development	01	2021.08.25 2021.09.25	මුදල් අය කර නැත	-	විදේශීය	
Seminar on Economics Development and Planning for Sri Lanka (Participated Chief Accountant and Development Officers)	05	2021.12.08-19		-	විදේශීය	

7 අනුකූලතා වාර්තාව

අංකය	අදාළ කර ගත යුතු අවශ්‍යතාව	අනුකූලතා තත්ත්වය (අනුකූල වේ/ අනුකූල නොවේ)	අනුකූල නොවේ නම් ඒ සඳහා කෙටි පැහැදිලි කිරීම	අනුකූල නොවීම අනාගතයේදී වලක්වා ගැනීමට යෝජනා කරන නිරවද්‍ය තීරණ ක්‍රියාමාර්ග
1	**පහත සඳහන් මූල්‍ය ප්‍රකාශ/ ගිණුම් නියමිත දිනට ඉදිරිපත් කොට තිබේ**			
1.1	වාර්ෂික මූල්‍ය ප්‍රකාශ	අනුකූල වේ	-	-
1.2	රාජ්‍ය නිලධාරීන්ගේ අත්තිකාරම් ගිණුම	අනුකූල වේ	-	-
1.3	ව්‍යාපාර හා නිෂ්පාදන අත්තිකාරම් ගිණුම් (වාණිජ අත්තිකාරම් ගිණුම්)	අදාළ නැත	-	-
1.4	ගබඩා අත්තිකාරම් ගිණුම්	අදාළ නැත	-	-
1.5	විශේෂ අත්තිකාරම් ගිණුම්	අදාළ නැත	-	-
1.6	වෙනත්	-	-	-
2	**පොත්පත් හා ලේඛන නඩත්තු කිරීම (මු.රෙ.445)**			
2.1	රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ 267/2018 අනුව ස්ථාවර වත්කම් ලේඛනය යාවත්කාලීන කර පවත්වාගෙන යාම	අනුකූල නොවේ	-	-
2.2	පුද්ගල පඩිනඩි ලේඛන/ පුද්ගල පඩිනඩි කාඩ්පත් යාවත්කාලීන කර පවත්වාගෙන යාම	අනුකූල වේ	-	-
2.3	විගණන විමසුම් ලේඛනය යාවත්කාලීන කර පවත්වාගෙන යාම	අනුකූල වේ	-	-
2.4	අභ්‍යන්තර විගණන වාර්තා ලේඛනය යාවත්කාලීන කර පවත්වාගෙන යාම	අනුකූල වේ	-	-
2.5	සියලුම මාසික ගිණුම් සාරාංශ (CIGAS) පිළියෙල කර නියමිත දිනට මහා භාණ්ඩාගාරයට ඉදිරිපත් කිරීම	අනුකූල වේ	-	-
2.6	චෙක්පත් හා මුදල් ඇණවුම් ලේඛනය යාවත්කාලීන කර පවත්වාගෙන යාම	අනුකූල වේ	-	-

අංකය	අදාළ කර ගත යුතු අවශ්‍යතාව	අනුකූලතා තත්ත්වය (අනුකූල වේ/ අනුකූල නොවේ)	අනුකූල නොවේ නම් ඒ සඳහා කෙටි පැහැදිලි කිරීම	අනුකූල නොවීම අනාගතයේදී වලක්වා ගැනීමට යෝජනා කරන නිරවද්‍ය තීරණ ක්‍රියාමාර්ග
2.7	ඉන්වෙන්ට්‍රි ලේඛනය යාවත්කාලීන කර පවත්වාගෙන යාම	අනුකූල වේ	-	-
2.8	තොග ලේඛනය යාවත්කාලීන කර පවත්වාගෙන යාම	අනුකූල වේ	-	-
2.9	හානි පාඩු ලේඛනය යාවත්කාලීන කර පවත්වාගෙන යාම	අනුකූල වේ	-	-
2.10	බැරකම් ලේඛනය යාවත්කාලීන කර පවත්වාගෙන යාම	අනුකූල වේ	-	-
2.11	උප පත්‍රිකා පොත් ලේඛනය (GA-N20) යාවත්කාලීන කර පවත්වාගෙන යාම	අදාල නොවේ	-	-
03	**මූල්‍ය පාලනය සඳහා කාර්යයන් අභිනියෝජනය කිරීම (මු.රෙ. 135)**		**-**	**-**
3.1	මූල්‍ය බලතල ආයතනය තුළ බලතල පවරා දී තිබීම	අනුකූල වේ	-	-
3.2	මූල්‍ය බලතල පවරාදීම පිළිබඳ ආයතනය තුළ දැනුවත් කර තිබීම	අනුකූල වේ	-	-
3.3	සෑම ගනුදෙනුවක්ම නිලධාරීන් දෙදෙනෙකු හෝ ඊට වැඩි සංඛ්‍යාවක් හරහා අනුමත වන පරිදි බලතල පවරා දී තිබීම	අනුකූල වේ	-	-
3.4	2014.05.11 දිනැති අංක 171/2004 දරන රාජ්‍ය ගිණුම් චක්‍රලේඛය අනුව, රජයේ පඩිපත් මෘදුකාංග පැකේජය භාවිතා කිරීමේදී ගණකාධිකාරීවරයන්ගේ පාලනයට යටත්ව කටයුතු කිරීම	අනුකූල වේ	-	-

අංකය	අදාළ කර ගත යුතු අවශ්‍යතාව	අනුකූලතා තත්ත්වය (අනුකූල වේ/ අනුකූල නොවේ)	අනුකූල නොවේ නම් ඒ සඳහා කෙටි පැහැදිලි කිරීම	අනුකූල නොවීම අනාගතයේදී වලක්වා ගැනීමට යෝජනා කරන නිරවද්‍ය තීරණ ක්‍රියාමාර්ග
4	**වාර්ෂික සැලසුම් සකස් කිරීම**			
4.1	වාර්ෂික ක්‍රියාකාරී සැලැස්ම සකස් කිරීම	අනුකූල වේ	-	-
4.2	වාර්ෂික ප්‍රසම්පාදන සැලැස්ම සකස් කිරීම	අනුකූල වේ	-	-
4.3	වාර්ෂික අභ්‍යන්තර විගණන සැලැස්ම සකස් කිරීම	අනුකූල වේ	-	-
4.4	වාර්ෂික ඇස්තමේන්තුව සකස් කොට ජාතික අයවැය දෙපාර්තමේන්තුවට (NBD) නියමිත දිනට ඉදිරිපත් කිරීම	අනුකූල වේ	-	-
4.4	වාර්ෂික මුදල් ප්‍රවාහ ප්‍රකාශය නියමිත දිනට භාණ්ඩාගාර මෙහෙයුම් දෙපාර්තමේන්තුවට ඉදිරිපත් කිරීම	අනුකූල වේ අනුකූල වේ	-	-
5	**විගණන විමසුම්**		-	-
5.1	විගණකාධිපතිවරයා විසින් නියම කොට ඇති දිනට, සියළුම විගණන විමසුම්වලට පිළිතුරු ලබා දී තිබීම	අනුකූල වේ	-	-
6	**අභ්‍යන්තර විගණනය**		-	-
6.1	මු.රෙ 134(2) DMA/1-2019 අනුව වසර ආරම්භයේදී විගණකාධිපතිවරයා සමඟ සාකච්ඡා කිරීමෙන් අනතුරුව, අභ්‍යන්තර විගණන සැලැස්ම සකස් කිරීම	අනුකූල වේ	-	-
6.2	සෑම අභ්‍යන්තර විගණන වාර්තාවකටම මාසයක කාලයක් තුළ දී පිළිතුරු සපයා තිබීම	අනුකූල වේ	-	-
6.3	2018 අංක 19 දරණ ජාතික විගණන පනතේ 40(4) උප වගන්තිය ප්‍රකාරව, සියලුම අභ්‍යන්තර විගණන වාර්තාවල පිටපත් කළමනාකරණ විගණන දෙපාර්තමේන්තුවට ඉදිරිපත් කර තිබීම	අනුකූල වේ	-	--

අංකය	අදාළ කර ගත යුතු අවශ්‍යතාව	අනුකූලතා තත්ත්වය (අනුකූල වේ/ අනුකූල නොවේ)	අනුකූල නොවේ නම් ඒ සඳහා කෙටි පැහැදිලි කිරීම	අනුකූල නොවීම අනාගතයේදී වලක්වා ගැනීමට යෝජනා කරන නිරවද්‍ය තීරණ ක්‍රියාමාර්ග
6.4	මුදල් රෙගුලාසි 134 (3) ප්‍රකාරව, සියළුම අභ්‍යන්තර විගණන වාර්තාවල පිටපත් විගණකාධිපතිවරයාට ඉදිරිපත් කර තිබීම	අනුකූල වේ	-	-
7	**විගණන හා කළමනාකරණ කමිටු**		-	-
7.1	DMA චක්‍රලේඛ 1-2019 අනුව, අවම වශයෙන් විගණන හා කළමනාකරණ කමිටු 04ක්වත් අදාළ වර්ෂය තුළ පවත්වා ගෙන තිබීම	අනුකූල වේ	-	-
8	**වත්කම් කළමනාකරණය**			
8.1	අංක 01/2017 දරන වත්කම් කළමනාකරණ චක්‍රලේඛයේ 07 වන පරිච්ඡේදය අනුව, වත්කම් මිලදී ගැනීම් හා අපහරණය කිරීම් පිළිබඳ තොරතුරු කොම්ප්ට්‍රෝලර් ජනරාල් කාර්යාලය වෙත ඉදිරිපත් කර තිබීම	අනුකූල වේ	-	-
8.2	ඉහත සඳහන් චක්‍රලේඛයේ 13 වන පරිච්ඡේදය ප්‍රකාරව, එම චක්‍රලේඛයේ විධිවිධාන ක්‍රියාත්මක කිරීම සම්බන්ධීකරණය සඳහා සුදුසු සම්බන්ධතා නිලධාරියෙකු පත් කර එම නිලධාරියා පිළිබඳ තොරතුරු කොම්ප්ට්‍රෝලර් ජනරාල් කාර්යාලයට වාර්තා කර තිබීම	අනුකූල වේ	-	-
8.3	රාජ්‍ය මුදල් චක්‍රලේඛ අංක 05/2016 අනුව, භාණ්ඩ සමීක්ෂණ පවත්වා අදාළ වාර්තා නියමිත දිනට විගණකාධිපතිවරයා වෙත ඉදිරිපත් කර තිබීම	අනුකූල වේ	-	-
8.4	වාර්ෂික භාණ්ඩ සමීක්ෂණයෙන් අනාවරණය වූ අතිරික්ත, ඌණතා හා වෙනත් නිර්දේශ චක්‍රලේඛයේ සඳහන් කාලය තුළ සිදු කොට තිබීම	අනුකූල වේ	-	-
8.5	ගර්හිත භාණ්ඩ අපහරණය කිරීම මු.රෙ 772 අනුව සිදු කිරීම	අනුකූල වේ	-	-

අංකය	අදාළ කර ගත යුතු අවශ්‍යතාව	අනුකූලතා තත්ත්වය (අනුකූල වේ/ අනුකූල නොවේ)	අනුකූල නොවේ නම් ඒ සඳහා කෙටි පැහැදිලි කිරීම	අනුකූල නොවීම අනාගතයේදී වලක්වා ගැනීමට යෝජනා කරන නිරවද්‍ය තීරණ ක්‍රියාමාර්ග
9	**වාහන කළමනාකරණය**			
9.1	සංචිත වාහන සඳහා දෛනික ධාවන සටහන් හා මාසික සාරාංශ වාර්තා සකස් කර නියමිත දිනට විගණකාධිපති වෙත ඉදිරිපත් කිරීම	අනුකූල වේ	-	-
9.2	වාහන ගර්හිත වී මාස 06කට වඩා අඩු කාලයකදී අපහරණය කර තිබීම	අදාළ නොවේ	-වැවිලි අමාත්‍යාංශය යටතේ ලබා දී ඇති වාහන අප සතුව ඇත. අදාල කටයුතු සිදු කරන්නේ වැවිලි අමාත්‍යාංශයයි	-
9.3	වාහන ලොග් පොත් පවත්වා ගනිමින් ඒවා යාවත්කාලීන කර පවත්වාගෙන යාම	අනුකූල වේ	-	-
9.4	සෑම වාහන අනතුරක් සම්බන්ධයෙන්ම මු.රෙ. 103, 104, 109 හා 110 ප්‍රකාරව කටයුතු කිරීම	අනුකූල වේ	-	-
9.5	2016.12.29 දිනැති අංක 2016/30 දරන රාජ්‍ය පරිපාලන චක්‍රලේඛයේ 3.1 ඡේදයේ සඳහන් විධිවිධාන ප්‍රකාරව, වාහනවල ඉන්ධන දහනය වීම නැවත පරීක්ෂා කිරීම	අනුකූල නොවේ	-ඒ සඳහා කටයුතු ඉදිරියේදී කිරීමට යෝජිතය	-
9.6	කල්බදු කාල සීමාවෙන් අනතුරුව, බදු වාහන ලොග් පොත්වල සම්පූර්ණ අයිතිය පවරාගෙන තිබීම	අදාළ නොවේ	-	-
10	**බැංකු ගිණුම් කළමනාකරණය**			
10.1	නියමිත දිනට බැංකු සැසඳුම් ප්‍රකාශ පිළියෙල කර සහතික කර ඒවා විගණනය සඳහා ඉදිරිපත් කර තිබීම	අනුකූල වේ	-	-
10.2	සමාලෝචිත වර්ෂයේ දී හෝ ඊට පෙර වර්ෂවල සිට ඉදිරියට රැගෙන ආ අක්‍රීය බැංකු ගිණුම් නිරවුල් කර තිබීම	අනුකූල වේ	-	-
10.3	බැංකු සැසඳුම් ප්‍රකාශවලින් අනාවරණය වූ හා ගැලපුම් කළ යුතුව තිබූ ශේෂ සම්බන්ධයෙන් මුදල් රෙගුලාසි ප්‍රකාරව කටයුතු කොට එම ශේෂ මාසයක කාලයක් ඇතුළත නිරවුල් කර තිබීම	අනුකූල වේ	-	-

අංකය	අදාළ කර ගත යුතු අවශ්‍යතාව	අනුකූලතා තත්ත්වය (අනුකූල වේ/ අනුකූල නොවේ)	අනුකූල නොවේ නම් ඒ සඳහා කෙටි පැහැදිලි කිරීම	අනුකූල නොවීම අනාගතයේදී වලක්වා ගැනීමට යෝජනා කරන නිරවද්‍ය තීරණ ක්‍රියාමාර්ග
11	**ප්‍රතිපාදන උපයෝජනය**			
11.1	සලසා තිබූ ප්‍රතිපාදන ඒවායේ සීමාව ඉක්මවා නොයන පරිදි වියදම් දැරීම	අනුකූල වේ	-	-
11.2	මු.රෙ. 94 (I) ප්‍රකාරව, සලසන ලද ප්‍රතිපාදනයෙන් උපයෝජනය කළ පසු වර්ෂ අවසානයේ දී ඉතිරි ප්‍රතිපාදන සීමාව නොඉක්මවන පරිදි බැරකම්වලට එළඹීම	අනුකූල වේ	-	-
12	**රජයේ නිළධාරීන්ගේ අත්තිකාරම් ගිණුම්**			
12.1	සීමාවන්වලට අනුකූලවීම	අනුකූල වේ	-	-
12.2	හිඟහිටි ණය ශේෂ පිළිබඳ කාල විශ්ලේෂණයක් සිදු කර තිබීම	අනුකූල වේ	-	-
12.3	වර්ෂයකට වැඩි කාලයක සිට පැවත එන හිඟහිටි ණය ශේෂ නිරවුල් කර තිබීම	අනුකූල වේ	-	-
13	**පොදු තැන්පතු ගිණුම**			
13.1	කල් ඉකුත් වූ තැන්පතු සම්බන්ධයෙන් මු.රෙ.571 ප්‍රකාරව කටයුතු කර තිබීම	අනුකූල වේ	-	-
13.2	පොදු තැන්පතු සඳහා වන පාලන ගිණුම යාවත්කාලීන කර පවත්වාගෙන යාම	අනුකූල වේ	-	-
14	**අග්‍රිම ගිණුම**			
14.1	සමාලෝචිත වර්ෂය අවසානයේ දී මුදල් පොතේ ශේෂය භාණ්ඩාගාර මෙහෙයුම් දෙපාර්තමේන්තුවට ප්‍රේෂණය කර තිබීම	අනුකූල වේ	-	-
14.2	මු.රෙ. 371 ප්‍රකාරව නිකුත් කළ තත්කාර්ය අතුරු අග්‍රිම, එම කාර්යය අවසන් වී මාසයන් ඇතුළත නිරවුල් කර තිබීම	අනුකූල වේ	-	-
14.3	මු.රෙ. 371 ප්‍රකාරව අනුමත සීමාව ඉක්මවා නොයන පරිදි තත්කාර්ය අතුරු අග්‍රිම නිකුත් කර තිබීම	අනුකූල වේ	-	-
14.4	අග්‍රිම ගිණුමේ ශේෂය, භාණ්ඩාගාරයේ පොත් සමඟ මාසිකව සැසඳුම් කිරීම	අනුකූල වේ	-	-

අංකය	අදාළ කර ගත යුතු අවශ්‍යතාව	අනුකූලතා තත්ත්වය (අනුකූල වේ/ අනුකූල නොවේ)	අනුකූල නොවේ නම් ඒ සඳහා කෙටි පැහැදිලි කිරීම	අනුකූල නොවීම අනාගතයේදී වලක්වා ගැනීමට යෝජනා කරන නිරවද්‍ය තීරණ ක්‍රියාමාර්ග
15	**ආදායම් ගිණුම**			
15.1	අදාළ රෙගුලාසිවලට අනුකූලව, රැස් කළ ආදායමෙන් ආපසු ගෙවීම් සිදු කොට තිබීම	අදාළ නැත	-	-
15.2	රැස්කර තිබූ ආදායම්, තැන්පතු ගිණුමට බැර නොකොට සෘජුවම ආදායමට බැර කර තිබීම	අදාළ නැත	-	-
15.3	මු.රෙ.176 අනුව හිඟ ආදායම් වාර්තා විගණකාධිපතිවරයා වෙත ඉදිරිපත් කර තිබීම	අදාළ නැත	-	-
16	**මානව සම්පත් කළමනාකරණය**			
16.1	අනුමත කාර්ය මණ්ඩල සීමාව තුළ කාර්ය මණ්ඩලය පවත්වාගෙන යාම	අනුකූල වේ	-	-
16.2	කාර්ය මණ්ඩලයේ සියලු ම සාමාජිකයින් වෙත රාජකාරී ලැයිස්තු ලිඛිතව ලබා දී තිබීම	අනුකූල වේ	-	-
16.3	2017.09.20 දිනැති MSD චක්‍රලේඛ අංක 04/2017 ප්‍රකාරව සියලුම වාර්තා කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුව වෙත ඉදිරිපත් කර තිබීම	අනුකූල වේ	-	-
17	**මහජනයා වෙත තොරතුරු ඉදිරිපත් කිරීම**		-	-
17.1	තොරතුරු දැනගැනීමේ පනත හා රෙගුලාසි ප්‍රකාරව තොරතුරු නිලධාරියෙකු පත් කොට තොරතුරු ලබා දීමේ ලේඛනයක් යාවත්කාලීන කර පවත්වාගෙන යාම	අනුකූල වේ	-	-
17.2	ආයතනය පිළිබඳ තොරතුරු එහි වෙබ් අඩවිය හරහා ලබා දී තිබෙන අතර, වෙබ් අඩවිය හරහා හෝ විකල්ප මාර්ග හරහා ආයතනය පිළිබඳ මහජනයාගේ ප්‍රශංසා/ චෝදනා පළ කිරීමට පහසුකම් සලසා තිබීම	මේ සඳහා ක්‍රියාත්මක වෙමින් පවතී	-	-

අංකය	අදාළ කර ගත යුතු අවශ්‍යතාව	අනුකූලතා තත්ත්වය (අනුකූල වේ/ අනුකූල නොවේ)	අනුකූල නොවේ නම් ඒ සඳහා කෙටි පැහැදිලි කිරීම	අනුකූලතා නොවීම අනාගතයේදී වලක්වා ගැනීමට යෝජනා කරන නිරවද්‍ය තීරණ ක්‍රියාමාර්ග
18	**පුරවැසි ප්‍රඥාප්තිය ක්‍රියාත්මක කිරීම**			
18.1	අංක 05/2008 හා 05/2018(1) දරණ රාජ්‍ය පරිපාලන හා කළමනාකරණ අමාත්‍යාංශ චක්‍රලේඛ අනුව පුරවැසි /සේවාලාභී ප්‍රඥාප්තියක් සම්පාදනය කොට ක්‍රියාත්මක කර තිබීම	නව අමාත්‍යාංශයක් බැවින් කටයුතු කිරීමට සැලසුම් යොදා ඇත	-	-
18.2	එම චක්‍රලේඛයේ 2.3 ඡේදය පරිදි, පුරවැසි/සේවාලාභී ප්‍රඥප්තිය සම්පාදනය කිරීම හා ක්‍රියාත්මක කිරීමේ කටයුතු අධීක්ෂණය කිරීම හා ඇගයීම් සඳහා ආයතන විසින් ක්‍රමවේදයක් සකස් කොට තිබීම	නව අමාත්‍යාංශයක් බැවින් කටයුතු කිරීමට සැලසුම් යොදා ඇත	-	-
19	**මානව සම්පත් සැලැස්ම සම්පාදනය කිරීම**		-	-
19.1	2018.01.24 දිනැති රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ අංක 02/2018 ඇමුණුම් 02 ආකෘතිය පදනම් කරගෙන මානව සම්පත් සැලැස්මක් සකස් කොට තිබීම.	අනුකූල වේ	-	-
19.2	කාර්ය මණ්ඩලයේ සෑම සාමාජිකයෙකු සඳහාම වර්ෂයකට අවම වශයෙන් පැය 12 කට නොඅඩු පුහුණු අවස්ථාවක් ඉහත සඳහන් මානව සම්පත් සැලැස්ම තුළ තහවුරු කොට තිබීම	අනුකූල වේ	-	-
19.3	ඉහත සඳහන් චක්‍රලේඛයේ ඇමුණුම් 01 හි දැක්වෙන ආකෘතිය පදනම් කරගෙන සමස්ත කාර්ය මණ්ඩලය සඳහාම වාර්ෂික කාර්යසාධන ගිවිසුම් අත්සන් කර තිබීම	නව අමාත්‍යාංශයක් බැවින් කටයුතු කිරීමට සැලසුම් යොදා ඇත		-
19.4	ඉහත චක්‍ර ලේඛයේ 6.5 ඡේදය ප්‍රකාරව මානව සම්පත් සංවර්ධන සැලැස්ම පිළියෙළ කිරීම, ධාරිතා සංවර්ධන වැඩසටහන් සංවිධානය කිරීමට නිපුණතා සංවර්ධන වැඩසටහන් ක්‍රියාත්මක කිරීම පිළිබඳ වගකීම් පවරා ජ්‍යෙෂ්ඨ නිලධාරියෙකු පත්කොට තිබීම	අනුකූල වේ	2022 වර්ෂයේ සිට ක්‍රියාත්මක කිරීමට යෝජනා කොට ඇත	-
20	**විගණන ඡේදවලට ප්‍රතිචාර දැක්වීම**		-	-
20.1	ඉකුත් වර්ෂ සඳහා විගණකාධිපති විසින් නිකුත් කළ විගණන ඡේද මඟින් පෙන්වා දී ඇති අඩුපාඩු නිවැරදි කොට තිබීම	මෙම කාල සීමාව තුළ විගණන විමසුම් ඉදිරිපත් වී නැත	-	-